අ.පො.ස. (සා.පෙළ) විභාගය

# ඇගයීම් වාර්තාව

# 2022

## 21

## සිංහල භාෂාව

පර්යේෂණ හා සංවර්ධන අංශය

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022

# ඇගයීම් වාර්තාව

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි**

**අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2022**

**ඇගයීම් වාර්තාව - සිංහල භාෂාව හා සාහිත්‍යය**

| | |
|---|---|
| **උපදේශකත්වය** | : ඒ.කේ.එස් .ඉන්දිකා කුමාරි ලියනගේ<br>විභාග කොමසාරිස් ජනරාල් |
| සංකල්පය හා සැලසුම | : ඩබ්.එස්. ඩී. වීරසිංහ<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| විෂය සම්බන්ධීකරණය | : එච්. කේ. සී. කේ. කුමාරි<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| ශාස්ත්‍රීය මඟ පෙන්වීම | : ඩබ්.එස්. ඩී. වීරසිංහ<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| අන්තර්ගත සංවර්ධනය සඳහා<br>විෂයපාදක මඟ පෙන්වීම | : සුසිල් සිරිසේන<br>උප පීඨාධිපති<br>හාපිටිගම අධ්‍යාපන විද්‍යාපීඨය |
| අන්තර්ගත සංවර්ධන කමිටුව | : එච්. කේ. සී. කේ. කුමාරි<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| | : එම්. කේ. ඉඳුනිල් පියරත්න<br>නියෝජ්‍ය ප්‍රකාශන කොමසාරිස්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| | : එම්. ඩී. කේ. ධම්මික<br>කථිකාචාර්ය<br>ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය, මතුගම |

: එම්. ඩී. ආර්. මුණසිංහ
ගුරු උපදේශක
කලාප අධ්‍යාපන කාර්යාලය
බලංගොඩ

: එම්. ඒ. අමාලි යසින්තා
ශ්‍රී. ලං. ගු. සේ. I
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, උතුරු කොළඹ

: ඩී. ඩබ්. විජයන්ති පෙරේරා
ශ්‍රී. ලං. ගු. සේ. I
උඩුපිල වීර විජයබා මහාවිද්‍යාලය
උඩුපිල

ලේඛන සහය : ඒ. එල්. කේ. චතුරාණි
කළමනාකරන සේවා නිලධාරි

පරිගණක පිටු සැකසුම : ආර්. ඒ. එන්. එම්. පෙරේරා
දත්ත සටහන් ක්‍රියාකරු

පිටකවර සැකසුම : ඒ. එල්. කේ. චතුරාණි
කළමනාකරන සේවා නිලධාරි

## විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ 2022 වර්ෂයේ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයට අදාළව මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කර ඇත්තේ අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ දත්තමය හා විශ්ලේෂණාත්මක අවබෝධයක් ලබා දීම, ඔවුන්ගේ ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනීම සහ එම අනාවරණයන් පදනම් කරගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මෙන්ම පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ අරමුණ පෙරදැරිව ය.

මෙම වාර්තාවේ, විෂය නිර්දේශයේ අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා හා ඉගෙනුම් ඵල අනුව අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇත. ඒ අනුව එක් එක් පරීක්ෂණ අයිතමය සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර, ශක්තීන් හා දුර්වලතා මෙන් ම වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඒ සඳහා සුදුසු අධ්‍යාපන යෝජනා ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව ගුරුවරුන්, පාසල් පරිපාලකයන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයන්, සිසුන් සහ දෙමාපියන් ඇතුළු අධ්‍යාපන පද්ධතියේ සියලු ම පාර්ශ්වකරුවන් සඳහා වැදගත් ලේඛනයකි. වාර්තාවේ අන්තර්ගත, විශ්ලේෂණ මඟින් ගුරුවරුන්ට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දුර්වලතා නිවැරදිව හඳුනාගෙන ඉලක්කගත ඉගැන්වීම් ක්‍රමෝපායන් සැලසුම් කිරීමට හැකි වන අතර, සිසුන්ට තම ඉගෙනුම් අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව සූදානම් වීමට මඟ පෙන්වයි. එමෙන් ම විෂයමාලා සංශෝධනය, ගුරු වෘත්තීය සංවර්ධනය, සම්පත් වෙන් කිරීම සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ද මෙම වාර්තාව ඉවහල් වනු ඇත.

මෙම වාර්තාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා, අපේක්ෂකයන්ගේ සාධන දත්ත සමඟ එක් එක් පරීක්ෂණ අයිතමයට අදාළ විශ්ලේෂණ, නිරීක්ෂණ සහ නිර්දේශ ඒකාබද්ධව අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. එමඟින් සිසුන් මුහුණ දෙන සංකල්පමය දුර්වලතා සහ ඉගෙනුම් අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන ඒ සඳහා සුදුසු මැදිහත්වීම් සැලසුම් කළ හැකි වනු ඇත. තවද, මෙම වාර්තාව ඉදිරි වසරවල අපේක්ෂකයන්ගේ සාධනය සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීම සඳහා දත්ත පදනමක් ලෙස ද භාවිත කළ හැකිය.

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා දත්ත මත පදනම් වූ තීරණ ගැනීම අත්‍යවශ්‍ය වන බැවින්, මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති අනාවරණයන් සහ නිර්දේශ ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ගුරුවරුන් සහ සිසුන් විසින් ප්‍රායෝගිකව භාවිතයට ගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට දායක කර ගනු ඇතැයි මම විශ්වාස කරමි.

අවසාන වශයෙන්, මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කිරීම සඳහා කැපවීමෙන් දායක වූ සියලු ම සම්පත්දායකයන්ට සහ විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ නිලධාරීන්ට මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි. විශේෂයෙන් ම විද්‍යාත්මක ප්‍රවේශයකින් මෙම වාර්තාව සම්පාදනය කිරීම සඳහා ඔවුන් දැක්වූ වෘත්තීමය දායකත්වය ඉතා අගය කොට සලකමි.

ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

## සංක්ෂිප්තය

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ 2022 වර්ෂයේ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයට අදාළව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද මෙම ඇගයීම් වාර්තාව, අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ප්‍රකාශනයකි. මෙම වාර්තාව ගුරුවරුන්, විෂයභාර නිලධාරීන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පර්යේෂකයන්, සිසුන් සහ දෙමාපියන් සඳහා ප්‍රයෝජනවත් ලේඛනයක් ලෙස භාවිත කළ හැකි ය.

මෙම වාර්තාව ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.

**පළමු කොටසෙහි**, සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය අරමුණු සහ විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන්ගේ විෂය සාධනය පිළිබඳ තොරතුරු, මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව අපේක්ෂක සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප අනුව සාධනය සහ අනෙකුත් සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත.

**දෙවන කොටසෙහි**, I පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි I පත්‍රයේ ව්‍යුහය, I පත්‍රය, ලකුණු ලබාදීමේ පටිපාටිය සහ අයිතමවල පහසුතා දර්ශක, තෝරාගත් ප්‍රශ්න සඳහා විශ්ලේෂණය සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ද ඉදිරිපත් කර ඇත.

**තෙවන කොටසෙහි**, II පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි එක් එක් ප්‍රශ්නය, අපේක්ෂිත පිළිතුර, අයිතමවල පහසුතා දර්ශක, එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇති අතර, එම අනාවරණයන් මත පදනම්ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී ලෙස සංවිධානය කිරීම සඳහා සංවර්ධනාත්මක යෝජනා ද ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව සකස් කිරීම සඳහා සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory - CTT) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory - IRT) යන විද්‍යාත්මක ප්‍රවේශයන් යොදාගෙන අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය කර ලබාගත් දත්ත භාවිත කර ඇත. මීට අමතරව පිළිතුරු පත්‍ර ඇගයීමේ කටයුතුවල නිරත වූ ප්‍රධාන පරීක්ෂකවරුන්, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන් සහ සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ, අදහස් සහ යෝජනා ද මෙම වාර්තාව සකස් කිරීම සඳහා පාදක කරගෙන ඇත.

මෙම වාර්තාවේ ඇතුළත් විශ්ලේෂණයන් සහ නිර්දේශ, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, විෂය සාධනය ඉහළ නැංවීම, විෂයමාලා සංවර්ධනය සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

## පටුන

1. විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු 01
1.1. විෂය අරමුණු 01
1.2. අපේක්ෂකයන්ගේ විෂය සාධනය පිළිබඳ තොරතුරු 02
1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 02
1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය 02
1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 04
1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 06
1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබා ගෙන ඇති ආකාරය 10
2. ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - I පත්‍රය 11
2.1 සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයේ ව්‍යූහය 11
2.2 සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රය 12
2.3 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය 17
2.4 I පත්‍රයේ වරණ තෝරා ගෙන ඇති ආකාරය 18
2.5 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක 19
2.6 I පත්‍රයේ තේමා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශක 20
2.7 I පත්‍රයේ විශ්ලේෂණය 21
2.8 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ නිගමන හා යෝජනා 22
3. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - II පත්‍රය 26
3.1 සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයේ ව්‍යූහය 26
3.2 II පත්‍රයේ විශ්ලේෂණය 27
3.3 II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය 29
3.4 II පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂී නිරීක්ෂණ සහ නිර්දේශ 30
3.4.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර 30
3.4.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය 32

3.4.3 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර 35

3.4.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය 38

3.4.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර 40

3.4.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය 42

3.4.7 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර 45

3.4.8 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය 47

3.4.9 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර 49

3.4.10 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය 51

4. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - III පත්‍රය 54

4.1 සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයේ ව්‍යුහය 54

4.2 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය 55

4.3 III පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය 57

4.4 III පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂී නිරීක්ෂණ සහ නිර්දේශ 58

4.4.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර 58

4.4.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය 60

4.4.3 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර 62

4.4.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය 64

4.4.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර 66

4.4.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය 68

4.4.7 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර 71

4.4.8 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය 74

4.4.9 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර 77

4.4.10 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය 79

4.4. 11 ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර 81

4.4.12 ප්‍රශ්න අංක 6සඳහා විශ්ලේෂණය 82

4.4.13 ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර 84

4.4.14 ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය 86

# වගු නාමාවලිය

| | | |
|---|---|---|
| වගුව 1.1 | මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 02 |
| වගුව 1.2 | ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 02 |
| වගුව 1.3 | දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 04 |
| වගුව 1.4 | අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 06 |
| වගුව 1.5 | පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය | 10 |
| වගුව 2.1 | ලකුණු දීමේ පටිපාටිය | 17 |
| වගුව 2.2 | එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය | 18 |

# ප්‍රස්ථාර නාමාවලිය

**I කොටස**


| | | |
|---|---|---|
| ප්‍රස්තාරය 2.1 | I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක | 19 |
| ප්‍රස්තාරය 2.2 | I පත්‍රයේ විෂය තේමා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශකය | 20 |
| ප්‍රස්තාරය 3.1 | II පත්‍රයේ ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා ඇති ආකාරය සහ එක් එක් ප්‍රශ්නයෙහි පහසුතාව | 27 |
| ප්‍රස්තාරය 3.2 | පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය | 28 |
| ප්‍රස්තාරය 3.3 | II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක | 29 |
| ප්‍රස්තාරය 3.4 | ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 32 |
| ප්‍රස්තාරය 3.5 | ප්‍රශ්න අංක 1 සඳහා පහසුතා දර්ශක | 32 |
| ප්‍රස්තාරය 3.6 | ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 38 |
| ප්‍රස්තාරය 3.7 | ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශක | 38 |
| ප්‍රස්තාරය 3.8 | ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 42 |
| ප්‍රස්තාරය 3.9 | ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශක | 42 |
| ප්‍රස්තාරය 3.10 | ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 47 |
| ප්‍රස්තාරය 3.11 | ප්‍රශ්න අංක 4හි පහසුතා දර්ශක | 47 |
| ප්‍රස්තාරය 3.12 | ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 51 |
| ප්‍රස්තාරය 3.13 | ප්‍රශ්න අංක 5 සඳහා පහසුතා දර්ශක | 51 |
| ප්‍රස්තාරය 4.1 | III ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සපයා ඇති ආකාරය සහ එක් එක් ප්‍රශ්නයෙහි පහසුතාව | 55 |
| ප්‍රස්තාරය 4.2 | III පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 56 |
| ප්‍රස්තාරය 4.3 | III පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක | 57 |
| ප්‍රස්තාරය 4.4 | ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 60 |
| ප්‍රස්තාරය 4.5 | ප්‍රශ්න අංක 1 සඳහා පහසුතා දර්ශක | 60 |
| ප්‍රස්තාරය 4.6 | ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 64 |
| ප්‍රස්තාරය 4.7 | ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශක | 64 |
| ප්‍රස්තාරය 4.8 | ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 68 |
| ප්‍රස්තාරය 4.9 | ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශක | 68 |
| ප්‍රස්තාරය 4.10 | ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 74 |
| ප්‍රස්තාරය 4.11 | ප්‍රශ්න අංක 4 සඳහා පහසුතා දර්ශක | 74 |

ප්‍රස්තාරය 4.12 ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 79
ප්‍රස්තාරය 4.13 ප්‍රශ්න අංක 5 සඳහා පහසුතා දර්ශක 79
ප්‍රස්තාරය 4.14 ප්‍රශ්න අංක 6 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 82
ප්‍රස්තාරය 4.15 ප්‍රශ්න අංක 6 සඳහා පහසුතා දර්ශක 82
ප්‍රස්තාරය 4.16 ප්‍රශ්න අංක 7 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 86
ප්‍රස්තාරය 4.17 ප්‍රශ්න අංක 7 සඳහා පහසුතා දර්ශක 86

# I කොටස

## 1. විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අරමුණු

- භාෂාවේ අනන්‍යතාව, සුවිශේෂ බව හා භාෂා රීති හඳුනා ගෙන තොරතුරු ව්‍යක්ත ව නිරවුල්ව හා නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ ශක්‍යතා වර්ධනය කර ගැනීම.
- ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක ලේඛනවල ශිල්පීය මූලධර්ම, ආකෘතිය ලක්ෂණ, රචනා රීති හා භාෂා ව්‍යවහාර පිළිබඳ පරිචය ලබා ගැනීම.
- පුරාතන හා නූතන සාහිත්‍ය කෘති පරිශීලනයෙන් ඒවායෙහි අන්තර්ගත වන සමාජ, සංස්කෘතික අගය අවබෝධ කර ගැනීම.
- වින්දනාත්මක, විචාරාත්මක හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගනිමින් සාහිත්‍ය කෘති රස වින්දනයට මෙන් ම නිර්මාණකරණයට පෙළඹවීම.
- වර්ධනය වන්නාවූත්. ව්‍යාප්ත වන්නාවූත්, සාහිත්‍ය, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහාගත හැකිවන පරිදි භාෂා කුසලතා වර්ධනය කරගනිමින් ජීවිත අභියෝග ජය ගැනීම.
- භාෂාව හා සාහිත්‍යය පරිශීලනය මගින් ස්වීයත්වය, භාෂා මාමකත්වය, ජාතික අනන්‍යතාව හා සාමකාමී සහජීවනය වර්ධනය කර ගැනීම.

**මූලාශ්‍රය :** 11 ශ්‍රේණිය සිංහල ගුරු මාර්ගෝපදේශය, 2016, ජා. අ. ආ

## 1.2 අපේක්ෂකයන්ගේ විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

**වගුව 1.1**

මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| මාධ්‍යය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව |
| | එකතුව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| සිංහල | 128,025 | 50.36 | 126,199 | 49.64 | 254,224 | 4,095 | 53.20 | 3,603 | 46.80 | 7,698 | 132,120 | 50.44 | 129,802 | 49.56 | 261,922 |

**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

2022 වර්ෂයේ අ. පො. ස (සා. පෙළ) විභාගයේ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය සඳහා පෙනී සිටි මුළු අපේක්ෂකයන් සංඛ්‍යාව 261,922 කි. ඉන් 254,224 (97%) ක් පාසල් අපේක්ෂකයන් ද, 7,698 (3%) ක් පෞද්ගලික අපේක්ෂකයන් ද වේ.

අපේක්ෂකයන්ගේ ස්ත්‍රී පුරුෂභාවය අනුව සැලකීමේ දී සමස්ත අපේක්ෂකයන්ගෙන් 132,120 (50.44%) ක් පුරුෂ අපේක්ෂකයන් ද 129,802(49.56%) ක් ස්ත්‍රී අපේක්ෂකයන්ද වේ. පාසල් අපේක්ෂකයන් හා පෞද්ගලික අපේක්ෂකයන් අතුරෙන් පිළිවෙළින් 50.36%ක් හා 53.20% ක් පුරුෂ අපේක්ෂකයන් වන අතර සිංහල විෂය සඳහා මෙම වර්ෂයේ වැඩි ප්‍රමාණයක් පුරුෂ අපේක්ෂකයන් පෙනී සිටි බව පැහැදිලි වේ.

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය

**වගුව 1.2**

ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| ශ්‍රේණි | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| A | 14,075 | 10.99 | 33,320 | 26.40 | 47,395 | 180 | 4.40 | 419 | 11.63 | 599 | 14,255 | 10.79 | 33,739 | 25.99 | 47,994 |
| B | 18,276 | 14.28 | 30,786 | 24.39 | 49,062 | 306 | 7.47 | 546 | 15.15 | 852 | 18,582 | 14.06 | 31,332 | 24.14 | 49,914 |
| C | 39,276 | 30.68 | 38,855 | 30.79 | 78,131 | 883 | 21.56 | 1,078 | 29.92 | 1,961 | 40,159 | 30.40 | 39,933 | 30.76 | 80,092 |
| S | 33,159 | 25.90 | 17,292 | 13.70 | 50,451 | 1,089 | 26.59 | 882 | 24.48 | 1,971 | 34,248 | 25.92 | 18,174 | 14.00 | 52,422 |
| F | 23,239 | 18.15 | 5,946 | 4.71 | 29,185 | 1,637 | 39.98 | 678 | 18.82 | 2,315 | 24,876 | 18.83 | 6,624 | 5.10 | 31,500 |
| එකතුව | **128,025** | **100.00** | **126,199** | **100.00** | **254,224** | **4,095** | **100.00** | **3,603** | **100.00** | **7,698** | **132,120** | **100.00** | **129,802** | **100.00** | **261,922** |

**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2022, ශ්‍රී.ලං.වි.දෙ.

2022 වර්ෂයේ සිංහල විෂය සඳහා පෙනී සිටි මුද් අපේක්ෂක සංඛ්‍යාව 261,922 අතුරෙන් 47,994ක් (18.32%) විශිෂ්ඨ සාමර්ථ්‍යයද, 49,914 (19.05%) අධි සම්මාන සාමර්ථ්‍යයද, 80,092 (30.57%) සම්මාන සාමර්ථ්‍යයද , 52,422 (20.01%)ක් සාමාන්‍ය සාමර්ථ්‍යය ද, ලබා ඇති අතර 31,500 (12.02%)ක් අසමත් වී ඇත.

මුළු අපේක්ෂකයන් අතුරෙන් 132,120ක පුරුෂ අපේක්ෂකයන් 24,876 (18.83%)ක් අසමත් වී ඇති අතර 129,802 ස්ත්‍රී අපේක්ෂකයන්ගෙන් 6,624 (5.1%)ක් අසමත් වී ඇත.

ශ්‍රේණි ලබා ගැනීමේ දී මුළු අපේක්ෂකයන්ගෙන් වැඩි ම A සාමර්ථ්‍යය ප්‍රතිශතයක් ලබා ඇත්තේ ස්ත්‍රී අපේක්ෂකයන් ය. පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන් A සාමර්ථ්‍යය වැඩි ප්‍රතිශතයක් ලබා ඇත්තේ ස්ත්‍රී අපේක්ෂකයන් වන අතර දෙපිරිසම සැලකීමේ දී S සාමර්ථ්‍යය වැඩි ම ප්‍රමාණයක් ලබාගෙන ඇත්තේ පුරුෂ අපේක්ෂකයන් ය.

### 1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

**වගුව 1:3**

දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | සිංහල | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | A | | B | | C | | S | | A+B+C+S | | w | |
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 29,845 | 7,546 | 25.28 | 6,012 | 20.14 | 8,331 | 27.91 | 4,783 | 16.03 | 26,672 | 89.37 | 3,173 | 10.63 |
| ගම්පහ | 28,292 | 5,740 | 20.29 | 5,626 | 19.89 | 8,342 | 29.49 | 5,100 | 18.03 | 24,808 | 87.69 | 3,484 | 12.31 |
| කලුතර | 16,215 | 3,095 | 19.09 | 3,097 | 19.10 | 4,882 | 30.11 | 3,067 | 18.91 | 14,141 | 87.21 | 2,074 | 12.79 |
| මහනුවර | 16,955 | 3,086 | 18.20 | 3,245 | 19.14 | 5,557 | 32.77 | 3,365 | 19.85 | 15,253 | 89.96 | 1,702 | 10.04 |
| මාතලේ | 6,159 | 873 | 14.17 | 1,167 | 18.95 | 2,088 | 33.90 | 1,268 | 20.59 | 5,396 | 87.61 | 763 | 12.39 |
| නුවරඑළිය | 5,151 | 665 | 12.91 | 1,067 | 20.71 | 1,824 | 35.41 | 1,065 | 20.68 | 4,621 | 89.71 | 530 | 10.29 |
| ගාල්ල | 17,144 | 4,056 | 23.66 | 3,566 | 20.80 | 4,823 | 28.13 | 2,790 | 16.27 | 15,235 | 88.86 | 1,909 | 11.14 |
| මාතර | 12,876 | 2,494 | 19.37 | 2,522 | 19.59 | 3,885 | 30.17 | 2,502 | 19.43 | 11,403 | 88.56 | 1,473 | 11.44 |
| හම්බන්තොට | 10,358 | 1,918 | 18.52 | 2,043 | 19.72 | 3,287 | 31.73 | 2,029 | 19.59 | 9,277 | 89.56 | 1,081 | 10.44 |
| යාපනය | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| මන්නාරම | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| වව්නියාව | 262 | 27 | 10.31 | 43 | 16.41 | 79 | 30.15 | 66 | 25.19 | 215 | 82.06 | 47 | 17.94 |
| මුලතිව් | 142 | 8 | 5.63 | 27 | 19.01 | 33 | 23.24 | 42 | 29.58 | 110 | 77.46 | 32 | 22.54 |
| කිලිනොච්චිය | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| මඩකලපුව | 1 | -00 | 0.00 | 1 | 100.00 | -00 | | -00 | | 1 | 100.00 | -00 | |
| අම්පාර | 4,578 | 554 | 12.10 | 842 | 18.39 | 1,574 | 34.38 | 1,076 | 23.50 | 4,046 | 88.38 | 532 | 11.62 |
| ත්‍රිකුණාමලය | 1,738 | 189 | 10.87 | 242 | 13.92 | 544 | 31.30 | 416 | 23.94 | 1,391 | 80.03 | 347 | 19.97 |
| කුරුණෑගල | 23,673 | 4,705 | 19.87 | 4,931 | 20.83 | 7,448 | 31.46 | 4,372 | 18.47 | 21,456 | 90.63 | 2,217 | 9.37 |
| පුත්තලම | 8,698 | 1,327 | 15.26 | 1,720 | 19.77 | 2,770 | 31.85 | 1,776 | 20.42 | 7,593 | 87.30 | 1,105 | 12.70 |
| අනුරාධපුරය | 13,997 | 2,268 | 16.20 | 2,628 | 18.78 | 4,410 | 31.51 | 2,870 | 20.50 | 12,176 | 86.99 | 1,821 | 13.01 |
| පොළොන්නරුව | 6,136 | 833 | 13.58 | 1,115 | 18.17 | 1,915 | 31.21 | 1,365 | 22.25 | 5,228 | 85.20 | 908 | 14.80 |
| බදුල්ල | 10,271 | 1,795 | 17.48 | 2,106 | 20.50 | 3,447 | 33.56 | 2,010 | 19.57 | 9,358 | 91.11 | 913 | 8.89 |
| මොණරාගල | 7,676 | 1,060 | 13.81 | 1,470 | 19.15 | 2,608 | 33.98 | 1,612 | 21.00 | 6,750 | 87.94 | 926 | 12.06 |
| රත්නපුර | 15,383 | 2,860 | 18.59 | 3,154 | 20.50 | 4,867 | 31.64 | 2,837 | 18.44 | 13,718 | 89.18 | 1,665 | 10.82 |
| කෑගල්ල | 10,751 | 2,268 | 21.10 | 2,314 | 21.52 | 3,349 | 31.15 | 1,772 | 16.48 | 9,703 | 90.25 | 1,048 | 9.75 |
| **එකතුව** | **246,301** | **47,367** | **19.23** | **48,938** | **19.87** | **76,063** | **30.88** | **46,183** | **18.75** | **218,551** | **88.73** | **27,750** | **11.27** |

**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2022, ශ්‍රී.ලං.වි.දෙ .

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අතුරෙන් සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය සඳහා වැඩි ම අපේක්ෂකයන් ප්‍රමාණයක් ඉදිරිපත් වී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙන් වන අතර එම සංඛ්‍යාව 29,845 කි. එසේ ම අඩුම අපේක්ෂකයන් ප්‍රමාණයක් පෙනී සිට ඇත්තේ මඩකලපුව දිස්ත්‍රික්කයෙන් වන අතර එම සංඛ්‍යාව 01කි. යාපනය, මන්නාරම හා කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවලින් අපේක්ෂකයන් කිසිවෙක් ඉදිරිපත් වී නොමැත.

මෙම වර්ෂයේ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය සඳහා 20% ඉක්මවා වැඩි ම A සාමර්ථ්‍ය ලබා ගත් දිස්ත්‍රික්ක වනුයේ කොළඹ (25.28%) , ගාල්ල (23.66%), කෑගල්ල (21.10%), ගම්පහ (20.29%) යන දිස්ත්‍රික්ක වේ.

මඩකලපුව දිස්ත්‍රික්කයෙන් එක් අපේක්ෂකයෙකු ඉදිරිපත් වී B සාමර්ථ්‍ය ලබා ඇති අතර, 100% සමත් ප්‍රතිශතයක් ලබා ඇත.

## 1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය අධ්‍යාපන කලාප අනුව

## වගුව 1.4

අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | සිංහල | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | A | | B | | C | | S | | A+B+C+S | | F | |
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 11,546 | 3,794 | 32.86 | 2,118 | 18.34 | 2,720 | 23.56 | 1,610 | 13.94 | 10,242 | 88.71 | 1,304 | 11.29 |
| හෝමාගම | 4,974 | 1,033 | 20.77 | 1,110 | 22.32 | 1,446 | 29.07 | 860 | 17.29 | 4,449 | 89.45 | 525 | 10.55 |
| ශ්‍රී ජයවර්ධනපුර | 7,802 | 1,765 | 22.62 | 1,661 | 21.29 | 2,404 | 30.81 | 1,262 | 16.18 | 7,092 | 90.90 | 710 | 9.10 |
| පිළියන්දල | 5,523 | 954 | 17.27 | 1,123 | 20.33 | 1,761 | 31.88 | 1,051 | 19.03 | 4,889 | 88.52 | 634 | 11.48 |
| ගම්පහ | 8,284 | 2,434 | 29.38 | 1,793 | 21.64 | 2,209 | 26.67 | 1,177 | 14.21 | 7,613 | 91.90 | 671 | 8.10 |
| මිනුවන්ගොඩ | 5,546 | 835 | 15.06 | 1,080 | 19.47 | 1,638 | 29.53 | 1,137 | 20.50 | 4,690 | 84.57 | 856 | 15.43 |
| මීගමුව | 7,267 | 1,064 | 14.64 | 1,339 | 18.43 | 2,307 | 31.75 | 1,427 | 19.64 | 6,137 | 84.45 | 1,130 | 15.55 |
| කැළණිය | 7,195 | 1,407 | 19.56 | 1,414 | 19.65 | 2,188 | 30.41 | 1,359 | 18.89 | 6,368 | 88.51 | 827 | 11.49 |
| කළුතර | 7,740 | 1,480 | 19.12 | 1,521 | 19.65 | 2,203 | 28.46 | 1,480 | 19.12 | 6,684 | 86.36 | 1,056 | 13.64 |
| මතුගම | 3,341 | 610 | 18.26 | 635 | 19.01 | 1,070 | 32.03 | 640 | 19.16 | 2,955 | 88.45 | 386 | 11.55 |
| හොරණ | 5,134 | 1,005 | 19.58 | 941 | 18.33 | 1,609 | 31.34 | 947 | 18.45 | 4,502 | 87.69 | 632 | 12.31 |
| මහනුවර | 6,460 | 2,049 | 31.72 | 1,334 | 20.65 | 1,794 | 27.77 | 842 | 13.03 | 6,019 | 93.17 | 441 | 6.83 |
| දෙනුවර | 1,676 | 162 | 9.67 | 288 | 17.18 | 638 | 38.07 | 429 | 25.60 | 1,517 | 90.51 | 159 | 9.49 |
| ගම්පොළ | 2,602 | 279 | 10.72 | 472 | 18.14 | 880 | 33.82 | 651 | 25.02 | 2,282 | 87.70 | 320 | 12.30 |
| තෙල්දෙණිය | 1,766 | 153 | 8.66 | 321 | 18.18 | 628 | 35.56 | 431 | 24.41 | 1,533 | 86.81 | 233 | 13.19 |
| වත්තේගම | 2,116 | 199 | 9.40 | 402 | 19.00 | 746 | 35.26 | 493 | 23.30 | 1,840 | 86.96 | 276 | 13.04 |
| කටුගස්තොට | 2,335 | 244 | 10.45 | 428 | 18.33 | 871 | 37.30 | 519 | 22.23 | 2,062 | 88.31 | 273 | 11.69 |
| මාතලේ | 2,830 | 559 | 19.75 | 583 | 20.60 | 886 | 31.31 | 516 | 18.23 | 2,544 | 89.89 | 286 | 10.11 |
| ගලේවෙල | 2,198 | 176 | 8.01 | 372 | 16.92 | 791 | 35.99 | 515 | 23.43 | 1,854 | 84.35 | 344 | 15.65 |
| නාඋල | 519 | 51 | 9.83 | 107 | 20.62 | 208 | 40.08 | 104 | 20.04 | 470 | 90.56 | 49 | 9.44 |
| විල්ගමුව | 612 | 87 | 14.22 | 105 | 17.16 | 203 | 33.17 | 133 | 21.73 | 528 | 86.27 | 84 | 13.73 |
| නුවරඑළිය | 670 | 93 | 13.88 | 109 | 16.27 | 221 | 32.99 | 157 | 23.43 | 580 | 86.57 | 90 | 13.43 |
| කොත්මලේ | 913 | 114 | 12.49 | 177 | 19.39 | 320 | 35.05 | 206 | 22.56 | 817 | 89.49 | 96 | 10.51 |
| හැටන් | 899 | 93 | 10.34 | 182 | 20.24 | 327 | 36.37 | 198 | 22.02 | 800 | 88.99 | 99 | 11.01 |
| වලපනේ | 977 | 124 | 12.69 | 184 | 18.83 | 368 | 37.67 | 215 | 22.01 | 891 | 91.20 | 86 | 8.80 |
| හඟුරන්කෙත | 1,692 | 241 | 14.24 | 415 | 24.53 | 588 | 34.75 | 289 | 17.08 | 1,533 | 90.60 | 159 | 9.40 |
| ගාල්ල | 8,082 | 2,296 | 28.41 | 1,663 | 20.58 | 2,135 | 26.42 | 1,135 | 14.04 | 7,229 | 89.45 | 853 | 10.55 |
| ඇල්පිටිය | 3,531 | 638 | 18.07 | 733 | 20.76 | 1,086 | 30.76 | 689 | 19.51 | 3,146 | 89.10 | 385 | 10.90 |
| අම්බලන්ගොඩ | 3,606 | 762 | 21.13 | 738 | 20.47 | 996 | 27.62 | 637 | 17.67 | 3,133 | 86.88 | 473 | 13.12 |
| උඩුගම | 1,925 | 360 | 18.70 | 432 | 22.44 | 606 | 31.48 | 329 | 17.09 | 1,727 | 89.71 | 198 | 10.29 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | සිංහල | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | A | | B | | C | | S | | A+B+C+S | | F | |
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යා ව | % |
| මාතර | 5,798 | 1,510 | 26.04 | 1,153 | 19.89 | 1,432 | 24.70 | 1,036 | 17.87 | 5,131 | 88.50 | 667 | 11.50 |
| අකුරැස්ස | 2,291 | 237 | 10.34 | 463 | 20.21 | 820 | 35.79 | 497 | 21.69 | 2,017 | 88.04 | 274 | 11.96 |
| මුලටියන (හක්මන) | 2,436 | 398 | 16.34 | 484 | 19.87 | 814 | 33.42 | 477 | 19.58 | 2,173 | 89.20 | 263 | 10.80 |
| දෙණියාය (මොරවක) | 2,351 | 349 | 14.84 | 422 | 17.95 | 819 | 34.84 | 492 | 20.93 | 2,082 | 88.56 | 269 | 11.44 |
| තංගල්ල | 2,926 | 504 | 17.22 | 662 | 22.62 | 896 | 30.62 | 593 | 20.27 | 2,655 | 90.74 | 271 | 9.26 |
| හම්බන්තොට | 4,420 | 631 | 14.28 | 770 | 17.42 | 1,440 | 32.58 | 955 | 21.61 | 3,796 | 85.88 | 624 | 14.12 |
| වලස්මුල්ල | 3,012 | 783 | 26.00 | 611 | 20.29 | 951 | 31.57 | 481 | 15.97 | 2,826 | 93.82 | 186 | 6.18 |
| යාපනය | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| දූපත් | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| තෙන්මාරච්චි | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| වලිකාමම් | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| වඩමාරච්චි | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| කිළිනොච්චිය (දකුණ) | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| කිළිනොච්චිය (උතුර) | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| මන්නාරම | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| මඩු | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| වව්නියාව (දකුණ) | 262 | 27 | 10.31 | 43 | 16.41 | 79 | 30.15 | 66 | 25.19 | 215 | 82.06 | 47 | 17.94 |
| වව්නියාව (උතුර) | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| මුලතිව් | 142 | 8 | 5.63 | 27 | 19.01 | 33 | 23.24 | 42 | 29.58 | 110 | 77.46 | 32 | 22.54 |
| තුණුක්කායි | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| මඩකලපුව | 1 | -00 | 0.00 | 1 | 100.00 | -00 | | -00 | | 1 | 100.00 | -00 | |
| කල්කුඩා | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| පදිරිප්පු | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| මඩකලපුව (මධ්‍යම) | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| මඩකලපුව(බටහිර) | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| අම්පාර | 2,843 | 390 | 13.72 | 525 | 18.47 | 951 | 33.45 | 643 | 22.62 | 2,509 | 88.25 | 334 | 11.75 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | සිංහල | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | A | | B | | C | | S | | A+B+C+S | | F | |
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යා ව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කල්මුණේ | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| සමන්තුරෙයි | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| මහඔය | 738 | 70 | 9.49 | 137 | 18.56 | 269 | 36.45 | 187 | 25.34 | 663 | 89.84 | 75 | 10.16 |
| දෙහිඅත්තකණ්ඩිය | 997 | 94 | 9.43 | 180 | 18.05 | 354 | 35.51 | 246 | 24.67 | 874 | 87.66 | 123 | 12.34 |
| අක්කරෙයිපත්තු | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| තිරුක්කෝවිල් | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| ත්‍රිකුණාමලය | 355 | 26 | 7.32 | 39 | 10.99 | 106 | 29.86 | 95 | 26.76 | 266 | 74.93 | 89 | 25.07 |
| මුතූර් | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| කන්තලේ | 1,001 | 124 | 12.39 | 156 | 15.58 | 316 | 31.57 | 228 | 22.78 | 824 | 82.32 | 177 | 17.68 |
| කින්නියා | -00 | -00 | | -00 | | -00 | | -00 | | -00 | | -00 | |
| ත්‍රිකුණාමලය (උතුර) | 382 | 39 | 10.21 | 47 | 12.30 | 122 | 31.94 | 93 | 24.35 | 301 | 78.80 | 81 | 21.20 |
| කුරුණෑගල | 6,173 | 1,751 | 28.37 | 1,391 | 22.53 | 1,711 | 27.72 | 873 | 14.14 | 5,726 | 92.76 | 447 | 7.24 |
| කුලියාපිටිය | 4,166 | 1,079 | 25.90 | 931 | 22.35 | 1,230 | 29.52 | 620 | 14.88 | 3,860 | 92.65 | 306 | 7.35 |
| නිකවැරටිය | 2,985 | 409 | 13.70 | 637 | 21.34 | 1,044 | 34.97 | 639 | 21.41 | 2,729 | 91.42 | 256 | 8.58 |
| මහව | 3,880 | 461 | 11.88 | 716 | 18.45 | 1,342 | 34.59 | 889 | 22.91 | 3,408 | 87.84 | 472 | 12.16 |
| ගිරිඋල්ල | 3,448 | 499 | 14.47 | 696 | 20.19 | 1,155 | 33.50 | 691 | 20.04 | 3,041 | 88.20 | 407 | 11.80 |
| ඉබ්බාගමුව | 3,021 | 506 | 16.75 | 560 | 18.54 | 966 | 31.98 | 660 | 21.85 | 2,692 | 89.11 | 329 | 10.89 |
| පුත්තලම | 3,230 | 290 | 8.98 | 589 | 18.24 | 1,099 | 34.02 | 750 | 23.22 | 2,728 | 84.46 | 502 | 15.54 |
| හලාවත | 5,468 | 1,037 | 18.96 | 1,131 | 20.68 | 1,671 | 30.56 | 1,026 | 18.76 | 4,865 | 88.97 | 603 | 11.03 |
| අනුරාධපුරය | 4,839 | 964 | 19.92 | 902 | 18.64 | 1,437 | 29.70 | 942 | 19.47 | 4,245 | 87.72 | 594 | 12.28 |
| තඹුත්තේගම | 2,723 | 341 | 12.52 | 558 | 20.49 | 902 | 33.13 | 545 | 20.01 | 2,346 | 86.15 | 377 | 13.85 |
| කැකිරාව | 2,679 | 454 | 16.95 | 488 | 18.22 | 838 | 31.28 | 561 | 20.94 | 2,341 | 87.38 | 338 | 12.62 |
| ගලෙන්බිඳුණුවැව | 1,744 | 219 | 12.56 | 332 | 19.04 | 620 | 35.55 | 372 | 21.33 | 1,543 | 88.47 | 201 | 11.53 |
| කැබිතිගොල්ලෑව | 2,012 | 290 | 14.41 | 348 | 17.30 | 613 | 30.47 | 450 | 22.37 | 1,701 | 84.54 | 311 | 15.46 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | සිංහල | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | A | | B | | C | | S | | A+B+C+S | | F | |
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| පොළොන්නරුව | 1,752 | 346 | 19.75 | 334 | 19.06 | 537 | 30.65 | 333 | 19.01 | 1,550 | 88.47 | 202 | 11.53 |
| හිඟුරක්ගොඩ | 2,834 | 387 | 13.66 | 528 | 18.63 | 856 | 30.20 | 627 | 22.12 | 2,398 | 84.62 | 436 | 15.38 |
| දිඹුලාගල | 1,550 | 100 | 6.45 | 253 | 16.32 | 522 | 33.68 | 405 | 26.13 | 1,280 | 82.58 | 270 | 17.42 |
| බදුල්ල | 2,053 | 485 | 23.62 | 465 | 22.65 | 634 | 30.88 | 339 | 16.51 | 1,923 | 93.67 | 130 | 6.33 |
| බණ්ඩාරවෙල | 2,544 | 706 | 27.75 | 581 | 22.84 | 771 | 30.31 | 328 | 12.89 | 2,386 | 93.79 | 158 | 6.21 |
| මහියංගණය | 2,071 | 289 | 13.95 | 369 | 17.82 | 673 | 32.50 | 453 | 21.87 | 1,784 | 86.14 | 287 | 13.86 |
| වැලිමඩ | 2,117 | 216 | 10.20 | 427 | 20.17 | 789 | 37.27 | 505 | 23.85 | 1,937 | 91.50 | 180 | 8.50 |
| පස්සර | 609 | 56 | 9.20 | 113 | 18.56 | 237 | 38.92 | 154 | 25.29 | 560 | 91.95 | 49 | 8.05 |
| වියළුව | 877 | 43 | 4.90 | 151 | 17.22 | 343 | 39.11 | 231 | 26.34 | 768 | 87.57 | 109 | 12.43 |
| මොණරාගල | 2,490 | 315 | 12.65 | 448 | 17.99 | 827 | 33.21 | 539 | 21.65 | 2,129 | 85.50 | 361 | 14.50 |
| වැල්ලවාය | 1,958 | 291 | 14.86 | 374 | 19.10 | 677 | 34.58 | 403 | 20.58 | 1,745 | 89.12 | 213 | 10.88 |
| බිබිලේ | 1,875 | 274 | 14.61 | 372 | 19.84 | 609 | 32.48 | 372 | 19.84 | 1,627 | 86.77 | 248 | 13.23 |
| තණමල්විල | 1,353 | 180 | 13.30 | 276 | 20.40 | 495 | 36.59 | 298 | 22.03 | 1,249 | 92.31 | 104 | 7.69 |
| රත්නපුර | 6,396 | 1,562 | 24.42 | 1,319 | 20.62 | 1,770 | 27.67 | 1,079 | 16.87 | 5,730 | 89.59 | 666 | 10.41 |
| බලංගොඩ | 2,568 | 443 | 17.25 | 557 | 21.69 | 891 | 34.70 | 459 | 17.87 | 2,350 | 91.51 | 218 | 8.49 |
| නිවිතිගල | 2,352 | 255 | 10.84 | 459 | 19.52 | 804 | 34.18 | 519 | 22.07 | 2,037 | 86.61 | 315 | 13.39 |
| ඇඹිලිපිටිය | 4,067 | 600 | 14.75 | 819 | 20.14 | 1,402 | 34.47 | 780 | 19.18 | 3,601 | 88.54 | 466 | 11.46 |
| කෑගල්ල | 4,446 | 1,161 | 26.11 | 998 | 22.45 | 1,311 | 29.49 | 634 | 14.26 | 4,104 | 92.31 | 342 | 7.69 |
| මාවනැල්ල | 2,978 | 443 | 14.88 | 605 | 20.32 | 1,019 | 34.22 | 568 | 19.07 | 2,635 | 88.48 | 343 | 11.52 |
| දෙහිඕවිට | 3,327 | 664 | 19.96 | 711 | 21.37 | 1,019 | 30.63 | 570 | 17.13 | 2,964 | 89.09 | 363 | 10.91 |
| **එකතුව** | **246,301** | **47,367** | **19.23** | **48,938** | **19.87** | **76,063** | **30.88** | **46,183** | **18.75** | **218,551** | **88.73** | **27,750** | **11.27** |

**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

වැඩි ම අපේක්ෂකයන් සංඛ්‍යාවක් පෙනී සිටි අධ්‍යාපන කලාපය කොළඹ (11,546) වන අතර අඩු ම අපේක්ෂකයන් සංඛ්‍යාවක් පෙනී සිටි අධ්‍යාපන කලාපය මඩකලපුව (01) වේ. අධ්‍යාපන කලාප 100න් එක් අපේක්ෂකයකු හෝ පෙනී නොසිටි අධ්‍යාපන කලාප ගණන 21කි. විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් අතුරෙන් ඉහළ සමත් ප්‍රතිශතයක් සහිත අධ්‍යාපන කලාප පිළිවෙලින් බදුල්ල (93.67) බණ්ඩාරවෙල (93.79%), මහනුවර (93.17%), කුරුණෑගල (92.76%), කුලියාපිටිය (92.66%), කෑගල්ල (92.31%), තණමල්විල (92.31%), පස්සර (91.95%), පිළියන්දල (91.90%), වැලිමඩ (91.50%), බලංගොඩ (91.51%), වළපනේ (91.20%), ශ්‍රී ජයවර්ධනපුර (90.90), තංගල්ල (90.74), හඟුරන්කෙත (90.60%), නාඋල (90.56%) හා දෙනුවර (90.51%) වේ.

### 1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබා ගෙන ඇති ආකාරය

**වගුව 1.5**

පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය

| පන්ති ප්‍රාන්තර | සංඛ්‍යාතය | සංඛ්‍යාතය ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91-100 | 119 | .05 | 261,922 | 100.00 |
| 81-90 | 12,564 | 4.80 | 261,803 | 99.95 |
| 71-80 | 39,988 | 15.27 | 249,239 | 95.16 |
| 61-70 | 50,300 | 19.20 | 209,251 | 79.89 |
| 51-60 | 48,515 | 18.52 | 158,951 | 60.69 |
| 41-50 | 42,583 | 16.26 | 110,436 | 42.16 |
| 31-40 | 33,665 | 12.85 | 67,853 | 25.91 |
| 21-30 | 20,899 | 7.98 | 34,188 | 13.05 |
| 11-20 | 10,025 | 3.83 | 13,289 | 5.07 |
| 00-10 | 3,264 | 1.24 | 3,264 | 1.25 |

**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

සිංහල විෂය සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල පන්ති ප්‍රාන්තර සැලකීමේදී වැඩිම අපේක්ෂකයන් ප්‍රමාණයක් ලකුණු ලබා ඇති පන්ති ප්‍රාන්තරය 61-70 ප්‍රාන්තරයයි. එම සංඛ්‍යාව 50,300 (19.20%)කි. දෙවනුව වැඩිම අපේක්ෂකයන් ප්‍රමාණයක් ලකුණු ලබා ඇති පන්ති ප්‍රාන්තරය වන්නේ 51-60 ප්‍රාන්තරයයි. එය 48,515 (18.52%)කි. 91-100 පන්ති ප්‍රාන්තරයේ අපේක්ෂකයන් 119ක් ලකුණු ලබා ඇති අතර කිසිදු ලකුණක් ලබා නොගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 10කි.

# II කොටස

## 2. ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - I පත්‍රය

### 2.1 සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයේ ව්‍යුහය

I පත්‍රය

කාලය පැය 01යි. බහුවරණ ප්‍රශ්න 40කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

මූලාශ්‍රය : අ.පො.ස (සා.පෙළ) විභාගය - 2016 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න, 2016, ශ්‍රී.ලං.වි.දෙ.

## 2.2 සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රය

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | I, II | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் | I, II | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature | I, II | Three hours |

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

### සිංහල භාෂාව හා සාහිත්‍යය I

උපදෙස් :

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** සිරිපාල සතු **සබ්බ සකල මනාව** ම ගංවතුරට විනාශ වූයේ ය.
(1) සියලු සම්පත් (2) ගේ තුළ තිබූ සියල්ල
(3) ධන ධාන්‍යාදිය (4) මිල මුදල්

**2.** අධික බදු බර නිසා මහජනතාව **කබලෙන් ළිපට වැටුණාහ.**
(1) පෙර පරිද්දෙන් ම දුෂ්කරතාවට පත් වූහ.
(2) පෙරට ද වඩා දුෂ්කරතාවට පත් වූහ.
(3) කබල කැඩී ළිපට ඇද වැටුණහ.
(4) දුෂ්කරතාව දරා ගැනීමට නොහැකි තත්ත්වයට පත් වූහ.

**3.** සතුරු සේනාව **වැල නොකැඩී** නගරයට ඇතුළු වූහ.
(1) නැවති නැවතී (2) එකිනෙකා පසුපසින්
(3) රංචු වශයෙන් (4) කඩින් කඩ

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** වර්තමානයෙහි, ඩොලරයට සාපේක්ෂ ව රුපියලෙහි අගය .............................. වෙයි.
(1) අස්ථාවර (2) චංචල (3) උච්චාවචනය (4) නිශ්චල

**5.** සොර දෙටුවකු වූ ජීවදත්තගේ .............................. වූයේ අග්නිදත්ත ය.
(1) චෞරයා (2) වනචරයා (3) නිශාචරයා (4) සහචරයා

**6.** වචන මාර්ගයෙන් දෙදෙනකු අතර සිදු වනුයේ ..............................
(1) විලාපයකි. (2) ප්‍රලාපයකි. (3) ආලාපයකි. (4) සංලාපයකි.

**7.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) පරිසණක, අරමුණ, තෘෂ්ණාව, සෝදාපාළුව
(2) ප්‍රතිඵල, වළාකුළු, ප්‍රණාමය, විදර්ශනා
(3) ලේඛනය, සමස්ත, ගවේෂණය, කසළ
(4) පාඨමාලාව, පිළියෙළ, සන්තුෂ්ටිය, තොටුපොළ

**8.** මුද්‍රා, ගෞරව, දීකිරි, මේඝ යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කෙටි පාපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත, දීර්ඝ ඉස්පිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය
(2) කෙටි පාපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දීර්ඝ ඉස්පිල්ල, කොම්බුව හා ගයනුකිත්ත
(3) කෙටි පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, කොම්බුව හා ගයනුකිත්ත
(4) කෙටි පාපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දීර්ඝ ඉස්පිල්ල

**9.** 'අධිකාරී' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
(1) කණ්ඨජ, දන්තජ හා ඕෂ්ඨජ ය. (2) දන්තජ, ඕෂ්ඨජ හා මූර්ධජ ය.
(3) දන්තජ, කණ්ඨජ හා මූර්ධජ ය. (4) ඕෂ්ඨජ, තාලුජ හා දන්තජ ය.

**10.** අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) කැනඩාව, ජර්මනිය, රුසියාව, ප්‍රංශය
(2) චීනය, ජපානය, භූතානය, මාලදිවයින
(3) පිලිපීනය, සිරියාව, බංග්ලාදේශය, රුමේනියාව
(4) යුක්‍රේනය, මැඩගස්කරය, නවසීලන්තය, බ්‍රසීලය

**11.** අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) දරුවා, නිළියක්, හාවන්, දෙවියන්
(2) නිවටයකු, සිවලුන්, වනිතාවක්, විදේශිකයන්
(3) සුද්දන්, මාළුවකු, බැතිමතෙක්, ගිරවකු
(4) බුද්ධිමතුන්, ධනවතකු, ලලනාවක, යකකු

**12.** 'අවුරුදු උත්සවයේ දී ඔවුහු ගඟේ ඔරු පැද්දූහ' යන වාක්‍යයෙහි 'ගඟේ' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) සම්බන්ධ (2) ආධාර (3) කර්ම (4) කරණ

**13.** 'පොල්තෙල්' යන්න අයත් වනුයේ,
(1) විශේෂණ සමාසයට ය. (2) ද්‍වන්ද්‍වාර්ථ සමාසයට ය.
(3) අන්‍යාර්ථ සමාසයට ය. (4) විභක්ති සමාසයට ය.

**14.** 'පුද්ගල + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) පෞද්ගලික (2) පුද්ගලික (3) පෞද්ගලීක (4) පුද්ගලීක

**15.** මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) ස්වර සන්ධි - මලසුන, පිනැති, වමත, මනැත්
(2) කෘදන්ත - බැලීම්, සැලීම්, වෙළීම්, ගැලීම්
(3) ද්‍වන්ද්‍වාර්ථ සමාස - අත්පා, පැස්කන්, දැනදෙපා, බඩකට
(4) පූර්ව ක්‍රියා - අනා, මනා, තනා, වනා

**16.** **අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) කම්කරුවන් වැඩ කරද්දී ස්වාමියා බලා සිටියි.
(2) දරුවෝ උඩ පැන පැන රංගනයේ යෙදුණහ.
(3) සමන් විදේශගත වුවහොත් මම ද එහි යන්නෙමි.
(4) දරුව, ඉක්මනින් මෙහි එව'යි පියාණෝ කීහ.

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න

**17.** පර්යේෂකයා එකී කෘතිය ගැන කළ **සමාලෝචනය** අතිශය වැදගත් ය.
(1) මැනවින් සෙවීම (2) මැනවින් නෙත් යොමු කිරීම
(3) ගැඹුරින් සොයා බැලීම (4) ගැඹුරින් විමසා බැලීම

**18.** ඔහු **සාරගර්භ** දේශනයක් පැවැත්වී ය.
(1) සාරවත්භාවයෙන් පිරුණු (2) සාරවත් ගර්භයකින් යුතු
(3) සාරවත් වූ ගැබක් ඇති (4) සාරවත් වූ ආරම්භයක් ඇති

**19.** ඔහු **එකුන්තිස්** වැනි වියට එළඹියේ ය.
(1) විසි එක් (2) තිස් එක් (3) විසි නව (4) තිස් නව

**20.** දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවතිනා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.

(1) ඉදල, කොස්ස, මකුළුදැල්, කුණු බඳුන
(2) හට්ටිය, මුට්ටිය, නැඹිලිය, හැන්ද
(3) පිහිය, කැත්ත, පොරොව, තාච්චිය
(4) පෑන, පැන්සල, පොත, මකනය

**21.** එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | සර-ගෙය, | නේත්‍ර-නෙත | ශීර්ෂ-නළල, | නාග-නයා |
| (2) | පවන-වාත, | සුර-අසුර, | ආකාශ-අහස, | මන්දිර-මැඳුර |
| (3) | දන්ත-දත්, | ක්ෂේත්‍ර-කුඹුර, | වත්ත-භූමිය, | සාර-සරු |
| (4) | ලතා-වැල, | රථය-රිය, | පියා-පිතෘ, | පාංශු-පස් |

**22.** මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) පොත - ග්‍රන්ථය, පුස්තකය, නිර්මාණය, ගත
(2) ශෛල - ගල, සෙල්, ශිලා, පහණ
(3) හිරු - දිනපති, දිනමිණ, සහසකර, දිනිඳු
(4) ස්ත්‍රිය - වනිතාව, කාන්තාව, මහිලා, ගැහැනිය

**23.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) කීර්ති - අපකීර්ති
(2) ප්‍රබල - දුබල
(3) මර - අමර
(4) අඳ - ගොළු

**24.** **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) 'අ + උ' යන අකුරු දෙක සන්ධි වීමෙන් 'ඒ' යන්න සැකසේ.
(2) 'දෙව්ලොව' යනු විභක්ති සමාස පදයකි.
(3) 'කුමාරතුංගයෝ' යන්නෙහි අනුක්ත රූපය 'කුමාරතුංගයන්' යන්න යි.
(4) 'ධීමත්' යනු අස්ත්‍යර්ථයේ තද්ධිත පදයකි.

**25.** පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

(1) අධර්මයෙහි නියුක්ත වූවෝ ධර්මිෂ්ඨයෝ ය.
(2) පරහිතකාමීන්ගේ මුඛ්‍ය අවධානය ආත්මලාභය සපුරාලීම යි.
(3) ජීවන අද්දැකීම් වනාහි නිර්මාණකරණයේ දී ඉතා වැදගත් ය.
(4) සාමූහික ක්‍රියාකාරකම් සියල්ල හුදකලා ව ම සිදු කිරීම පහසු ය.

- අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

**26.** පිහිටක් බලාපොරොත්තුවෙන් ගිය විට විපත්තියකට මුහුණ පෑම

(1) නැග්ග ඉණිමගට පයින් ගහනවා වාගේ.
(2) වඳින්න ගිය දේවාලය ඉහේ කඩා වැටුණා වාගේ.
(3) වක්කඩේ හකුරු හැංගුවා වාගේ.
(4) කන්න දුන් අත සපා කනවා වාගේ.

**27.** සුළු දෙයකින් උඩඟු බවට පත්වීම

(1) කවුස්සාගේ කරේ රත්තරන් බැන්දා වාගේ.
(2) බල්ලන්ට ලෙලි පොල් දුන්නා වාගේ.
(3) ඉබ්බන්ගෙන් පිහාටු ගන්නවා වාගේ.
(4) පනින රිළවුන්ට ඉණිමං බැන්දා වාගේ.

**28.** පූර්ව ස්වර ලෝප සන්ධියට හා පරස්වර ලෝප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) ඇදුරුතුමා, මැදැඟිල්ල
(2) මැදැඟිල්ල, පිනැති
(3) ඇදුරුතුමා, පිනැති
(4) මැදැඟිල්ල, ඇදුරුතුමා

- අංක **29, 30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) රටක වැසියෝ සමගියෙන් ජීවත් විය යුත්තාහ.
(2) විකුමැත්තන් සැම විට ම නුවණැත්තන් නො වෙති.
(3) ගොවියෝ කුඹුරු සාදද්දී ගෙවිලියෝ ආහාර රැගෙන යති.
(4) ප්‍රකට ගායකයෙක් වූ සනත් නන්දසිරි දක්ෂ සංගීතඥයෙක් ද විය.

**30.** (1) පැල්පත් පෙළ සුළි සුළඟින් විනාශ වූහ.
(2) ක්‍රීඩිකාව ධාවන තරගයෙන් ජය ගත්තේ ය.
(3) රාජ්‍ය නායකයා විදේශ ගත වෙති'යි වාර්තාකරුවෝ කීහ.
(4) නිවේදකයා ද නිවේදිකාව ද වේදිකාව මතට නැග්ගා ය.

**31.**
- ගුණපාල නිවටයකු .............................. හිස නැමුවේ ය.
- ආරක්ෂක අමාත්‍යාංශය රටෙහි ආරක්ෂාව .............................. පිහිටුවා ඇත.
- අසරණ දරුවන් .............................. පිළිසරණක් වන්න.
- වැද්දා සිය බල්ලා .............................. වනයට ගියේ ය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) මෙන්, කැටුව, උදෙසා, වෙනුවෙන් (2) කැටුව, මෙන්, වෙනුවෙන්, උදෙසා
(3) මෙන්, උදෙසා, වෙනුවෙන්, කැටුව (4) වෙනුවෙන්, උදෙසා, මෙන්, කැටුව

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"ගාට ගාට ඉන්නැතුව වතුර පනිට්ටුව ඇන්න වර"
(1) සෙමින් සෙමින් වතුර බාල්දිය රැගෙන එන්න.
(2) ප්‍රමාද වෙවී නොඉඳ වතුර පනිට්ටුව රැගෙන එන්න.
(3) ප්‍රමාදී ව වතුර පනිට්ටුව රැගෙන එන්න.
(4) සෙමින් සෙමින් ඇවිදිමින් වතුර බාල්දිය ගෙනෙන්න.

**33.** ස්ථිරවාසීතාව යනුවෙන් හඳුන්වන්නේ,
(1) ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසුන් සංචාරක ජීවිතයෙන් මිදී නිවාස තනා ගැනීම යි.
(2) ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසුන් සංචාරක ජීවිතයේ දී තාවකාලික නිවාස තනා ගැනීම යි.
(3) ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසුන් සංචාරක ජීවිතයෙන් මිදී එක් තැනක දිගුකලක් වාසය කිරීම යි.
(4) ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසුන් තැනින් තැන සංචාරය කරමින් ජීවත්වීම යි.

**34.** පහත සඳහන් කවියේ හතරවන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

ලීල් නැතිව නිසරුව තෙපලන්නේ
මහල්ල නුඹගේ හිමි ද අසන්නේ
වාල් තමාවත් ඇද්ද ඉතින්නේ
..........................................

(1) හැම කල් මළ දා දෝ සැප වන්නේ
(2) පෙර කල් ජාතියෙ පැතුවා වැන්නේ
(3) පර මල් පිදුවාදෝ පල දුන්නේ
(4) වාල් විඳින දුක මෙනුඹ විඳින්නේ

**35.** 'සාහිත්‍ය නිර්මාණයක් පරිශීලනයෙන් පසිඳුරන් මගින් පාඨක මනසට පිවිස පාඨකයාගේ භාව ප්‍රබෝධනයට හේතුවන වචන සංයෝජනය' යන්න සඳහා වඩාත් සුදුසු යෙදුම වන්නේ,
(1) අතිශයෝක්තිය යි. (2) සංකල්ප රූප යි.
(3) අනුප්‍රාසය යි. (4) උපමා යි.

**36.** "භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි." යන වාක්‍යයේ 'අවියෝජනීය' යන්නෙන් අදහස් කරන්නේ,
(1) වෙන් කළ නොහැකි යන්න යි.
(2) වෙන් කළ හැකි යන්න යි.
(3) එකිනෙකට නොගැළපෙන යන්න යි.
(4) එකිනෙක හා ගැටෙන යන්න යි.

**37.** පුරාණ කමත් භාෂාවේ 'අළුහන් වැඩීම' යනු
(1) කොළ මැඬීමට හරකුන් එකට ඇඳා ගැනීම යි.
(2) අලුයම් කාලයේ කමතට ගොයම් ගෙන ඒම යි.
(3) ගොයම් පැගු පසු පිදුරු ඉවත් කිරීම යි.
(4) අළුවලින් කමතේ යන්ත්‍රයක් ඇඳීම යි.

**38.** ලීලා, ගම්පෙරළිය, යුගාන්තය යන නවකතාවල රචකයා වන්නේ,
(1) ගුණදාස අමරසේකර මහතා ය.
(2) මාර්ටින් වික්‍රමසිංහ මහතා ය.
(3) පියදාස සිරිසේන මහතා ය.
(4) ඒ. වී. සුරවීර මහතා ය.

**39.** තලමල පිපිලා නාට්‍යයේ ඇතුළත් චරිතයක් **නො වේ.**
(1) හේතු (2) රංබරණ (3) සිරිමාන්න (4) ගුණවංශ

**40.** පහත සඳහන් වාක්‍යයේ අදහසට වඩාත් සමීප අදහස දෙන වාක්‍යය තෝරන්න.
"මිනිසා විසින් නිර්මාණය කරන ලද හෝ ස්වාභාවික ව ඇතිවන, තාක්ෂණික ව හෝ ක්‍රමානුකූල ව වර්ධනය වූ, එයට ගොදුරුවන ජනතාවට විවිධ සුවිශේෂ පියවර අනුගමනය කිරීමට සිදුවන සිදුවීමක් ආපදාවක් වේ."
(1) ආපදාවක් යනුවෙන් හඳුන්වන්නේ මිනිස් නිර්මාණයක් හෝ ස්වාභාවික ව ඇති වී වර්ධනය වූ ජනතාවට විවිධ බලපෑම් ඇති කරන සිදුවීම් ය.
(2) ආපදාවක් යනු මිනිසා නිසා හෝ ස්වාභාවික ව හෝ ඇති වී විවිධ හේතුමත වර්ධනය වූ ඊට මුහුණ දෙන ජනතාවට ඒ වෙනුවෙන් සුවිශේෂ මැදිහත්වීම් කිරීමට සිදුවන සිදුවීමකි.
(3) ආපදාවක් නමින් හඳුන්වන්නේ මිනිස් ක්‍රියාකාරකම් නිසා හෝ ස්වාභාවික ව හෝ ඇති වී වර්ධනය වී ඊට මුහුණ දෙන ජනතාවට ඒ වෙනුවෙන් සුවිශේෂ ව කටයුතු කිරීමට සිදුවන සිදුවීමකි.
(4) ආපදාවක් යනු මිනිසාගේ නිර්මාණයක් හෝ ස්වාභාවික ව ඇතිවන්නක් වන අතර එය තාක්ෂණික ව හා ක්‍රමානුකූල ව වර්ධනය වී ඊට මුහුණ දෙන ජනතාවට විවිධාකාර විශේෂ මැදිහත්වීම් කිරීමට සිදුවන සිදුවීමකි.

## 2.3 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය

**වගුව 2.1**

**ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 1 | **1** | 21 | **4** |
| 2 | **2** | 22 | **1** |
| 3 | **2** | 23 | **4** |
| 4 | **3** | 24 | **1** |
| 5 | **4** | 25 | **3** |
| 6 | **4** | 26 | **2** |
| 7 | **3** | 27 | **1** |
| 8 | **1** | 28 | **4** |
| 9 | **3** | 29 | **1** |
| 10 | **2** | 30 | **3** |
| 11 | **4** | 31 | **3** |
| 12 | **2** | 32 | **2** |
| 13 | **4** | 33 | **3** |
| 14 | **1** | 34 | **4** |
| 15 | **4** | 35 | **2** |
| 16 | **3** | 36 | **1** |
| 17 | **2** | 37 | **4** |
| 18 | **1** | 38 | **2** |
| 19 | **3** | 39 | **3** |
| 20 | **3** | 40 | **4** |

**මූලාශ්‍රය :** අ.පො.ස (සා.පෙළ) සිංහල භාෂාව හා සාහිත්‍යය ලකුණු දීමේ පටිපාටිය, 2022, ශ්‍රී. ලං. වි. දෙ.

## 2.4 I පත්‍රයේ වරණ තෝරා ඇති ආකාරය

### වගුව 2.2

එක් එක් ප්‍රශ්නයේ වරණ තෝරා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය | | | | ** |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | |
| 1 | 1 | 88.98 | 8.97 | 1.34 | 0.67 | 0.04 |
| 2 | 2 | 1.38 | 83.26 | 1.42 | 13.82 | 0.12 |
| 3 | 2 | 1.20 | 56.44 | 40.33 | 1.87 | 0.16 |
| 4 | 3 | 65.25 | 3.80 | 25.99 | 4.82 | 0.14 |
| 5 | 4 | 19.42 | 2.77 | 3.48 | 73.93 | 0.40 |
| 6 | 4 | 18.73 | 11.82 | 17.25 | 51.86 | 0.34 |
| 7 | 3 | 10.72 | 46.29 | 32.40 | 10.17 | 0.42 |
| 8 | 1 | 92.25 | 2.42 | 2.12 | 3.09 | 0.12 |
| 9 | 3 | 20.76 | 10.58 | 55.22 | 12.96 | 0.48 |
| 10 | 2 | 14.69 | 71.18 | 8.70 | 4.92 | 0.51 |
| 11 | 4 | 13.52 | 14.95 | 9.80 | 61.30 | 0.43 |
| 12 | 2 | 22.51 | 54.30 | 10.39 | 12.54 | 0.26 |
| 13 | 4 | 45.47 | 21.68 | 11.43 | 20.91 | 0.51 |
| 14 | 1 | 39.76 | 54.83 | 2.14 | 3.01 | 0.26 |
| 15 | 4 | 30.28 | 9.33 | 22.19 | 37.67 | 0.53 |
| 16 | 3 | 17.76 | 11.04 | 59.63 | 11.33 | 0.24 |
| 17 | 2 | 13.03 | 5.65 | 32.01 | 49.05 | 0.26 |
| 18 | 1 | 76.37 | 6.47 | 3.66 | 13.32 | 0.18 |
| 19 | 3 | 3.21 | 79.46 | 14.26 | 2.91 | 0.16 |
| 20 | 3 | 16.55 | 3.15 | 77.51 | 2.48 | 0.31 |
| 21 | 4 | 14.14 | 14.60 | 9.33 | 61.44 | 0.49 |
| 22 | 1 | 70.23 | 20.50 | 6.49 | 2.52 | 0.26 |
| 23 | 4 | 1.83 | 2.50 | 24.96 | 70.47 | 0.24 |
| 24 | 1 | 60.73 | 13.71 | 7.50 | 17.55 | 0.51 |
| 25 | 3 | 9.76 | 11.21 | 68.94 | 9.52 | 0.57 |
| 26 | 2 | 3.51 | 92.88 | 2.05 | 1.50 | 0.06 |
| 27 | 1 | 80.86 | 10.92 | 3.07 | 4.94 | 0.20 |
| 28 | 4 | 15.68 | 15.94 | 19.99 | 47.96 | 0.43 |
| 29 | 1 | 29.10 | 8.46 | 21.44 | 40.49 | 0.51 |
| 30 | 3 | 25.69 | 17.00 | 42.44 | 14.38 | 0.49 |
| 31 | 3 | 2.46 | 2.16 | 93.31 | 1.93 | 0.14 |
| 32 | 2 | 2.58 | 93.82 | 2.20 | 1.32 | 0.08 |
| 33 | 3 | 40.27 | 5.57 | 50.03 | 3.93 | 0.20 |
| 34 | 4 | 10.72 | 6.57 | 17.73 | 64.49 | 0.49 |
| 35 | 2 | 27.17 | 48.89 | 14.83 | 8.77 | 0.34 |
| 36 | 1 | 75.74 | 4.03 | 10.05 | 9.90 | 0.28 |
| 37 | 4 | 12.73 | 30.18 | 19.32 | 37.40 | 0.37 |
| 38 | 2 | 8.20 | 81.31 | 7.12 | 3.03 | 0.34 |
| 39 | 3 | 28.68 | 12.00 | 38.07 | 20.64 | 0.61 |
| 40 | 4 | 11.33 | 9.64 | 21.29 | 57.39 | 0.35 |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය අඳුරු කර ඇත.


** උත්සහ නොකළ හා එක් වරණයකට වඩා ප්‍රතිචාර දක්වා ඇති අපේක්ෂක ප්‍රතිශතය

**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2022, ශ්‍රී . ලං. වි. දෙ.

## 2.5 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක

**ප්‍රස්තාරය 2.1**


I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/5/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2022, ශ්‍රී. ලං. වි. දෙ.

## 2.6 I පත්‍රයේ තේමා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශකය

ප්‍රස්තාරය 2.2
සිංහල I පත්‍රයේ විෂය තේමා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශකය



මූලාශ්‍රය : RD/16/5/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2022, ශ්‍රී. ලං. වි. දෙ.

## 2.7 I පත්‍රයේ විශ්ලේෂණය

සිංහල I පත්‍රයේ ප්‍රශ්න සකස් වී ඇති ආකාරය (තේමා අනුව) මෙසේ වගුගත කර දැක්විය හැකිය.

| අනු අංකය | තේමාව | ප්‍රශ්න සංඛ්‍යාව | ප්‍රශ්න අංක |
|---|---|---|---|
| 1 | සාම්ප්‍රදායික යෙදුම් | 05 | 1,2,3,26,27 |
| 2 | වාක්කෝෂය | 12 | 4,5,6,17,18,19,21,22,23,33,36,37 |
| 3 | අක්ෂර මාලාව | 04 | 7,8,9,10 |
| 4 | ව්‍යාකරණ | 13 | 11,12,13,14,15,16,24,25,28,29,30,31,32 |
| 5 | සාහිත්‍යය පිළිබඳ දැනුම | 04 | 34,35,38,39 |
| 6 | අවබෝධය | 02 | 20,40 |

1 පත්‍රයේ ප්‍රශ්න 40 තේමා 6ක් යටතේ වර්ගකර දැක්විය හැකිය. එහි සම්ප්‍රදායික යෙදුම් භාවිතය පිළිබඳ දැනුම හා අවබෝධය මැනෙන, ප්‍රශ්න සංඛ්‍යාව 6කි. එම ප්‍රශ්න අතුරින් 03 ප්‍රශ්නයේදී (56%) හැර අනෙක් ප්‍රශ්නවල පහසුතාව 80% ඉක්මවා ඇත. වාක්කෝෂීය දැනුම හා භාවිතය පිළිබඳ ව පරීක්‍ෂා කෙරුණු ප්‍රශ්න සඳහා අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර දැක්වීම විවිධ වේ. එහිදී නිතර ව්‍යවහාරයේ යෙදෙන පද සඳහා සාධනීය ප්‍රතිචාර දක්වා ඇති අතර අනෙක් පද පිළිබඳ ව දක්වා ඇති ප්‍රතිචාර සාධනීය නොවේ. එසේම ව්‍යාකරණ වර්ග හා ව්‍යාකරණ ප්‍රවර්ග ඇසුරෙන් නිර්මාණය වී ඇති 31 හා 32 ප්‍රශ්නය සඳහා 90% ඉක්ම වූ ඉහළ පහසුතා අගයන්ද 11,16,24,25 ප්‍රශ්න සඳහා 60%-70% පරාසය තුළ මධ්‍යස්ථ පහසුතා අගයන් ද, 12,13,14,15,28,29,30 ප්‍රශ්න සඳහා 60%ට අඩු පහසුතා අගයන්ද ඇත. 1 පත්‍රයට අපේක්ෂකයන් පිළිතුරු සපයා ඇති ආකාරය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී වාක්කෝෂීය දැනුම, ව්‍යාකරණ වර්ග හා ප්‍රවර්ග, විවිධ සාහිත්‍ය කෘති ආදිය ඇසුරෙන් අසන ප්‍රශ්න සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු බව පෙනේ.

## 2.8 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

පළමුවන ප්‍රශ්න පත්‍රයේ 75%කට වඩා වැඩි පහසුතාවක් සහිත ප්‍රශ්න සංඛ්‍යාව 11කි. 35%කට වඩා අඩු පහසුතාවක් සහිත ප්‍රශ්න සංඛ්‍යාව 6කි.

**ප්‍රශ්න අංක 17 නිවැරදි වරණය 2 පහසුතාව 5.65%කි.**

මෙම ප්‍රශ්නය මගින් වාක්කෝෂය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කර ඇත. මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය තෝරා ගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය 5.65%කි. එහෙත් 49.05%ක අපේක්ෂක ප්‍රතිශතයක් (4) වරණය තෝරා ගෙන ඇත. මේ අනුව බොහෝ අපේක්ෂකයන්ගේ වාක්කෝෂය පිළිබඳ අවබෝධය සතුටුදායක මට්ටමක නොමැති බව කිව හැකිය. පෙළ පොත් වැඩි වශයෙන් පරිශීලනයට යොමු කරවීමටත් වාක්කෝෂය ඉගෙනීම සඳහා වැඩි පෙළඹවීමක් ඇති කිරීමටත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

**ප්‍රශ්න අංක 19 නිවැරදි වරණය 3 පහසුතාව 14.26%කි.**

මෙම ප්‍රශ්නය මගින් ද පරීක්ෂා කර ඇත්තේ වාක්කෝෂය පිළිබඳ දැනුමයි. මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය වන (3) වරණය අපේක්ෂකයන්ගෙන් 14.26% ක් තෝරා ගෙන ඇති අතර 79.46%ක් ම පිළිතුර ලෙස තෝරා ගෙන ඇත්තේ (2) වරණයයි. 17 සහ 19 යන ප්‍රශ්න දෙක සඳහා සපයා ඇති පිළිතුරු අනුවද බොහෝ අපේක්ෂකයන්ගේ වාක්කෝෂය පිළිබඳ ඇති අවබෝධය ප්‍රමාණවත් නොවන බව කිව හැකිය.

**ප්‍රශ්න අංක 13 නිවැරදි වරණය 4 පහසුතාව 20.91%කි.**

මෙම ප්‍රශ්නය ව්‍යාකරණ පිළිබඳ අවබෝධය පරීක්ෂා කර ඇත. ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ සමාස පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුමයි. නිවැරදි වරණය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 20.91%කි. 45.47%ක් පිළිතුර ලෙස (1) වරණය තෝරා ගෙන ඇත. මේ අනුව සමාස ප්‍රවර්ග පිළිබඳ බොහෝ අපේක්ෂකයන් සතු දැනුම ප්‍රමාණවත් නොවන බව කිව හැකිය. එබැවින් එක් එක් සමාස ප්‍රවර්ගයේ සුවිශේෂ ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම වැදගත් වේ.

**ප්‍රශ්න අංක 04 නිවැරදි වරණය 3 පහසුතාව 25.99%කි.**

මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කර ඇති වාක්කෝෂය සහ එහි භාවිතය පිළිබඳ දැනුමයි. අපේක්ෂකයන්ගෙන් 25.99%ක ප්‍රතිශතයක් නිවැරදි වරණය තෝරා ගෙන ඇතත්, පිළිතුර ලෙස 1 වරණය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 65.25%කි. වාක්කෝෂය පිළිබඳ දැනුම මෙන් ම එහි භාවිතය පිළිබඳ අවබෝධය සතුටුදායක මට්ටමක නොතිබීම මෙම තත්ත්වයට හේතු විය හැකි ය. එබැවින් ඒ කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු කිරීම වැදගත් වේ.

**ප්‍රශ්න අංක 29 නිවැරදි වරණය 1 පහසුතාව 29.1%කි.**

මෙම ප්‍රශ්නය උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ දැනුම විමසා බලා ඇති ව්‍යාකරණ ප්‍රශ්නයකි. අපේක්ෂකයන්ගෙන් 29.1%ක් නිවැරදි වරණය තෝරා ගෙන ඇති අතර 40.49%ක් පිළිතුර වශයෙන් 4 වරණය තෝරා ගෙන ඇත. මේ අනුව බොහෝ අපේක්ෂකයන්ගේ සම්මත ව්‍යාකරණ රීතීන්ට අනුව උක්ත්‍යාඛ්‍යාත පද පිළිබඳ දැනුම අවබෝධය ප්‍රමාණවත් මට්ටමක නොමැති බව කිව හැකිය. සිසුන් ප්‍රායෝගික අභ්‍යාසකරණයට වැඩි වශයෙන් යොමු කිරීම කෙරෙහි සුවිශේෂ අවධානය යොමු කිරීම වැදගත් වේ.

**ප්‍රශ්න අංක 07 නිවැරදි වරණය 3 පහසුතාව 32.4%කි.**

මෙම ප්‍රශ්නය අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම විමසා ඇති ප්‍රශ්නයකි. අපේක්ෂකයන්ගෙන් 32.4%ක් නිවැරදි වරණය තෝරා ගැනීමට සමත් ව ඇත. එහෙත් අපේක්ෂකයන්ගෙන් 46.29%ක් පිළිතුර ලෙස තෝරා ගෙන ඇත්තේ 2 වරණයයි. නිවැරදි හා ව්‍යක්ත ලේඛනය සඳහා අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය වේ. එහෙත් ඒ පිළිබඳ බොහෝ අපේක්ෂකයන්ගේ අවබෝධය සතුටුදායක මට්ටමක නොපවතින බව දෘශ්‍යමාන වේ. සිංහල ලේඛන ව්‍යවහාරය- උපදේශ සංග්‍රහය (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව), සිංහල ලේඛන රීතිය (ජාතික අධ්‍යාපන ආයතනය) වැනි කෘති පරිශීලනයට යොමු කිරීමත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී නිවැරදි අක්ෂර වින්‍යාසයෙහි අවශ්‍යතාව අවධාරණය කිරීමත් වැදගත් වේ.

**ප්‍රශ්න අංක 14 නිවැරදි වරණය 1 පහසුතාව 39.76%කි.**

'සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාව්‍යයහි යෙදෙයි' යන නිපුණතාවෙහි 'නාම පද හා එහි භේද පිළිබඳව අවබෝධයෙන් යුතුව ලේඛනයෙහි යෙදෙයි' යන නිපුණතා මට්ටමට අදාළව මෙම ප්‍රශ්නය යොමු කර ඇත.

මෙමගින් 'ඉක' තද්ධිත ප්‍රත්‍යය නාම ප්‍රකෘතියක් සමඟ එකතු වූ විට පූර්ව ව්‍යංජන අක්ෂරයෙහි අන්තර්ගත සම්වරය වෙනස්වන තද්ධිත පදය සැකසෙන ආකාරය හා ඊට අදාළ වියරණ දැනුම විමසා බලා ඇත. මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර (I) වරණය (පෞද්ගලික) වන අතර එය තෝරා ඇති අපේක්ෂක ප්‍රතිශතය 39.76%කි. (2) වරණය පිළිතුර ලෙස තෝරගෙන ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 54.83%කි. එනම් 'පුද්ගලික' යන සාවද්‍ය පිළිතුර බහුතරයක් අපේක්ෂකයන් තෝරා ගෙන ඇත. සාමාන්‍ය ව්‍යවහාරයේදී 'පුද්ගලික' යන වචනය බහුලව භාවිත වීම මීට හේතු වූවා විය හැකිය. මේ සඳහා අදාළ වියරණ රීතියට අදාළ අභ්‍යාස බහුලව සිදුකිරීම සුදුසු වේ.

**ප්‍රශ්න අංක 30 නිවැරදි වරණය 3 පහසුතාව 42.44%කි.**

මෙය උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව අවබෝධය මැන ඇති ප්‍රශ්නයකි. මේ අනුව උක්තාඛ්‍යාත පද සම්බන්ධයට අදාළ ව නිවැරදි පිළිතුර තෝරා ඇති අපේක්ෂක ප්‍රතිශතය 42.44%ක් උක්තාඛ්‍යාත රීති පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවීමත්, ලේඛනයේ දී හා අභ්‍යාසකරණයේ දී ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් සිදු කළ යුතු අධ්‍යයනයන් ගැඹුරින් සිදු නොවීමත් මෙයට හේතු විය හැකි ය. ඒ සඳහා අදාළ උක්තාඛ්‍යාත රීති පිළිබඳ න්‍යායාත්මකව ඉගැන්වීම පමණක් ප්‍රමාණවත් නොවිය හැකි බැවින් මුද්‍රිත ලේඛන පරිශීලනය මගින් අදාළ උක්තාඛ්‍යාත රීති අධ්‍යයනයට යොමු කිරීම වඩාත් ඵලදායී වනු ඇත.

**ප්‍රශ්න අංක 37 නිවැරදි වරණය 4 පහසුතාව 37.40%කි.**

මෙම ප්‍රශ්නය වාග්කෝෂීය දැනුම මැන බැලෙන ප්‍රශ්නයකි. නිවැරදි වරණය තෝරා ඇති අපේක්ෂක ප්‍රතිශතය 37.40% කි එහි පරිමිත භාෂාවල පද හා අරුත් පිළිබඳ මතකය ඍජුව ම පරීක්ෂා කර ඇති බැවින් මතකය තහවුරු කෙරෙන සංවාද, කණ්ඩායම් ක්‍රියා, නාට්‍ය පිටපත් නිර්මාණය වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් දැනුම හා මතකය වඩාත් ස්ථාවර කිරීමට යොදා ගත හැකි ය.

**ප්‍රශ්න අංක 39 නිවැරදි වරණය 3 පහසුතාව 38.07%කි.**

සාහිත්‍ය දැනුම මිනුම සඳහා නිර්මාණය කර ඇති මෙම ප්‍රශ්නයේදී "තලමල පිපිලා" නාට්‍යයේ චරිත පිළිබඳ මතකය මැන බලා ඇත. නාට්‍ය පෙළ පරිශීලනය කිරීමේ දී අවධානයෙන් යුතුව සිදු නොවීම පහසුතාව අඩු වීමට හේතු විය හැකිය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ පාඩම් සැලසුම් කිරීමේ දී ශිෂ්‍යයන්ට අදාළ නාට්‍ය නැරඹීමට අවස්ථා සම්පාදනය, නාට්‍ය පෙළ රසාස්වාදය හා නාට්‍ය රංගනයට අවස්ථා සැලසීම ආදී ක්‍රියාකාරකම් සිදු කිරීම මගින් මෙම පවතින තත්ත්වය සංවර්ධනය කිරීම සඳහා උපකාරී වනු ඇත.

13, 14 හා 15 ප්‍රශ්න සඳහා පිළිවෙළින් 21%, 40%, 38% වශයෙන් අඩු පහසුතාවක් ඇත. මෙම ප්‍රශ්න ව්‍යාකරණ වර්ග හා ව්‍යාකරණ ප්‍රවර්ග පිළිබඳ අවබෝධය මැනෙන ප්‍රශ්න වේ. එම ප්‍රශ්න බොහෝ අපේක්ෂකයින්ට අභියෝගාත්මක වී ඇති බව පෙනෙයි. ව්‍යාකරණ ව්‍යාකරණ ලෙසත්, භාෂාව භාෂාව ලෙසත්, සාහිත්‍යය සාහිත්‍යය ලෙසත් වෙන වෙන ම ඉගෙනුම් ක්‍රියාවලිය සිදු කිරීමට වඩා සමෝධානික ප්‍රවේශයක් ගැනීම වඩාත් උචිත වනු ඇත. සාහිත්‍ය හා භාෂාව අධ්‍යයනයේ දී අභිමුඛ වන ව්‍යාකරණ වර්ග හා ව්‍යාකරණ ප්‍රවර්ග ඒ මොහොතේ ම අධ්‍යයනයට යොමු කිරීම ව්‍යාකරණ දැනුම ස්ථාවර කිරීමට හේතු වනු ඇත.

ඒ සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ප්‍රීතිමත් ඉගෙනුම් අවස්ථා සම්පාදනය විවිධ ඉගැන්වීම් ශිල්පීය ක්‍රම භාවිතය කියවීමේ ශිල්පීය ක්‍රම භාවිතය, කියවීමේ රුචිය වර්ධනය කරන ව්‍යාපෘති සැලසුම්කොට ක්‍රියාත්මක කිරීම, නව තාක්ෂණික මෙවලම් සහිත ඉගෙනුම් ආධාරක බහුලව භාවිත කිරීම, අනාවරණ ඉගෙනුම හා ඉදිරිපත් කිරීමේ නිපුණතාව වර්ධනය වන ලෙස පාඩම් සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කිරීම වඩාත් ඵලදායී වනු ඇත.

# III කොටස

## 3. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - II පත්‍රය

### 3.1 සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයේ ව්‍යූහය

කාලය පැය 02යි. ප්‍රශ්න 05කි. (මුළු ලකුණු 80කි.)

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

1 ප්‍රශ්නය : කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20කි.

2 ප්‍රශ්නය : රචනා ලිවීම. ලකුණු 25කි. (නිර්දිෂ්ට ව්‍යූහගත තේමා 4 ක් අතුරෙන් 1ක් තෝරා ගත යුතු ය.)

3 ප්‍රශ්නය : සාරාංශකරණය : ලකුණු 10කි.

4 ප්‍රශ්නය : අවබෝධය : ලකුණු 10කි.


5 ප්‍රශ්නය : ප්‍රායෝගික ලේඛනය : ලකුණු 15කි. (වෛකල්පික ප්‍රශ්න කොටස් දෙකකින් එකකට පමණක් පිළිතුරු ලිවිය යුතු ය.)

මූලාශ්‍රය : අ. පො. ස (සා. පෙළ) විභාගය - 2016 සහ ඉන්පසු පැවැත්වෙන විභාග සඳහා මූලාකෘති ප්‍රශ්න

## 3.2 II පත්‍රයේ විශ්ලේෂණය

### ප්‍රස්තාරය 3.1

II පත්‍රයේ ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා ඇති ආකාරය සහ එක් එක් ප්‍රශ්නයෙහි පහසුතාව





**මූලාශ්‍රය :** RD/ 16/3/OL, RD/ 16/4/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2022, ශ්‍රී.ලං.වි.දෙ.

2022 වර්ෂයේ සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයේ ප්‍රශ්න 5ටම පිළිතුරු සැපයීම අනිවාර්ය වුව ද 1 ප්‍රශ්නය සඳහා 97%ක් ද, 2 ප්‍රශ්නය සඳහා 94%ක්ද, 3 ප්‍රශ්නය සඳහා 92%ක්ද, 4 ප්‍රශ්නය සඳහා 90% ක්ද, 5 ප්‍රශ්නය සඳහා 87%ක් ද වශයෙන් අපේක්ෂකයන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා ඇත. පහසුතාව සැලකීමේ දී 84% වැඩිම පහසුතාවක් 4 ප්‍රශ්නයට ඇති අතර පිළිවෙලින් 2 ප්‍රශ්නය සඳහා පහසුතාව 59% ද, 5 ප්‍රශ්නය සඳහා පහසුතාව 58%ක් ද වේ. 3 ප්‍රශ්නයෙහි පහසුතාව 68%ක් ද වේ.

**ප්‍රස්තාරය 3.2**

පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය





**මූලාශ්‍රය :** RD/ 16/3/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2022 ශ්‍රී.ලං.වි.දෙ.

සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය සැලකීමේ දී 4 ප්‍රශ්නය සඳහා ඉහළ ම සාධන මට්ටමක් දක්වා ඇති බව පෙනේ. 4 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 77% මෙම ප්‍රශ්නය සඳහා වෙන්කළ ලකුණෙන් 76 - 100% ඉහළ පන්ති ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇත. ඉතිරි 1, 2, 3, 5 ප්‍රශ්න සඳහා අපේක්ෂකයන්ගේ වැඩි ප්‍රතිශතය ලකුණු ලබාගෙන ඇති එම ප්‍රතිශතය වෙන්කළ ලකුණ 51% - 75% පන්ති ප්‍රන්තරය තුළය. පිළිවෙළින් එම ප්‍රශ්න සඳහා වෙන් කළ ලකුණෙන් 76-100% ප්‍රාන්තරයේ 1 හා 2 ප්‍රශ්න සඳහා 19% ක් ද, 3 ප්‍රශ්නය සඳහා 37%ක් ද, 5 ප්‍රශ්නය සඳහා 25%ක් ද ආදී වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. 1 ප්‍රශ්නය හැර ඉතිරි ප්‍රශ්න 4හි ම එම ප්‍රශ්න සඳහා වෙන්කළ ලකුණෙන් 00-25 පන්ති ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇත්තේ අපේක්ෂකයන්ගේ 10%ට වඩා අඩු ප්‍රතිශතයකි.

## 3.3 II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය

ප්‍රස්තාරය 3.3

II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2022, ශ්‍රී. ලං. වි. දෙ.

## 3.4 II පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා සුවිශේෂී නිරීක්ෂණ හා නිර්දේශ

### 3.4.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න**.

(i) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් මූර්ධජ අක්ෂර සහිත වචන **දෙකක්** ලියන්න.
"විදුහලේ දියුණුව වෙනුවෙන් සියලු ළමයි තම ශ්‍රමය හා කාලය කැප කරති."

(ii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත්, අව්‍යය සමාසයට අයත් වචන **දෙකක්** ලියන්න.
"අනවශ්‍ය කලබලයකින් තොර ව, ලැයිස්තුවේ නම් සඳහන් අනුපිළිවෙළට, අලුත් පොත් ලබාගැනීම සඳහා පැමිණෙන ලෙස විදුහල්පතිතුමා ළමයින්ට දැන්වීය."

(iii) පහත සඳහන් පද නිවැරදි ව විසන්ධි කර ලියන්න.
(අ) නැණැති (ආ) අත්‍යවශ්‍ය

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.
"ප්‍රකාශන විලාශය යනු ලේඛකයා සිය වාංමාලාවෙන් තෝරා ගන්නා වචන ගළපා සිය ලේඛනය නිර්මාණය කිරීමේ දී අනුගමනය කරන තානය, තාලය හා වාගලංකරන ආදිය යි."

(v) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) වනාන්තරයෙහි හට ගන්නා ගින්න
(ආ) සැම කල්හි ම පවතින

(vi) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.
(අ) ශිෂ්‍යයෝ සිංහරාජයට ඇතුළු වූහ'යි වනාරක්ෂක නිලධාරීහු අනුමාන කරති.
(ආ) ළමයින් හෝ දෙමාපියෝ හෝ ශ්‍රමදානයට සහභාගි වෙති.

(vii) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) දුර්ලභ (ආ) ජංගම

(viii) පහත සඳහන් යෙදුම්වල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය නම් කරන්න.
(අ) විනෝද චාරිකාව අතරතුර දී ශිෂ්‍යයෝ ගී **ගයමින්** ප්‍රීති වූහ.
(ආ) "සැලළිහිණිය **වදු** කැලණිය පුරවරට"

(ix) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය සකස් කර ලියන්න.
(අ) විදෙස් ප්‍රවෘත්ති
(ආ) කල්‍යාණ මිතුරා

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘ කාරකයට හරවා ලියන්න.
(අ) රියැදුරන් විසින් රථ පෙළපාළියක් සංවිධානය කරන ලදි.
(ආ) නිවේදකයා විසින් රසිකයන් වෙත ගායකයෝ හඳුන්වා දෙනු ලබති. (ලකුණු 02 × 10 = 20 යි)

(i) දියුණුව ළමයි කරති

(ii) අනවශ්‍ය අනුපිළිවෙළ

(iii) (අ) නැණ + ඇති

(ආ) අති + අවශ්‍ය

(iv) විලාසය වාගලංකරණ

(v) (අ) ලැව් ගින්න / ලාවාග්නි

(ආ) සදාතනික / සදාකාලික / සාර්වකාලික / සර්වකාලීන

(vi) (අ) ශිෂ්‍යයන් සිංහරාජයට ඇතුළු වූහ'යි වනාරක්ෂක නිලධාරීහු අනුමාන කරති.

(ආ) ළමයි හෝ දෙමාපියෝ (හෝ) ශ්‍රමදානයට සහභාගි වෙති.

(vii) (අ) සුලභ / සුලබ

(ආ) ස්ථාවර

(viii) (අ) මිශ්‍රක්‍රියා

(ආ) විධික්‍රියා

(ix) (අ) විදෙස් පුවත් / විදේශ ප්‍රවෘත්ති

(ආ) කල්‍යාණ මිත්‍රයා / කලණ මිතුරා

(x) (අ) රියැදුරෝ රථ පෙළපාලියක් සංවිධානය කළහ / කළෝ ය / කළාහු ය.


(ආ) නිවේදකයා රසිකයන් වෙත ගායකයන් හඳුන්වා දෙයි.

### 3.4.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.4**

ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය

කොටස් 10කින් සමන්විත මෙම ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 20ක් හිමිවේ.




ඉන්,

ලකුණු 00 – 05 ප්‍රාන්තරයේ 17%ක් ද
ලකුණු 06 – 10 ප්‍රාන්තරයේ 32%ක් ද
ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 32%ක් ද
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 19%ක් ද


ලෙස ලකුණු ලබා ගෙන ඇත.

අපේක්ෂකයන්ගෙන් 51%ක් ලකුණු 11 හෝ 11ට වැඩියෙන් ලබාගෙන ඇති අතර 17% ලකුණු 5 හෝ 5ට අඩුවෙන් ලබා ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 3.5**

ප්‍රශ්න අංක 1 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය**

ප්‍රශ්න අංක 1 මගින් ව්‍යාකරණ අංග පිළිබඳව අපේක්ෂකයන් සතු දැනුම හා අවබෝධය මැන බලා එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 10ක් අනුකොටස් සහිත හා රහිත ප්‍රශ්නවලින් සමන්විත ය. මෙම ප්‍රශ්නය සඳහා වෙන්කළ ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. අනිවාර්ය ප්‍රශ්නයක් වුවද මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 97%කි.

2022 සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයේ (i) ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී (i) හා (v) (අ) අනුකොටස් සඳහා 80% ඉක්ම වූ ඉහළ පහසුතාවක් ඇති අතර (ii) අනුකොටස සඳහා පහසුතාව 64%කි. එහෙත් (vi) (අ) - 39%, (vi) (ආ) - 28%, (x) (අ) - 32%, (x) (ආ) - 17%, (iv) හා (vii) (ආ) - 36% යන ප්‍රශ්න කොටස් අනුකොටස් සඳහා ඇත්තේ 40% ට අඩු පහසුතා අගයන්ය.

මෙහි (i) කොටස මගින් අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම හා (v) (අ) මඟින් "තනිපද" පිළිබඳ අවබෝධය පරීක්ෂා කර ඇති අතර එය මෙම ප්‍රශ්නයෙහි ඉහළම පහසුතාව සහිත ප්‍රශ්න කොටස වේ. මෙහි දී (i) කොටස මගින් යොමු කර ඇති මූර්ධජ අක්ෂර හඳුනා ගැනීම සඳහා වූ මූර්ධජ "ළ" හා මූර්ධජ "ණ" ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මූර්ධජ නමින් ම හැඳින්වීම නිසා අපේක්ෂකයන්ට හුරුපුරුදුවීම ඉහළ පහසුතා අගයට හේතු විය හැකි ය. (v) (අ) අනුකොටස ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නිතර භාවිත වන වචනයක් වීම ඉහළ පහසුතාවට හේතු විය හැකි ය.

(iv) ප්‍රශ්නයේදී දී ඇති වාක්‍යක අක්ෂර වින්‍යාස දෝෂ සහිත පද තෝරාගැනීම අපේක්ෂා කර ඇත. එම කොටසෙහි පහසුතාව 36% කි. බොහෝ අපේක්ෂකයන්ගේ මෙවැනි ප්‍රශ්නවල සතතාභ්‍යාසය හා පුහුණුව පහළ මට්ටමකට පැවතීම මෙයට හේතු වී ඇතැයි සිතිය හැකි ය.

(iii) ප්‍රශ්නය මගින් නිවැරදිව පද විසන්ධි කිරීම අපේක්ෂා කර ඇති අතර එහි (ආ) අනුකොටස සඳහා පහසුතාව 42%කි. (vii) ප්‍රශ්නය මගින් දී ඇති පදවලට විරුද්ධාර්ථවත් පද ලිවීම අපේක්ෂා කර ඇත. එහි (ආ) ප්‍රශ්න අනුකොටස සඳහා පහසුතාව 36%කි. (viii) ප්‍රශ්නය මගින් දී ඇති යෙදුම්වල තදකළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියාපද ප්‍රවර්ගය නම් කිරීම අපේක්ෂා කර ඇත. එහි (ආ) ප්‍රශ්න අනුකොටස සඳහා පහසුතාව 31%කි. ඉහත සඳහන් කරන ලද ප්‍රශ්න අදාළ තේමාවන් පිළිබඳව අවබෝධය අඩු වීම හා එම තේමා ආශ්‍රිත ප්‍රශ්න අභ්‍යාසවල නිරතවීමේ පුහුණුව අඩුවීම මෙම ප්‍රශ්නවල අඩු පහසුතා අගයට හේතු විය හැකි ය.

(vi) හා (x) ප්‍රශ්න වාක්‍ය රීති ඇසුරින් නිර්මාණය වී ඇති අතර ඒ සඳහා අඩු පහසුතා අගයක් ඇත. (vi) ප්‍රශ්නයට අදාළ (අ) හා (ආ) ප්‍රශ්න අනුකොටස් සඳහා දී ඇති සදොස් වාක්‍ය නිදොස් කිරීම අපේක්ෂා කර ඇත. එහි පහසුතාව පිළිවෙළින් (iv)(අ) 39% හා (vi)(ආ) 28%ක් වේ. (x) ප්‍රශ්නයේදී දී ඇති වාක්‍ය කතෘ කාරකයට හරවා ලිවීම අපේක්ෂා කර ඇත. එහි පහසුතාව පිළිවෙළින් (අ) 32% හා (ආ) 17%ක් වේ. වාක්‍ය රීති පිළිබඳ අවබෝධය අඩුවීම හා ආකෘතියට අදාළ ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට ඇති පුහුණුවේ ඌණතා ඉහත ප්‍රශ්නවල අඩු පහසුතා හේතු විය හැකි ය.

මේ සඳහා පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා විසින් ජාතික මට්ටමේ ප්‍රශ්න පත්‍රවල අන්තර්ගත ව ඇති ව්‍යාකරණාංග පිළිබඳ මැනෙන අභ්‍යාස කරවීමත්, 2 පත්‍රයේ 1 කොටසට අදාළ ප්‍රශ්න සඳහා වූ අභ්‍යාස කරවීමත්, ආදර්ශ ප්‍රශ්න පත්‍ර කරවීමත් සිදුකළ හැකි ය. තවද, ශිෂ්‍යයන්ගේ ව්‍යාකරණ පිළිබඳ අවබෝධය තවදුරටත් සංවර්ධනය උදෙසා නව තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ විවිධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදුකිරීම හා තරග සංවිධානය කිරීම මගින් ව්‍යාකරණ රීති ඉගෙනීම සඳහා ශිෂ්‍යයන් අභිප්‍රේරණය කිරීම සිදු කළ හැකි වනු ඇත.

### 3.4.3 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර

**2.** පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** ලෝකයේ බොහෝ රටවල පවතින්නේ පානය කිරීම සඳහා භාවිත කළ නොහැකි දූෂිත ජල මූලාශ්‍රයන් ය. මෑතක් වනතුරු ම ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍රය මානව පරිභෝජනයට යොදාගත හැකි මට්ටමේ පැවතුණ ද මේ වන විට ඒවායෙන් බහුතරයක් පරිභෝජනයට නුසුදුසු මට්ටමේ පවතින බව පර්යේෂකයෝ පවසති. කර්මාන්තශාලාවලින් අවිධිමත් පරිදි අපද්‍රව්‍ය මුදාහැරීම ජල දූෂණයට බලපාන ප්‍රමුඛතම සාධකයක් වන බැවින් එය වැළැක්වීමට පවත්නා නීති-රීති දැඩි කිරීමත් නව නීති හඳුන්වා දීමත් මෙහි දී සිදු කළ යුතු ය.

**(ආ)** දිනෙන් දින ඉහළ යන විදුලිබිල පාරිභෝගිකයන්ට මෙන් ම රාජ්‍ය ආයතනවලට ද දරාගත නොහැකි මට්ටමක පවතී. වසරෙන් වැඩි කාලයක් දැඩි හිරු රශ්මියක් පවතින ශ්‍රී ලංකාව වැනි රටක සූර්ය බලශක්තිය උත්පාදනය කිරීම අපහසුතාවකින් තොර ව සිදු කළ හැකි ය. මේ සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම සහිත විශේෂඥයන් පුහුණු කිරීමට සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගැනීමෙන් මේ අර්බුදයට පිළියම් සෙවිය හැකි ය.

**(ඉ)** කාටූන් යනු මෙරට ළමා පරපුර අතර බෙහෙවින් ජනප්‍රිය රූපවාහිනී වැඩසටහන් විශේෂයකි. බහුතරයක් කාටූන් නිර්මාණවල අන්තර්ගත වන්නේ විදේශීය පසුබිමක් සහිත අද්භූත කථා ප්‍රවෘත්තීන් ය. ළමයින් අතර වඩාත් ජනප්‍රිය මේ නිර්මාණ විශේෂය සඳහා ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳ ව කියැවෙන ජනකතා යොදා ගැනීමට අවධානය යොමු කළහොත් දේශීය සම්ප්‍රදායයේ පැතිකඩ ගණනාවක් ළමා මනසෙහි රෝපණය කළ හැකි ය.

**(ඊ)** ඖෂධ හිඟය, පුහුණු වෛද්‍යවරුන්ගේ හිඟය මෙන් ම වෛද්‍ය උපකරණවල හිඟය ද හේතුවෙන් මෙරට රෝගීන්ට විධිමත් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේ අවකාශය අහිමි වෙමින් පවතී. මේ ගැටලුවලට ස්ථිරසාර පිළියම් සොයන අතරේ ම මෙරටට ආවේණික වූ පාරම්පරික ව පවත්වා ගෙන එනු ලබන දේශීය වෛද්‍ය සම්ප්‍රදායය විධිමත් ව වැඩිදියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමු කිරීම කාලෝචිත ය.

(ලකුණු 25 යි)

(අ)

- මානව පරිභෝජනයට සුදුසු ජල මූලාශ්‍රය රැක ගැනීම
- මානව පරිභෝජනය සඳහා ජල මූලාශ්‍රය සුරැකීමේ අවශ්‍යතාව
- ජල මූලාශ්‍රය රැක ගැනීමේ අවශ්‍යතාව

(ආ)

- සූර්ය බලශක්තිය උත්පාදනයේ ඇති වාසි
- සූර්ය බලශක්තියෙන් විදුලි අර්බුදය ජයගැනීම
- විදුලි බිල පාලනයට සූර්ය බලශක්තිය යොදා ගැනීම

(ඉ)

- දේශීය සංස්කෘතිය මුසු කාටූන් කලාවක වටිනාකම
- කාටූන් කලාව සඳහා දේශීය ජනකතා යොදා ගැනීමේ යෝග්‍යතාව

(ඊ)

- දේශීය වෛද්‍ය සම්ප්‍රදාය විධිමත් ව වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව
- දේශීය වෛද්‍ය සම්ප්‍රදාය නංවාලීමේ අවශ්‍යතාව

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි.**

| | | |
|---|---|---|
| 01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08 යි. |
| 02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | - | ලකුණු 12 යි. |
| 03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05 යි. |

**01.** සාරවත්භාවය - ලකුණු **07යි.**

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශනය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංග ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.
වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංග ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ **සැලකිය යුතු යි.**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට ආනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (x) ලකුණු යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂ්‍යය - ★ වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බින්දුව නො දෙන්න. සමස්තයක් ලෙස සලකා ලකුණු 02 - 05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න. උපරිම ලකුණු 05 ඉක්මවිය යුතු නො වේ.

සාරවත්භාවය මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08

| | |
|---|---|
| මාතෘකාව ද සහිත ව සාරවත් කරුණු ප්‍රමාණවත් ව ඉදිරිපත් කිරීම, මාතෘකාව රචනාවට ගැළපෙන බව, මනා භාෂා භාවිතය, තේමාවට අදාළ ව ලියා තිබීම, සරුබව හා සමබව නිවැරදි ව රැක තිබීම, වචන 250ට සමීප ව පැවතීම. | 8-7 |
| සාරවත් කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කිරීම, මාතෘකාව ද රචනාවට ගැළපෙන පරිදි යොදා තිබීම, භාෂා ශෛලිය තරමක් හොඳින් පැවතීම, තේමාවට අදාළ බව තරමක් දුරස්වීම, සම බවෙහි හා සරුබවෙහි තරමක් දුර්වලතා පැවතීම, වචන ගණන 200ට වඩා අඩුවීම. | 6-5 |
| සාරවත් කරුණු ප්‍රමාණවත් පරිදි නොතිබීම, භාෂා ශෛලියේ දුර්වලතා පැවතීම, තේමාවට අදාළ නොවීම, මාතෘකාවක් යොදා තිබීම, සරුබව හා සමබව නොපැවතීම, වචන ගණන 200ට අඩුවීම. | ලකුණු 4ට අඩු |

සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය ලකුණු 12


| | |
|---|---|
| උසස් ප්‍රකාශන ශක්තිය, මැනවින් කරුණු සංවිධානය කර තිබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය කිරීම, නිර්මාණාත්මක ව ලියා තිබීම, නිරවුල් බව, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම. | 12-10 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානයේ දී දුර්වලතා තරමක් පැවතීම. | 9-7 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානය කර ගැනීමේ දී දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වයෙහි ගැටලු දක්නට ලැබීම,<br>නිර්මාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමේ ගැටලු පැවතීම,<br>භාෂා ව්‍යවහාරයෙහි දුර්වලතා පැවතීම. | 6-4 |
| ප්‍රකාශන ශක්තියෙහි බොහෝ දුර්වලතා පැවතීම<br>කරුණු සංවිධානය කර ගැනීමේ දී බොහෝ දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වය ප්‍රදර්ශනය නොකිරීම,<br>නිර්මාණාත්මකභාවය දක්නට නොලැබීම,<br>නිරවුල් නොමැතිවීම,<br>භාෂා ව්‍යවහාරයේ බොහෝ දුර්වලතා පැවතීම. | 3-1 |

ශිල්පීය දක්ෂතා - ලකුණු 05

| | |
|---|---|
| ව්‍යාකරණ රීති නිවැරදි ව අනුගමනය කර තිබීම,<br>පැහැදිලි අත්අකුරු භාවිත කිරීම,<br>විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම,<br>නිවැරදි ඡේද වෙන්කිරීම,<br>අක්ෂර වින්‍යාස රීති භාවිතය. | 5 |
| ව්‍යාකරණ දෝෂ, අපැහැදිලි අත්අකුරු, විරාම ලක්ෂණමය දෝෂ, අක්ෂර දෝෂ තරමක් පැවතීම. | 4-3 |
| ඉහත දෝෂ බහුල වීම. | 1 |

### 3.4.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.6**




ප්‍රශ්න අංක 02 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.

එයින්,

ලකුණු 00 – 06 ප්‍රාන්තරයේ 6% ක් ද

ලකුණු 07– 12 ප්‍රාන්තරයේ 18% ක් ද


ලකුණු 13– 18 ප්‍රාන්තරයේ 57% ක් ද

ලකුණු 19 – 25 ප්‍රාන්තරයේ 19% ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 25න් 13 හෝ ඊට වඩා ලබා ගත් අපේක්ෂක ප්‍රතිශතය 76%කි.ලකුණු 6 හෝ ඊට අඩුවෙන් ලකුණු ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 6%කි.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 3.7**

ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය**

විශ්ලේෂණ හැකියාව මැන බලා ඇති මෙම ප්‍රශ්නය අ, ආ, ඉ, ඊ වශයෙන් කොටස් හතරකි. මාර්ගෝපදේශිත රචනා මූලධර්ම පදනම් කොටගෙන නිර්මාණාත්මක ලේඛනයෙහි යෙදීම මෙහි දී අපේක්ෂා කර ඇත. ඒ අනුව සපයන ලද විස්තරය ඇසුරෙන් කරුණු උකහාගෙන අදාළ කරුණු තර්කානුකූලව ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලේඛනයේ යෙදීම අපේක්ෂා කර ඇති අතර සුදුසු මාතෘකාවක් යෝජනා කිරීම ද අවශ්‍ය වේ. මෙහිදී සාරවත්භාවය හා මාතෘකාව, සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ශිල්පීය දක්ෂතා යන ශීර්ෂ ඔස්සේ රචනාව ඇගයීමට ලක් කොට ඇත. දෙවන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයක් වුවද එයට පිළිතුරු සපයා ඇති අපේක්ෂක ප්‍රතිශතය 94% වන අතර සමස්ත පහසුතාව 59%කි.

II පත්‍රයේ 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන් විසින් දී ඇති විස්තර කිරීම් භාවිතයෙන් රචනාවට අදාළ ව මාතෘකා සකස් කිරීම හා සාරවත්භාවය යන කරුණ සඳහා පහසුතා අගයන් වනුයේ පිළිවෙළින් (අ) 61%, (ආ) 64%, (ඉ) 63% හා (ඊ) 63% වේ. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය යන කරුණු සඳහා පිළිවෙළින් (අ) 57%, (ආ) 59%, (ඉ) 56%, (ඊ) 60% පහසුතා අගයන් ඇත. ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම සඳහා පිළිවෙළින් (අ) 56%, (ආ) 55%, (ඉ) 57%, (ඊ) 58% ආදී වශයෙන් පහසුතා අගයන් ඇත.

රචනා නිර්මාණයේ දී මෙම ප්‍රශ්නයෙහි අනෙකුත් අනුකොටස්වලට සාපේක්ෂව සාරවත්භාවය හා මාතෘකාව යන ශීර්ෂයට වැඩි පහසුතා අගයක් ඇත. සමස්තයක් වශයෙන් ගත් විට සියලු ම කරුණු සඳහා 50% ඉක්ම වූ පහසුතාවක් ඇති අතර එය මධ්‍යස්ථ සාධන මට්ටමකි.

රචනා ප්‍රශ්නයෙහි තේමා ලෙස අපේක්ෂකයන්ට වඩාත් සමීප තේමා තෝරා ගෙන තිබීම සමස්ත පහසුතාව 55% ඉක්මවන්නට හේතු වූවා විය හැකි ය. (ජල මූලාශ්‍ර සුරැකීම, විදුලි අර්බුදය, ජනකතා කාටූන් කලාවට ආදේශ කිරීම හා දේශීය වෛද්‍ය සම්ප්‍රදාය)

මෙහි දී ප්‍රශ්න කොටසෙහි අදාළ විස්තර ප්‍රශ්නය තුළ ම අන්තර්ගත වීම සාරවත්භාවය යන ශීර්ෂය සඳහා වැඩි පහසුතාවක් ද, ශිල්පීය දක්ෂතා යටතේ උක්තාඛ්‍යාත පද සම්බන්ධය ඇතුළු ව්‍යාකරණ දැනුම, පද බෙදීම, අක්ෂර වින්‍යාසය හා ඡේද වෙන් කිරීම සඳහා අඩු පහසුතාවක් ද ඇත.

මෙහි දී කාලීන ප්‍රවෘත්ති අධ්‍යයනය, පුවත්පත් පරිශීලනය, අන්තර්ජාලය මගින් ගෝලීය තත්ත්වයන් නිරීක්ෂණය ඉතා වැදගත් වේ. ස්වීයත්වය ප්‍රකාශ වන ලේඛන කලාවක් නිර්මාණය කොට පෝෂණය කිරීමට පහළ ශ්‍රේණිවල සිට විශේෂ අවධානය යොමු කොට සතතාභ්‍යාසයෙහි යෙදවීම වඩාත් උචිත ය.

### 3.4.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර

**3.** පහත සඳහන් පාඨය වචන **60 - 70** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග සඳහන් කරන්න.

ජනමාධ්‍ය නියාමනය මගින් අපේක්ෂා කෙරෙන අරමුණු දෙකක් පවතී. ඒවායින් එකක් වන්නේ මාධ්‍ය භාවිතය ප්‍රමිති සහගත එකක් බවට පත් කිරීම ය. අනෙක වන්නේ මාධ්‍යයේ පවතින සමාජ වගකීම පිළිබඳ අදහස් තහවුරු කිරීම ය. මාධ්‍ය නියාමනයේ ද ස්වරූප දෙකක් හඳුනාගත හැකි ය. අදාළ නියාමන ක්‍රියාවලිය මගින් ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වයේ වර්තමාන ස්වරූපය හඳුනා ගැනීම සහ එහි අනාගත පැවැත්ම පිළිබඳ අවශ්‍ය ප්‍රතිපත්තිමය රාමුව සකස් කිරීම ය. ඍජු හා වක්‍ර යන ආකාර දෙකින් නියාමන ක්‍රියාවලිය සිදු වේ. එහි දී ඍජු නියාමන ක්‍රියාවලියට අදාළ ව රාජ්‍ය අණපනත්, නීතිරීති හා කෙටුම්පත් සම්බන්ධ ප්‍රායෝගික භාවිතය කෙරෙහි අවධානය යොමු කෙරේ. වක්‍ර නියාමනය යනු ස්වයං නියාමනය යි. ඒ යටතට මාධ්‍ය ආචාරධර්ම අයත් වේ. මාධ්‍ය නිදහස අපේක්ෂා කරන ජනමාධ්‍යවේදීන් විසින් වඩාත් ම අපේක්ෂා කරනු ලබන්නේ ස්වයං නියාමනය යි. ඉහත සඳහන් කෙරුණු ද්විත්ව නියාමන ක්‍රියාවලිය මගින් ජනමාධ්‍ය කිසියම් පාලනයකට අනුකූල වේ. එහි දී හිමිකාරිත්වයේ අරමුණු සංතෘප්ත කිරීම පමණක් ජනමාධ්‍යවේදීහු අපේක්ෂා නො කරති. නිදහස් මාධ්‍ය සංස්කෘතියේ ගොඩනැගීම මෙන් ම ලිබරල්වාදී වෙළෙඳපොළ ආර්ථික රටාව හමුවේ වඩාත් පුළුල් මාධ්‍ය ක්‍රියාකාරිත්වයක් ද ඔවුහු අපේක්ෂා කරති. මාධ්‍ය නියාමනය සඳහා පූර්ණ වශයෙන් රාජ්‍ය මැදිහත්වීම පමණක් ප්‍රමාණවත් නො වේ. වඩාත් යෝග්‍ය වන්නේ ඒ සඳහා ස්වයං නියාමනය පිළිබඳ ජනමාධ්‍යවේදීන්ගේ ආකල්ප දියුණු කිරීම ද ඊට සමගාමී ව සිදු කළ යුතු වීම යි. වඩාත් ඵලදායී මාධ්‍ය නියාමනයක් සිදු වන්නේ එවිට ය.

(ලකුණු 10 යි)

**සාරාංශකරණය :**

**අන්තර්ගතය**

- මාධ්‍ය භාවිතය ප්‍රමිතිගත කිරීමත් මාධ්‍යයේ වගකීම තහවුරු කිරීමත් ජනමාධ්‍ය නියාමනයෙන් අපේක්ෂිත ය.
- ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වයේ ස්වරූපය හඳුනාගැනීමත් අනාගත පැවැත්ම පිළිබඳ ප්‍රතිපත්ති රාමුව සකස් කිරීමත් මාධ්‍ය නියාමනයේ දී වැදගත් ය.
- රාජ්‍ය ක්‍රියාවලියේ ප්‍රායෝගික භාවිතය ඍජු නියාමනයයි ස්වයං නියාමනය යනු වක්‍ර නියාමනයයි.
- ද්විත්ව නියාමනයෙන් ජනමාධ්‍ය පාලනයකට යටත් වන අතර ජනමාධ්‍යවේදීන්ගේ අපේක්ෂාව ස්වයං නියාමනයයි.
- හිමිකාරිත්වයේ අරමුණු සන්තෘප්ත කිරීමෙන් නොනැවතී පුළුල් මාධ්‍ය ක්‍රියාකාරීත්වයක් ජනමාධ්‍යවේදීහු අපේක්ෂා කරති.
- ඵලදායී මාධ්‍ය නියාමනයකට රාජ්‍ය මැදිහත් වීමත් ස්වයං නියාමනයත් වැදගත් වේ.

**සාරාංශකරණය:**

**මුළු ලකුණු ප්‍රමාණය 10 යි.**

**ලකුණු විග්‍රහය:**

| | | |
|---|---|---|
| 01. | අන්තර්ගතය - | ලකුණු 06 යි. |
| 02. | වචන ගණන - | ලකුණු 02 යි. |
| 03. | ශිල්පීය දක්ෂතා - | ලකුණු 02 යි. |

* වචන ගණන 75 ඉක්මවන කල්හි මුල් වචන 70 පමණක් ඇගයීමට ලක් කරන්න.
* වචන ගණන 55ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.
* ඡේද බෙදා තිබුණොත් ශිල්පීය දක්‍ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.
* එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02කි.
* වචන ගණන 75ට වැඩි කල්හි හෝ 55ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.
* දුර්වල සාරාංශ සඳහා බින්දුව නො දී ලකුණු 03ක උපරිමයකට යටත් ව ලකුණු පිරිනමන්න.


සාරාංශයේ අන්තර්ගතය සඳහා ලකුණු පිරිනැමීම - ලකුණු 06

| | |
|---|---|
| ප්‍රධාන කරුණු 6ක් ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම, නිරවුල් ව කරුණු ඉදිරිපත් කිරීම, වචන ගණන 60-70 අතර පැවතීම. | ලකුණු 05 - 06 |
| ප්‍රධාන කරුණු 4-5ක් පමණ ඇතුළත් වීම, වාක්‍ය අතර සම්බන්ධතාව තරමක් රැකගැනීම, වචන ගණන 50-60 අතර පැවතීම, නිරවුල්බව රැකගැනීම. | ලකුණු 03 - 04 |
| ප්‍රධාන කරුණු 4ට වඩා අඩුවෙන් ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ගිලිහී තිබීම, වචන ගණන 50ට අඩු වීම, නිරවුල් බව ගිලිහී තිබීම. | ලකුණු 01 - 02 |

### 3.4.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.8**

ප්‍රශ්න අංක 03 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය





මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන්,
ලකුණු 00 – 02 ප්‍රාන්තරයේ 2%ක් ද
ලකුණු 03 – 05 ප්‍රාන්තරයේ 12%ක් ද
ලකුණු 06 – 07 ප්‍රාන්තරයේ 49%ක් ද
ලකුණු 08 – 10 ප්‍රාන්තරයේ 37%ක් ද

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 02ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 2%ක් වන අතර, ලකුණු 06 හෝ ඊට වඩා ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 86%කි.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 3.9**

ප්‍රශ්න අංක 03 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය**

ප්‍රශ්න අංක 3හි පහසුතාව 68%කි. දෙන ලද ඡේදයක් ඇසුරින් වචන 60 – 70 අතර සාරාංශයක් ලිවීමට අපේක්ෂකයන්ට උපදෙස් දී ඇත. ඒ සඳහා සම්පූර්ණ ලකුණු 10ක් හිමි වන අතර එය බෙදී යන්නේ පහත පරිදි ය. අන්තර්ගතය - ලකුණු 06, වචන ගණන - ලකුණු 02 හා ශිල්පීය දක්ෂතා - ලකුණු 02 වශයෙනි. මෙම ප්‍රශ්නය සාරාංශකරණ කුසලතාව මැන බලා ඇති ප්‍රශ්නයක් වේ. එහි දී අපේක්ෂකයන්, කියවා අවබෝධ කර ගැනීම, ප්‍රධාන අදහස් හඳුනා ගැනීම සහ සංක්ෂිප්ත ව ලිවීම යන කුසලතා පරීක්ෂා කර ඇත.

දෙන ලද ඡේදයෙන් අපේක්ෂිත ප්‍රධාන කරුණු 06කි. එකී කරුණු 06 ම ඉදිරිපත් කොට තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම, නිරවුල් ව කරුණු ඉදිරිපත් කිරීම, නියමිත වචන ගණන අතර පැවතීම යන කරුණු සලකා අන්තර්ගතය සඳහා ලකුණු 05-06 අතර ප්‍රමාණයක් පිරිනමා ඇත. ප්‍රධාන කරුණු 06න් කරුණු 04-05ක් අතර ඇතුළත් වීම, යම් පමණකට වාක්‍ය අතර සම්බන්ධතාව රැක ගැනීම, වචන 50-60 අතර පැවතීම, නිරවුල්බව යන කරුණු සපුරා ඇති පිළිතුරු සඳහා ලකුණු 03-04 අතර ප්‍රමාණයක් හිමි වේ. පිළිතුරෙහි ප්‍රධාන කරුණු 04කට වඩා අඩුවෙන් ඉදිරිපත් කොට තිබීම, වාක්‍ය අතර සම්බන්ධය ගිලිහී යාම, වචන ගණන 50ට අඩු වීම, නිරවුල්බව ගිලිහී යාම යන කරුණු මත අපේක්ෂකයාට අන්තර්ගතය සඳහා හිමි වන්නේ ලකුණු 01-02 අතර ප්‍රමාණයකි.

ශිල්පීය දක්ෂතා යටතේ ව්‍යාකරණ රීති නිවැරදි ව අනුගමනය කර තිබීම, පැහැදිලි අත්අකුරු භාවිත කිරීම, විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම, අක්ෂර වින්‍යාස රීති අනුගමනය කිරීම, තනි ඡේදයක් සේ ලියා තිබීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇත.

3 වන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 86%ක් සමස්ත ලකුණු 10න් 5කට වඩා ලබා ගෙන ඇත. ඒ අනුව සාරාංශකරණ ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් ලබා ගෙන ඇති ලකුණු ප්‍රමාණය යම් සාධනීය මට්ටමක පවතින බව පෙනේ. නමුත් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් ප්‍රතිශතය 14%ක් වන නිසා ඒ කෙරෙහි අවධානය යොමු විය යුතු ය.

එබැවින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නිවැරදි ලෙස ව්‍යාකරණ භාවිතය, පැහැදිලි සහ සුසංයෝජිත අදහස් ප්‍රකාශනය, නිවැරදි වචන තේරීම සහ භාවිතය, අදහස් නිවැරදි ව ඒකාබද්ධ කිරීම, සංකීර්ණ තොරතුරු සරල කිරීම, මූලික අදහස් රඳවා ගනිමින් නව ආකෘතියකින් ඉදිරිපත් කිරීම, තොරතුරු විශ්ලේෂණය කර ප්‍රධාන කරුණු හඳුනා ගැනීම, අදාළ හා අනවශ්‍ය තොරතුරු වෙන් කර හඳුනා ගැනීම, තෝරා ගත් තොරතුරු ඒකාබද්ධ කිරීම යන කුසලතා දියුණු කිරීමට වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වේ.

මෙහිදී කියවා අවබෝධ කර ගැනීමේ හැකියාව වර්ධනය කර ගැනීමට පළමු ව ශිෂ්‍යයන්ගේ කියවීමේ ළැදියාව වර්ධනය කළ යුතු ය. ඒ සඳහා සිසුන් පුහුණු කළ යුත්තේ ප්‍රාථමික ශ්‍රේණිවල සිට ම ය. මේ සඳහා කියවීම් කඳවුරු, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් වැනි ක්‍රමවේද භාවිතයට ගත හැකි ය.

සාරාංශය ප්‍රශ්නය සඳහා පිළිතුරු සංවිධානය කර ගැනීමේ දී සපයා ඇති ඡේදය කියවා එහි තේමාව අවබෝධ කර ගැනීම, නැවත කියවා උපතේමා උකහා ගැනීම, කිහිප වරක් උපතේමා කියවා, අදාළ කරුණු සුදුසු පරිදි පෙළ ගස්වා ගැනීම හා තමාගේ වචනයෙන් තනි ඡේදයකින් ලිවීමට සලස්වමින් අභ්‍යාස කරවීම ප්‍රශස්ත සාරාංශයක් ලිවීමට උපකාරී වනු ඇත.

### 3.4.7 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර

**4.** පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න.

සාමූහික ආයාසයෙහි සහ පොදු අරමුණු සඳහා වැඩ කිරීමෙහි පුහුණුවක් ලබා ගැනීම සඳහා නාට්‍යයෙහි ඇති වටිනාකම ක්‍රීඩාවෙහි ඇති වටිනාකමට නොදෙවැනි බව ප්‍රකාශ කිරීම යෝග්‍ය ය. ක්‍රීඩාවෙන් නොලැබෙන වාසි දෙකක් නාට්‍යයෙන් ලැබේ. එනම්, නාට්‍ය කටයුතුවල දී වඩා විශාල කෞශල්‍ය සංඛ්‍යාවක් පුහුණු කිරීමට අවස්ථාව ලැබීම සහ මේ සියලු ම කෞශල්‍ය සඳහා යම්කිසි ප්‍රමාණයක උත්පාදක ශක්තියක් ලැබීමට හැකි වීම ය. තමා අවසානයේ දී රඟපාන කොටස නළුවා විසින් මවනු ලබන බව අමතක නො කළ යුතු ය. අධ්‍යක්ෂට කළ හැක්කේ, එය කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ව නළුවාට ඉඟි කිරීම පමණකි. එහෙත් එය නළුවා සඳහා මැවීම නම් ඔහුට කළ නො හැකි ය. වේදිකා සැරසිලිකරු, ඇඳුම් සැලසුම්කරු, වෙස් ගැන්නුම්කරු සහ ආලෝක සැලසුම්කරු යන තැනැත්තනට හිමි වන්නේ ද එවැනි ම තත්ත්වයකි. නාට්‍ය මගින් යම්කිසි අදහසක් ප්‍රකාශ කිරීම ප්‍රථමයෙන් නිෂ්පාදකයාගේ සිතෙහි ජනිත වේ. එය පසුව ප්‍රකාශ වන්නේ එය නිෂ්පාදනය කිරීමෙහි ලා සම්බන්ධ වන විවිධ පුද්ගලයන් විසිනි.

තමාගේ රඟ දැක්වීමෙහි ඇති උසස් පහත් බව නාට්‍යයෙහි අනෙකුත් නළුවන්ගේ රඟ දැක්වීම මත මුළුමනින් ම රැඳී ඇත්තේ ය යන වටිනා පාඩම ද නළුවා ඉගෙන ගනියි. නළුවකුට තනිව ම කොටසක් රඟ පෑමට සිදු වන්නේ කලාතුරකිනි. සුළු කොටස් රඟපාන්නවුන්ගේ සහාය නොලැබෙන්නේ නම්, නළුවකුට නාට්‍යයක ප්‍රධාන කොටසක් රඟපාන විට පවා උසස් තත්ත්වයකට පත් විය නො හැකි ය. එබැවින්, නාට්‍ය නිෂ්පාදනයෙහි ප්‍රධාන හෝ අප්‍රධාන හෝ යනුවෙන් රඟ දැක්වීම් කොටස් නොමැති බවත්, නාට්‍යය වනාහි විවිධ අවස්ථාවන්හි දී වේදිකා භාණ්ඩ එහා මෙහා ගෙන යන සහායකයන් විසින් පවා අත්‍යවශ්‍ය කාර්යයන් ඉටු කරනු ලබන සාමූහික ප්‍රයත්නයක් බවත් යනුවෙන් යම් කිසිවකු කරන ප්‍රකාශයෙහි කිසියම් අර්ථයක් ඇත්තේ ය. එබැවින්, නාට්‍ය රඟ දැක්වීම සම්බන්ධයෙන් ලබාගන්නා අද්දැකීම, පොදු අරමුණක් සඳහා ක්‍රියා කිරීමේ ද පෞද්ගලික කීර්තිය ලබා ගැනීමෙන් තොර ව මුළු ආයාසය සාර්ථක කර ගැනීම සඳහා සහාය වීමේ ද තෘප්තියක් ලබා ගතහැකි මඟක් වශයෙන් ළමයින්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නේ ය.

නාට්‍යයක් නිෂ්පාදනය කිරීම නිසා අන් කිසිදු සාමූහික ක්‍රියාවක් මගින් ඇති නොවන පමණට පුද්ගලයන් සමූහයක් අතර අන්‍යෝන්‍ය අවබෝධය ඇති වෙතැයි පැවසීම නිවැරදි ය. නාට්‍යයක් නිෂ්පාදනය කිරීමේ දී කලාකරුවෝ එනම්, පුද්ගලාර්ථවාදීහු ද බොහෝ විට අල්ප නොවූ මමත්වයක් ඇති පුද්ගලයෝ ද විශාල සංඛ්‍යාවක් එක් වෙති. නිෂ්පාදකයා ද සිය නළුනිළියන්ගේ දුර්වලකම් අවංක ව පෙන්වා දෙන විට ඒවා පිළිගැනීමට ඔවුන්ට සිදු වේ.

(i) මේ ඡේදයෙහි සඳහන් වන පරිදි නාට්‍යයෙන් ලබාගත හැකි වාසි දෙක මොනවා ද?

(ii) කිසියම් නාට්‍යයක අන්තර්ගත වන අදහස ප්‍රකාශයට පත් කරන්නෝ කවරහු ද?

(iii) නාට්‍යයකින් නළුවකු ඉගෙන ගන්නා පාඩම කුමක් ද?

(iv) නාට්‍යයක් රඟ දැක්වීම සම්බන්ධයෙන් ලබාගන්නා අද්දැකීම ළමයින්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නේ කවර හෙයින් ද?

(v) නළුනිළියන්ගේ දුර්වලකම් අවංක ව පෙන්වා දෙනු ලබන්නේ කවරකු විසින් ද?

(ලකුණු 02 × 5 = 10 යි)

(i) • නාට්‍ය කටයුතුවල දී වඩා විශාල කෞශල්‍ය සංඛ්‍යාවක් පුහුණු කිරීමට අවස්ථාව ලැබීම
• නාට්‍ය කටයතුවල දී පුහුණු කළ කෞශල්‍ය සඳහා යම්කිසි ප්‍රමාණයක උත්පාදන ශක්තියක් ලැබීමට හැකි වීම

(ii) නාට්‍ය නිෂ්පාදනය කිරීමට සම්බන්ධ වන විවිධ පුද්ගලයන් /**නම් 04 ලියා ඇත්නම් ලකුණු 02 , ඊට අඩු නම් 01, එකකට නම් ලකුණු නැත.**

(iii) තමාගේ රඟ දැක්වීමෙහි ඇති උසස් - පහත් බව නාට්‍යයෙහි අනෙකුත් නළුවන්ගේ රඟ දැක්වීම මත මුළුමනින් ම රඳී පවතී යන්න


(iv) පොදු අරමුණක් සඳහා ක්‍රියා කිරීමේ ද, පෞද්ගලික කීර්තිය ලබා ගැනීමෙන් තොරව මුළු ආයාසය සාර්ථක කර ගැනීම සඳහා සහාය වීමේ ද තෘප්තියක් ලබාගත හැකි මඟක් වීම නිසා

(v) නිෂ්පාදකයා

### 3.4.8 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.10**

ප්‍රශ්න අංක 04 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන්,

ලකුණු 00 – 02 ප්‍රාන්තරයේ 3%ක් ද

ලකුණු 03 – 05 ප්‍රාන්තරයේ 5%ක් ද

ලකුණු 06 – 07 ප්‍රාන්තරයේ 15%ක් ද

ලකුණු 08 – 10 ප්‍රාන්තරයේ 77%ක් ද


වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය 00-02 ප්‍රාන්තරය තුළ ප්‍රතිශත ලෙස 3%ක අපේක්ෂක පිරිසක්ද, 08-10 ඉහළම ප්‍රාන්තරය තුළ ප්‍රතිශත ලෙස 77%ක අපේක්ෂක පිරිසක් ලකුණු ලබාගෙන ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 3.11**

ප්‍රශ්න අංක 04 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය**

මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 90%කි. එහි පහසුතාව 84%කි. 4 වන ප්‍රශ්නය මගින් සපයන ලද ඡේදයක් ඇසුරෙන් අවබෝධය පිළිබඳ හැකියාව මැන බලා ඇති අතර ඡේදය ආශ්‍රිත ව එක් කොටසකට ලකුණු 05 බැගින් කොටස 05 සඳහා ලකුණු 10ක් ලැබෙන ලෙස ප්‍රශ්න පහක් ඉදිරිපත් කර ඇත. එම අනුකොටස් සඳහා (i) අනුකොටසේ පහසුතාව 95%ක් ද, (ii) අනුකොටසේ පහසුතාව 54%ක් ද, (iii) අනුකොටසේ පහසුතාව 92%ක් ද, (iv) අනුකොටසේ පහසුතාව 88%ක්ද, (v) අනුකොටසේ පහසුතාව 93% ක්ද වේ.

ප්‍රශ්නයට අදාළ ව කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කිරීමේ දී පිළිවෙළින් (i), (iii), (iv), (v) යන අනුකොටස් සඳහා අපේක්ෂකයන් සාර්ථක ව පිළිතුරු සපයා ඇත. ඊට සාපේක්ෂ ව (ii) ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම මධ්‍යස්ථ මට්ටමක පවතී. ඡේදයකින් පිළිතුරු තෝරාගැනීමේ දී බොහෝ අපේක්ෂකයන්ට ව්‍යංග්‍යාර්ථවත් ව ඉදිරිපත් වී ඇති පිළිතුරු තෝරාගැනීම පිළිබඳ අවබෝධය අඩුවීම හා ඡේද ආශ්‍රිත අභ්‍යාසයන්හි නිරතවීම අඩුවීම මෙම අගයට හේතු විය හැකි ය.

මේ සඳහා පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා විසින් ජාතික මට්ටමේ ප්‍රශ්න පත්‍රවල අන්තර්ගත ව ඇති ඡේද අවබෝධය සහිත අභ්‍යාස කරවීමත්, සරල ඡේදවල සිට සංකීර්ණ ඡේද දක්වා අවබෝධය සහිත ප්‍රශ්න විමසීම දක්වා වූ අභ්‍යාස කරවීමත් සිදුකළ හැකි ය. තවද ශිෂ්‍යයන්ගේ කියවීමේ කුසලතා සංවර්ධනය කිරීම උදෙසා කියවීමේ නිපුණතා පිළිබඳ අවබෝධය ලබා දී විවිධ තරඟ හා ව්‍යාපෘති සංවිධානය කිරීම, කණ්ඩායම් ක්‍රියාකාරකම් ආදිය නව මාධ්‍ය ද උපයෝගී කර ගනිමින් ප්‍රායෝගිකව සිදු කිරීමට අවස්ථාව සලසා දීම මගින් ශිෂ්‍යයන්ගේ කියවීමේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා ඔවුන් අභිප්‍රේරණය කිරීම සිදු කළ හැකි ය.

උදාහරණයක් ලෙස විෂය නිර්දේශයේ එන කෙටිකතා රචකයන්ගේ කෙටිකතා කිහිපයක් තෝරාගෙන ඒවා පන්ති කාමරයේ දී ශිෂ්‍යයන් කණ්ඩායම්වලට බෙදා කේවල වශයෙන් කියවීමට අවස්ථාව සලසා දී එහි භාෂාව, චරිත හා සිද්ධි ආදී සංකල්ප පිළිබඳ ව එක් ව සාකච්ඡා කර කණ්ඩායම් වශයෙන් සමර්පන ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම සිදු කළ හැකිය.

## 3.4.9 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර

**5.** ඔබේ ප්‍රදේශයේ ඇති හෝ ඔබ දන්නා සංචාරක ස්ථානයක් වෙත දේශීය සංචාරකයන් ආකර්ෂණය කරගැනීම සඳහා යෝග්‍ය අත්පත්‍රිකාවක් සකස් කරන්න. එහි දී පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් වන්න.

- සංචාරක ස්ථානයෙහි ස්වභාවය
- එම ස්ථානය ආකර්ෂණීය ස්ථානයක් වීමට හේතු
- ගමන් පහසුව සලසා ගන්නා ආකාරය
- සංචාරකයන් විසින් අනුගමනය කළ යුතු දේ

අත්පත්‍රිකාවට වචන 100ක් පමණ සෑහේ.

**නැතහොත්**

විජයපුර විද්‍යාලයේ විද්‍යා ප්‍රදර්ශනයේ ආරම්භක දිනයට පැමිණි පුවත්පත් වාර්තාකරුවකුගේ කෙටි සටහනක් පහත දැක්වේ.

| | |
|---|---|
| විද්‍යා ප්‍රදර්ශනය | – 2023.05.18 |
| ප්‍රධාන අමුත්තා | – පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා |
| ප්‍රධාන අමුත්තාගේ කථාව | – විද්‍යා ප්‍රදර්ශනයක වැදගත්කම |
| | – ප්‍රදර්ශන කුටිවල සුවිශේෂතාව |
| | – අවට පාසල්වල සිසුන්ට ලැබෙන ප්‍රතිලාභ |
| | – ප්‍රදර්ශන සංවිධානයට පළාතෙන් ලැබෙන අවස්ථා |
| විදුහල්පතිතුමාගේ කථාව | – ප්‍රදර්ශනය සංවිධානය කිරීමට ගුරුවරුන්ගෙන්, දෙමාපියන්ගෙන් සහ සිසුන්ගෙන් ලැබුණු සහයෝගය |
| | – ප්‍රදර්ශනයේ වැදගත්කම |

ඉහත තොරතුරු පදනම් කරගෙන පුවත්පතකට යැවීම සඳහා සුදුසු වාර්තාවක් සකස් කරන්න. විජයපුර මාණ්ඩලික වාර්තාකරු කවිඳු ගුණරත්න ඔබ යයි සිතන්න. (වචන 100ක් පමණ සෑහේ.)

(ලකුණු 15 යි)

**අත් පත්‍රිකාව**

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.**

1. ආකෘතිය ලකුණු 04 යි.
2. අන්තර්ගතය ලකුණු 08 යි.
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.

**1. ආකෘතිය - ලකුණු 04 යි.**

1. ශීර්ෂ පාඨය / මාතෘකාව ලකුණු 01 යි.
2. පළකරන්නාගේ නම ලකුණු 01 යි.
3. පළකරන දිනය ලකුණු 01 යි.
4. නිර්මාණාත්මකභාවය ලකුණු 01 යි.

**2. අන්තර්ගතය - ලකුණු 08 යි.**

(i) සංචාරක ස්ථානය පිහිටීම හා සම්බන්ධ කරුණු දෙකක් ලකුණු 02 යි.

(ii) සංචාරක ස්ථානයට ආකර්ෂණය වීමට බලපාන හේතු දෙකක් ලකුණු 02 යි.

(iii) සංචාරක ස්ථානයට ගමන් පහසුව සලසා ගන්නා ආකාරය (ගමන් පහසුව පැහැදිලි ව දක්වා තිබිය යුතු ය) ලකුණු 02 යි.

(iv) සංචාරකයන් අනුගමනය කළ යුතු කරුණු දෙකක් ලකුණු 02 යි.
ස්ථානය අනුව තිබුනත් නිවැරදි ය.

**3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම ආදිය සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.

❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු ගණන 03කි.

**නැතහොත්**

**පුවත්පත් වාර්තාව**


**ලකුණු විග්‍රහය මුළු ලකුණු - 15 යි.**

1. ආකෘතිය - ලකුණු 04 යි.
2. අන්තර්ගතය - ලකුණු 08 යි.
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.

### 3.4.10 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.12**

ප්‍රශ්න අංක 05 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය





මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමිවේ.
ඉන්,
ලකුණු 00 – 03 ප්‍රාන්තරයේ 5.35 %ක් ද
ලකුණු 04 – 07 ප්‍රාන්තරයේ 19.35%ක් ද
ලකුණු 08 – 11 ප්‍රාන්තරයේ 49.96%ක් ද
ලකුණු 12 – 15 ප්‍රාන්තරයේ 25.34%ක් ද
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

00-03 ප්‍රාන්තරය තුළ අපේක්ෂකයන් 5%ක් ද, 12-15 ප්‍රාන්තරයෙහි අපේක්ෂකයන් ප්‍රතිශතයක් ලෙස 25%ක්ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේදී වැඩි අපේක්ෂක පිරිසක් එනම් ප්‍රතිශතයක් ලෙස 49%ක් 8-11 ප්‍රාන්තරය තුල ලකුණු ලබාගෙන ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී .ලං.වි.දෙ.


**ප්‍රස්තාරය 3.13**

ප්‍රශ්න අංක 05 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

ප්‍රශ්න අංක 05හි කොටස් හා අනුකොටස්වල තෝරගැනීම




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය**

මෙම ප්‍රශ්නයෙහි පළමු කොටසෙහි (අත්පත්‍රිකාව) පිළිතුරු ලිවීම සඳහා තෝරා ගැනීම 66%ක් වන අතර දෙවන කොටසෙහි (පුවත්පත් වාර්තාවක් ලිවීම) තෝරා ගැනීම 34%ක් වේ. පිළිවෙළින් එහි පහසුතාව 56%ක් හා 59%කි.

මෙම ප්‍රශ්නය මගින් ප්‍රධාන වශයෙන් ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැන බැලීම සිදුකර ඇත. ඊට අදාළ ව මෙම ප්‍රශ්නයෙන් අත්පත්‍රිකා පුවත්පත් වාර්තා ආදී වූ ප්‍රායෝගික ලේඛන සකස් කිරීමේ දී ශිල්පීය උපක්‍රම අනුගමනය කිරීම හා අවශ්‍යතාව අනුව එම ලේඛන සකස් කිරීම පිළිබඳ අපේක්ෂකයා සතු හැකියාව මනිනු ලැබේ.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලබාදීමේ දී ආකෘතිය, අන්තර්ගතය හා ශිල්පීය දක්ෂතා යන ශීර්ෂ යටතේ පිළිවෙළින් ලකුණු 04, 08 හා 03 බැගින් මුළු ලකුණු 15ක් ලබා දෙයි. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 87%ක් වුව ද, සමස්ත පහසුතාව 58% කි. අපේක්ෂකයන් සතු නිර්මාණශීලීභාවය, ප්‍රායෝගික ලේඛන සකස් කිරීමේ දැනුම හා අවබෝධය ආදී කරුණු ආශ්‍රිත ප්‍රායෝගික පුහුණුවේ අඩුවීම මෙහි පහසුතා අගය අඩුවීමට හේතු වී ඇතැයි සිතිය හැකි ය.

ඒ අනුව අත්පත්‍රිකා සකස් කිරීමට වඩා පුවත්පත් වාර්තා සකස් කිරීම සඳහා අපේක්ෂකයන් විසින් අඩු රුචිකත්වයක් දක්වන බව පෙනී ගියද, ඒ සඳහා පිළිතුරු සැපයූ අපේක්ෂකයන් විසින් ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා ඇති බව පෙනේ. තවදුරටත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ප්‍රායෝගික ලේඛන ආශ්‍රිත ප්‍රශ්න පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති සකස් කිරීම, කණ්ඩායම් ක්‍රියාකාරකම් සිදුකිරීම, බිත්ති පුවත්පත් සඟරා නිර්මාණය ආදී ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍යයන් යොමු කරවීම වැදගත් වේ. එසේ ම, පුවත්පත් වාර්තා සකස් කිරීම පිළිබඳව කුසලතා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඔස්සේ ආකර්ෂණීය නව මාධ්‍ය භාවිතකොට ඉගැන්වීමෙන් ශිෂ්‍යයන්ගේ අවබෝධය වර්ධනය කිරීම මගින් ඉහළ ලකුණක් ලබා ගැනීම සඳහා ශිෂ්‍යයන් අභිප්‍රේරණය කළ හැකිය.

# IV කොටස

## 4. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - III පත්‍රය

### 4.1 සිංහල භාෂාව හා සාහිත්‍යය III පත්‍රයේ ව්‍යූහය

කාලය පැය 02යි. ප්‍රශ්න 07කි. (මුළු ලකුණු 80කි.)

1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්ය වේ. 5, 6, 7 ප්‍රශ්න වලින් එකක් තෝරා ගත යුතුය.

1 ප්‍රශ්නය : කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20කි.

2 ප්‍රශ්නය : නිර්දිෂ්ට ග්‍රන්ථ වලින් තෝරා ගත් ගද්‍ය/ පද්‍ය කොටස් ඇසුරෙන් ප්‍රශ්නය සකස් කෙරෙන අතර අනුකොටස් 2 කින් යුත් කොටස් 5 කින් සමන්විත වේ. එක් අනුකොටසකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 20කි.

3 ප්‍රශ්නය : වෛකල්පික ප්‍රශ්න කොටස් දෙකකින් එකකට පමණක් පිළිතුරු ලිවිය යුතුය. ලකුණු 15කි.

4 ප්‍රශ්නය : වෛකල්පික ප්‍රශ්න කොටස් දෙකකින් එකකට පමණක් පිළිතුර ලිවිය යුතුය. ලකුණු 15කි.

5, 6, 7 ප්‍රශ්න : වෛකල්පික ප්‍රශ්න තුනකින් එකකට පමණක් පිළිතුරු ලිවිය යුතු ය ලකුණු 10කි.

අවසාන ලකුණ ගණනය කිරීම : I පත්‍රය = 40

II පත්‍රය = 80


III පත්‍රය = 80

අවසාන ලකුණ = 200 ÷ 2 = 100

## 4.2 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

**ප්‍රස්තාරය : 4.1**

III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්නවලට පිළිතුරු සපයා ඇති ආකාරය හා සමස්ත පහසුතාව





**මූලාශ්‍රය :** RD/16/4/OL,RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

III පත්‍රයේ 01 ප්‍රශ්නය නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන අතර 02 ප්‍රශ්නය නිර්දිෂ්ට ග්‍රන්ථවල විමර්ශනාත්මක අවබෝධය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කෙරේ.

එමෙන්ම 03 ප්‍රශ්නයේ සිට 07 ප්‍රශ්නය දක්වා ප්‍රශ්නවලින් අපේක්ෂකයන් සතු විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල දැනුම පරීක්ෂා කර ඇත. මෙහි දී 01 ප්‍රශ්නය සඳහා 98%ක් ද, 02 ප්‍රශ්නය සඳහා 93%ක් ද, පිළිතුරු සපයා ඇති අතර එහි පහසුතාව පිළිවෙළින් 4% හා 2% වේ. අනෙක් අනිවාර්ය ප්‍රශ්න වන 03 ප්‍රශ්නය සඳහා 75%ක් ද, 04 ප්‍රශ්නය සඳහා 70%ක් ද පිළිතුරු සපයා ඇති අතර එහි පහසුතාව පිළිවෙළින් 18% හා 11% වේ. 05, 06, 07 තෝරා ගැනීමේ ප්‍රශ්නවල දී, තෝරා ගැනීමේ ප්‍රතිශතය 17%, 7%, හා 58% වේ.

**ප්‍රස්තාරය : 4.2**


III පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

III පත්‍රය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය සැලකීමේදී 01, 03, 04 ප්‍රශ්න සඳහා වැඩි ම අපේක්ෂකයන් ප්‍රතිශතයක් ලකුණු ලබා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වෙන්කළ ලකුණෙන් 51-75% පන්ති ප්‍රාන්තරය තුළය. 02 හා 06 ප්‍රශ්න සඳහා අපේක්ෂකයන්ගෙන් වැඩිම ප්‍රතිශතයක් ලකුණු ලබා ඇත්තේ ප්‍රශ්නය සඳහා වෙන්කළ ලකුණෙන් 00-25% ප්‍රාන්තරය තුළය. 05 ප්‍රශ්නය සඳහා වැඩිම අපේක්ෂකයන් ප්‍රතිශතයක් ප්‍රශ්නය සඳහා වෙන්කළ ලකුණෙන් 26-50% ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති අතර 07 ප්‍රශ්නය සඳහා වැඩිම අපේක්ෂක ප්‍රතිශතයක් ප්‍රශ්නය සඳහා වෙන්කළ ලකුණෙන් 76-100% පන්ති ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇත. ප්‍රශ්නය සඳහා වෙන්කළ ලකුණෙන් 00-25 ප්‍රාන්තරය තුළ වැඩිම අපේක්ෂක ප්‍රතිශතය ලකුණු ලබාගෙන ඇත්තේ 06 හා 02 ප්‍රශ්න සඳහා ය.

## 4.3 III පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය




ප්‍රස්තාරය 4.3
III පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය

මූලාශ්‍රය : RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

## 4.4 III පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා සුවිශේෂී නිරීක්ෂණ හා නිර්දේශ

### 4.4.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "ඇතුළු නුවර දී රහස් කියන්නට නොපිළිවන. මඟුල් උයනට යම්හ."

(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?

(ආ) එය ශ්‍රවණය කළේ කවරකු ද?

(ii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

කෙළෙහි ගුණ සිත්දේ
මුසිල අන්ද මන්දේ

(අ) .............................

(ආ) .............................

(iii) "කවදාවත් ඕකෙන් පිට වෙලා එන්ඩ ඉඩ හම්බ වෙන්නෙ නෑ මිනිහෙකුට"

(අ) මෙහි 'ඕකෙන්' යනුවෙන් අදහස් කළේ කුමක් ද?

(ආ) මේ ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?

(iv) ඉවු කොට කළ යුතු යුතුකම්
ලැබුණක් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
උඹයි මගේ පුතා උතුම්

(අ) කවියට අනුව උතුම් පුතකු සතු ලක්ෂණය ලියන්න.

(ආ) මේ කවිය ඇතුළත් පැදි පෙළේ රචකයා නම් කරන්න.

(v) "තෙල අහස සිට නැටූ විද්දත් දූවගේ පියාට දී ලා තමාගේ දූව ම පුතුන්ට පාවා දෙන්ට කියව."

(අ) මෙහි විද්දත් පියාට දෙන්නට යැයි කීවේ මොනවා ද?

(ආ) මේ ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරකු ද?

(vi) "රජයට හො දිවියට හො අන්තරාය වෙයි යන සිතින් නිදි නො ලත්මි."

(අ) මේ ප්‍රකාශය ශ්‍රවණය කළ පුද්ගලයාගේ නම කුමක් ද?

(ආ) මෙහි සඳහන් අයට නිදි නොලැබීමට බලපෑ හේතුව කුමක් ද?

(vii) "ඇහැටවත් නොපෙනෙන සතුන්ට පුළුවන් ද මෙච්චර ලොකු මිනිස් ඇඟකට හානි කරන්න?"

(අ) මේ ප්‍රකාශය උපුටා ගත් නිර්මාණයේ නම ලියන්න.

(ආ) මේ ප්‍රකාශය කිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(viii) ඔය දැල දොඩමලු ය, සුවඳ බැරුවා ඉන්ට
නිල් වතුර තුරුලු කර කෙසේ අතහැර යම් ද?
**කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන**
සොඳුර, නුඹ වාගේ ම හිනැහේය මා එක්ක

(අ) මේ පද්‍ය ඛණ්ඩය ඇතුළත් කාව්‍ය නිර්මාණයේ රචකයා නම් කරන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයෙන් පැවසෙන අදහස ලියන්න.

(ix) රාජ කුමරියෝ පලඳිති
රන් මිණි බරණා
සිනිඳු වස්ත්‍ර හැඳලා රන්
මිරිවැඩි සඟළා
**පින් පිඩ වැනි මා මැණිය**
කියනු නොවළහා

(අ) මේ ප්‍රකාශය කළ අයගේ නම ලියන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදයේ අන්තර්ගත කාව්‍යාලංකාරය කුමක් ද?

(x) (අ) පන්සිය පනස් ජාතක කථා පොත රචනා කිරීම සඳහා පාදක කර ගෙන ඇති ග්‍රන්ථය කුමක් ද?

(ආ) 'පූජාවලිය' කෘතියෙහි කතුවරයාගේ නම ලියන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

(i) (අ) කේවට්ට බමුණා/ කේවට්ටයා/ කේවට්ටාචාරී

(ආ) චූලනී බ්‍රහ්මදත්ත රජතුමා / බ්‍රහ්මදත්ත රජතුමා / උත්තර පඤ්චාල නුවර රජතුමා / උතුරු පසල් දනවු

(ii) (අ) ජයෙහි ලොබ බැන්දේ

(ආ) තමා වීණා තත ද සින්දේ

(iii) (අ) සිරගෙදර / හිරගෙදර/ බන්ධනාගාරය / සිපිරිගෙය

(ආ) පුංචි මැණිකා සිරගෙදරට ගොස් පැමිණෙන විට මහල්ලා ඇයට ඇසෙන සේ ප්‍රකාශ කළ අවස්ථාව

(iv) (අ) යුතුකම් ඉටු කොට ඇති විට පවා ලෝකෙන් ගැරහුම් ලැබුණහොත් ඉවසීමට හැකි වීම.

(ආ) එස්. මහින්ද හිමි / ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි

(v) (අ) මසු දහස /මසුරන් දහස

(ආ) උග්ගසේන සිටු පුත්‍රයාගේ යහළුවා

(vi) (අ) භර්ග / භර්ග පුරෝහිතයා

(ආ) රාත්‍රියේ තමාගේ මඟුල් අවි දිලිසෙනු දැකීම / මඟුල් අවි දිලිසෙනු දැකීම

(vii) (අ) අපට වැසිකිළියක්

(ආ) කථකයා පාසලේ දී උගත් කරුණු මවට ප්‍රකාශ කිරීම

(viii) (අ) රත්න ශ්‍රී විජේසිංහ

(ආ) කෙකටියා පඳුරුවල මල් පිපී ඇත.

(ix) (අ) සිංහසීවලී

(ආ) පිත් පිඬ වැනි මා මැණිය - උපමාලංකාරය / උපමා

(x) (අ) පාලි ජාතකට්ඨ කථාව


(ආ) මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි / බුද්ධපුත්‍ර හිමි

(ලකුණු 02 × 10 - 20 යි.)

### 4.4.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 4.4**

ප්‍රශ්න අංක 01 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන්,

ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 23%ක් ද

ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 31% ක් ද

ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 33%ක් ද

ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 13%ක් ද


වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රතිශතය සඳහා අපේක්ෂකයින්ගෙන් ප්‍රතිශතයක් ලෙස 46% ක් , ලකුණු 11 හෝ ඊට වැඩියෙන් ලබා ඇත. අපේක්ෂකයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස 13%ක් ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 4.5**

ප්‍රශ්න අංක 01 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**1 ප්‍රශ්නයෙහි විශ්ලේෂණය**

1 ප්‍රශ්නය කොටස් දහයකින් හා අනු කොටස් විස්සකින් සමන්විත ලකුණු විස්සක් හිමිවන ප්‍රශ්නයකි. මීට අදාළ ප්‍රශ්න නිර්මාණය කිරීමේදී පාඩම හැඳින්වීමට අදාළ කොටස හා නිර්දිෂ්ට පාඩම් යොදා ගනී. දැනුම මැන බැලෙන ප්‍රශ්නයක් බැවින් අපේක්ෂකයන්ගේ මතකය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර ඇත. මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 4% වැනි අඩු අගයකි.

1 ප්‍රශ්නයෙහි (i) (අ), (iii) (අ), (iv) (ආ) හා (x) (අ) අනුකොටස් සඳහා පහසුතාව පිළිවෙළින් 84%, 82%, 85% හා 76% ලෙස 75% වැඩි ඉහළ පහසුතා අගයන් ඇත. (v) (අ), (iii) (ආ), (vi) (අ) හා (vii) (ආ) අනුකොටස් සඳහා පිළිවෙළින් 14%, 18%, 23% හා 27% ලෙස 30% වඩා අඩු පහසුතා අගයක් ඇත.

(iii) කොටසේ (ආ) අනුකොටස සඳහා 82% වැඩි පහසුතාව අගයක් ඇති අතර එහි (ආ) කොටසට 18%අඩු පහසුතා අගයක් ඇත. එහි (අ) අනුකොටසින් ඍජු පිළිතුරක් අපේක්ෂා කිරීමත් (ආ) අනුකොටසෙන් විමර්ශනාත්මක අවබෝධය පරීක්ෂා කිරීමත් ඒ සඳහා හේතු වූවා විය හැකි ය. (v) හා (vi) කොටස් පුරාතන ගද්‍යය නිර්දිෂ්ටයන් ඇසුරෙන් නිර්මිත ප්‍රශ්න වන අතර එම ප්‍රශ්න සඳහා 40%ට අඩු අගයකි. පුරාතන ගද්‍ය පරිශීලනයේ දී ඒ ඒ අවස්ථා හා සිද්ධි වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන සිසුන් සමග සාකච්ඡා කිරීම සුබාවබෝධය සඳහා හේතු වනු ඇත.

මෙවැනි ප්‍රශ්නවල ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා අදාළ මූලාශ්‍රයන් අධ්‍යයනය කිරීමට සුදුසු විවෘත ග්‍රන්ථ පරීක්ෂණ ඉගෙනුම් ක්‍රම ලෙස භාවිත කිරීම වඩාත් ඵලදායි වනු ඇත. ඒ සඳහා පාඩම්වලට අදාළ තොරතුරු සිසුන් ලවාම වගුගත කරවීම කණ්ඩායම් ක්‍රියා ලෙස සිසුන් ලවා කෙටි ප්‍රශ්න නිර්මාණය කරවා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් පන්ති කාමරය තුළ සිදු කිරීම ස්ථාවර මතකය සහතික කිරීමට යොදාගත හැකිය.

## 4.4.3 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "මහ බෝසතාණන් වහන්සේ ද, ඔද වැඩියා වූ සාගරය පරිද්දෙන් පොළොව මැඩ පියන්නා සේ වීථිය පුරා ගෙන යන්නා වූ ඇත් අස් ආදි වූ පරිවාරයෙන් යුක්ත වැ **අසම්භිත වැ**, වාසල් දොර හරවා, නුවරින් නික්ම, රථයෙන් බැස, කෙසරු සලා විදහා කිලිපොළන්නා වූ සිංහ රාජයකු සේ **විජෘම්භනය** කෙරෙමින්, ධර්ම යුද්ධ මණ්ඩලයට ම වැඩි සේක"

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) මහ බෝසතාණන් ධර්ම යුද්ධ මණ්ඩලයට පිවිසි අයුරු කෙටියෙන් විස්තර කරන්න.

(ii) රූ රසේ අඳිනා ලෙසේ අත්
ලෙළ දිදි විදුලිය පබා
රත් රසේ එක් වන ලෙසේ වෙණ
නාදනු පා තබ තබා
කම්පසේ දෙන සැර ලෙසේ දෙස
බල බලා නෙතගින් සබා
මම් කෙසේ පවසම් එසේ වර
සුර ළඳුන් දුන් රඟ සුබා

(අ) මෙහි දැක්වෙන උපමා **දෙකක්** ලියන්න.

(ආ) සුරඟනන්ගේ රංගනයේ ස්වභාවය කවියා විස්තර කර ඇත්තේ කෙසේ දැයි කෙටියෙන් ලියන්න.

(iii) "එ කල්හි මහාජනයො කොසොල් රජු ගෙ ගෙවද්දොර රැස් වැ 'මහරජ, තොප ගෙ රට අඟුල්මල් නම් සොරෙකු, දරුණු, ලෙමුඩු අත් ඇත්තෙ යැ, සතුන් කෙරෙහි **කුළුණු** නැත්තෙ යැ, ගම් නොගම් කෙළෙ, නියම්ගම් නොනියම්ගම් කෙළෙ, දනවු නොදනවු කෙළෙ, මිනිසුන් මරා ඇඟිලි විදැ මාලා කොටැ ධරයි. ඔහු වළකා' යි කියා මහ හඬින් හැඬූහු"

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) මහජනයා අංගුලිමාල පිළිබඳ ව රජතුමාට කළ විස්තරය කෙටියෙන් දක්වන්න.

(iv) **සා ර පලය** අඹ දඹ රඹ ද වල් පිට
ෂී ර ජලය ඇළ දොළ කඳු පිටින් බට
**කෑ ර ලොලය** වඩවන දුටු දනන් හට
කෑ ර ගලය වැජැඹෙයි මේ ලෙසින් සිට

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) කෑරගල ඇති සශ්‍රීකත්වය කවියා වර්ණනා කර ඇති ආකාරය කෙටියෙන් දක්වන්න.

(v) වල ඳිත අදහසින් මෙන් සුර ගඟ අඟන
**කල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන**
වෙල ළස ගැවැසි මුතු සක් පබළු බබළන
බල මහ මුහුද එම සඳැ උතුරින් පෙනෙන

(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයෙන් දැක්වෙන කාව්‍යාලංකාරය කුමක් ද?

(ආ) මහ මුහුදෙහි ස්වභාවය කවියා වර්ණනා කර ඇති ආකාරය කෙටියෙන් ලියන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

(i) (අ) අසම්භීතව - එඩිතර ව /නොබිය ව

විජෘම්භනය - වැජඹෙන / වැජඹීම

(ආ) මහබෝසතාණන් වහන්සේ උද්දාමයට පත් සාගරය මෙන්, පොළොව මැඩ ගෙන මෙන් වීථිය පුරා යන ඇත් අස් ආදි වූ පරිවාරයෙන් යුක්ත ව එඩිතර ව වාසලේ දොරටුව අරවාගෙන නුවරින් පිටත් ව රථයෙන් බැස කේසර සලන සිංහ රාජයකු සේ වැජඹෙමින් ධර්ම යුද්ධ මණ්ඩලයට වැඩි සේක.

(ii) (අ) රූ රැසේ අඳිනා ලෙසේ / රූප රාශියක් අඳිනා ලෙස / කවි පදය ලියා ඇති විටත් ලකුණු ලබා දෙන්න

රන් රසේ එක් වන ලෙසේ / රන් හා රසදිය එක් වන ලෙස

කම්පසේ දෙන සැර ලෙසේ / අනංගයා දෙන (මල්) හී සර ලෙස

(ආ) සුරඟනන්ගේ අත් විදුලිය ප්‍රභාවෙන් යුක්ත ය. ඔවුන්ගේ තාලානුකූල හස්ත චලනය රූප රාශියක් අඳින්නාක් වැනි ය. වීණා නාදය අනුව පාද තැබීම රන්වලට රසදිය එක් වන්නාක් වැනි ය. නෙත් කොනින් සභාව දෙස හෙළන බැල්ම අනංගයා හී සර විදින්නාක් වැනි ය.

(iii) (අ)

- ගෙවද්දොර - රජගෙදර මිදුලට /මාලිගා මිදුලට/මාලිගාව අසලට/ රජ වාසල් දොර අසලට/ මළුවට
- කුළුණු - කරුණාව

(ආ) රජතුමනි, ඔබගේ රටෙහි අඟුල්මල් නම් සොරෙක් සිටියි. ඔහු දරුණු ය.
ලේ තැවරුණු අත් ඇත්තේ ය. සතුන් කෙරෙහි කරුණාවක් නො දක්වයි.
ගම් නොගම් කරයි. නියම්ගම් නොනියම්ගම් කරයි, දනවු නොදනවු කරයි.
මිනිසුන් මරා ඇඟිලි විදැ මාලයක් සාදා පැළඳ සිටියි.

(iv) (අ)

- සාර පලය - සාරවත් පලවලින් යුක්ත /සාරවත් පලතුරු
- නෑර ලොලය - ආශාව අත් නොහැර / ආශාව ඇති කරවන

(ආ) සාරවත් පලවලින් යුක්ත වූ අඹ, ජම්බු කෙසෙල් ගස්වලින් පිරුණු වන බිම් ද කඳුවලින් ගලා බසිනා මිහිරි දිය පිරුණු ඇළ දොළ ද ආදියෙන් කෑරගල බබළමින් පවතියි.

(v) (අ) ශබ්දාලංකාරය / අනුප්‍රාස/ශබ්ද ධ්වනිය


(ආ) අහස් ගඟ නමැති ස්ත්‍රිය වැළඳගන්නා අදහසින් මෙන් සුළඟේ වේගයෙන් චංචල වූ රළ පෙළ අහසට නැගෙයි. ඒ වේලෙහි වෙරළෙහි මුතු සක් සහ පබළු බබළයි.

(ලකුණු 04 × 5 - 20 යි.)

### 4.4.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 4.6**

ප්‍රශ්න අංක 02 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන්,

ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 34 %ක් ද

ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 31 % ක් ද

ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 25 %ක් ද

ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 10 %ක් ද


වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයින්ගෙන් ප්‍රතිශතයක් ලෙස 65%ක් ලකුණු 10 හෝ ඊට වඩා අඩුවෙන් ලබා ගෙන ඇත. අපේක්ෂකයන්ගෙන් ප්‍රතිශතය ලෙස 10%ක් 16-20 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගෙන ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 4.7**

ප්‍රශ්න අංක 02 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය**

නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර ඇත. 2 ප්‍රශ්නය කොටස් 5කින් හා අනුකොටස් 10කින් සමන්විත ලකුණු 20ක් හිමිවන ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය අපේක්ෂකයන් විසින් අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයකි. එහෙත් පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 93%ක ප්‍රතිශතයකි. එහි පහසුතාව 2%කි. එය ඉතා අඩු අගයකි. පහසුතාව වැඩිම අනුකොටස වන්නේ (ii) (අ) වන අතර එහි පහසුතාව 67%කි. පහසුතාව අඩුම අනුකොටස (i) (අ) වන අතර එහි පහසුතාව 21%කි. පහසුතාව 50%ට වඩා වැඩි අනුකොටස් සංඛ්‍යාව 3ක් වන අතර ඒවා නම් (ii) (අ), (iii) (ආ), සහ (iv) (ආ) ය.

නිර්දිෂ්ය පාඨ පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය මැන බැලෙන බැවින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී දුරාවබෝධ වචනාර්ථ අධ්‍යයනයට හා සංස්ලේෂණාත්මක විස්තර ඉදිරිපත් කිරීම් පිළිබඳ බොහෝ අවධානය යොමු කොට දුරවබෝධ පදවල අර්ථාවබෝධය සඳහා ප්‍රහේලිකා ක්‍රමය ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් භාවිතය පද හා අර්ථ ප්‍රදර්ශන ක්‍රමවේද ඵලදායි වනු ඇත.

පහසුතාව 50%ට අඩු අනුකොටස් විමසා බැලීමේදී පැහැදිලි වන්නේ පුරාතන සාහිත්‍ය කෘතිවල නිර්දිෂ්ට කොටස්වල අර්ථාවබෝධය පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම සතුටුදායක මට්ටමක නොපවතින බවයි.

ශබ්දකෝෂ පරිහරණයට සහ අර්ථ විවරණ අභ්‍යාසවලට ශිෂ්‍යයන් යොමු කිරීමත් කෙරෙහි වැඩි අවධානයක් දැක්වීම වැදගත් වේ.

## 4.4.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර

3.
- අර්ථ රසයත්
- ශබ්ද රසයත්

මනාව සංකලනය කිරීම හංස සන්දේශයේ සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

- විද්දත් දියණියගේ චරිතයත්
- උග්ගසේන සිටුපුත්ගේ චරිතයත්

මගින් මතු කෙරෙන පරස්පර විරෝධී චරිත ලක්ෂණ කථා රසය තිව්‍ර කිරීමට හේතු වී ඇත. උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව ඇසුරෙන් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

03. අර්ථ රසය

උදා :

| | |
|---|---|
| • පැසෙයි තිබඳ සුවඳැල් කෙත් වත් | අවට |
| • රසෙයි අමා රසමය ඒ පියස | දුට |
| • තිබඳ පැසී පල ලඹ දෙන | මිහිරඹය |
| • එමැද වෙහෙර දිලි දුර ලන සසර | බය |
| • මිහ'ඹ මුවමඬල මෙන් දිලෙන | හැම විට |
| • දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර | සිට |
| • දිමුත් වෙහෙර වට විසිතුරු මල් | වතුය |
| • මහත් තුරු මියුරු පල ගෙන නැමි | අතුය |

ශබ්ද රසය

උදා :

| | |
|---|---|
| • කුළින් කුළම සිහිල'ඹ වැහෙන | කඳුරුය |
| • දොළින් දොළම කල් යල් කරන | කඹුරුය |
| • නුදුරු වැ සිහිලැ'ලී ය ගඟුලැ | ලී ය |
| • වට සැදි මල් වැලී ය සුදු | වැලීය |
| • පවන'ද පිපි තුරේය තිර | තුරේ ය |
| • කුසුමන් පෙති තුරේ ය මළු | තුරේ ය |

වැනි නිදසුන් දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය. (වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.)

**නැතහොත්**

**විද්දත් දියණියගේ චරිතය**

❖ සිටු පුත්‍රයා කෙරෙහි කිසිදු ආදරණීය හැඟීමක් ඇය තුළ නොමැති බව

උදා :

- "ගැල් රකිනවුන්ගේ පුත", "බර උසුලන්නවුන්ගේ පුත", "කුමකුත් නොදන්නවුන්ගේ පුතැ"යි කියමින් ඔහුට අපහාසාත්මක ලෙස කතා කිරීමට ඇය පෙලඹෙන ආකාරය

උදා :

- "එසේය අනික් කාට කියම් ද? තොප ම කොට ඇවිදිනා කටයුතු හෙයින් තොප ම අරහයා කියමි"

❖ අපහාස කරන්නේ නම් තමා පලා යන බව සිටුපුත් ප්‍රකාශ කළ විට ඇය පවසන වදන්වලින් ඔහු කෙරෙහි ඇය තුළ ඇති අප්‍රසාදය පළවෙයි.

උදා :

- ඔයිත් "තොප ගිය මැන, හුන මැනව. තොප කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම් ද?

**උග්ගසේන සිටුපුත්ගේ චරිතය**

❖ සිටුපුත් විද්දත් දියණිය කෙරෙහි වූ ආලයෙන් මුසපත් ව කටයුතු කළ ආකාරය

උදා :

- "ලදොත් ජීවත් වෙමි. නොලදොත් මියෙමි සිතා ගෙන නොකා නොබී හැඳට නැගී ලා වැද හොත්තාහ.

❖ ඔවුන් හා එක්වුවහොත් දුව පාවා දෙන බව විද්දත් පියා පැවසූ අවස්ථාවේ උග්ගසේන සිටුපුත් කටයුතු කළ ආකාරය

උදා :

- "එසේ වී නම් මම උන් හා එක් වෙමි"

❖ බිරිඳ තමාට අපහාස කරමින් පුතු නළවන අවස්ථාවේ ඔහු දැඩි පීඩනයක පසුවන ආකාරය පැහැදිලි වන අයුරු

උදා:

- "තොප නිසා විද්දත් වූවා මඳින් නපුරුත් ඇසුව මනා ද ? පලා යෙමි".

❖ තම බිරිඳ මහත් අභිමානයෙන් කටයුතු කරන්නේ ඇය දන්නා ශිල්පය නිසා බව වටහා ගත් ඔහු තමා ද ශිල්ප ඉගෙන ගන්නවා යැයි දැඩි අධිෂ්ඨානයකට පැමිණීම

උදා :


- "ඇගේ ඒ බැවුම් පලවා මමත් ශිල්ප උගනිමි".

වැනි කරුණු උදාහරණ වශයෙන් දක්වමින් පිළිතුරු සපයා තිබිය යුතු ය.

### 4.4.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 4.8**

ප්‍රශ්න අංක 03 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන්,

ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 17 %ක් ද

ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 19 % ක් ද

ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 37 %ක් ද

ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 27%ක් ද


ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

අපේක්ෂකයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස 17%ක් ලකුණු 05ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබා ඇති අතර 16 - 20 ප්‍රාන්තරය තුල ලකුණු ලබා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් ප්‍රතිශතයන් ලෙස 27%ක් පමණි.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.


**ප්‍රස්තාරය 4.9**

ප්‍රශ්න අංක 03 සඳහා පහසුතා දර්ශක





**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

ප්‍රශ්න අංක 03හි කොටස් හා අනුකොටස්වල තෝරගැනීම




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය**

03 ප්‍රශ්නය අපේක්ෂකයන් විසින් අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයක් වුව ද එම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 75%කි. එම ප්‍රශ්නයේ පහසුතාව 18%කි. 03 ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමිවන අතර අනිවාර්ය වූ මෙම ප්‍රශ්නය පුරාතන සාහිත්‍යයේ නිර්දිෂ්ට කොටස් ඇසුරෙන් සකස් කර ඇති ප්‍රශ්න දෙකකින් යුක්තය. ඒවායෙන් එක් ප්‍රශ්නයක් තෝරා ගෙන අපේක්ෂකයන් පිළිතුරු ලිවිය යුතු ය. ප්‍රශ්න දෙකෙන් එක් ප්‍රශ්නයක් හංස සංදේශයේ නිර්දිෂ්ට කොටසින් සකස් කරන ලද්දකි. අනෙක් ප්‍රශ්නය උග්ගසේන සිටුපුත්හුගේ වස්තුව ඇසුරෙන් සකස් කරන ලද්දකි.

හංස සන්දේශය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නයේ පහසුතාව 60%කි. උග්ගසේන සිටුපුත්හුගේ වස්තුව ඇසුරෙන් අසන ලද ප්‍රශ්නයේ පහසුතාව 46%කි. හංස සන්දේශය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 77%ක් වන අතර උග්ගසේන සිටුපුත්හුගේ වස්තුව ඇසුරෙන් අසන ලද ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 23%කි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී හංස සන්දේශය ඇසුරින් නිර්මිත ප්‍රශ්නය අපේක්ෂකයන් වැඩි පිරිසක් තෝරා ගෙන ඇත. උදාහරණ සැපයීමේදී ගද්‍ය උද්ධෘත දැක්වීමට වඩා පද්‍ය උද්ධෘත දැක්වීම පහසු වීම මෙයට හේතු විය හැකි ය. ලකුණු ලබා ගැනීමේදී ද වැඩි ලකුණු ලබා ගෙන ඇත්තේ හංස සන්දේශය ඇසුරෙන් නිර්මිත ප්‍රශ්නයට ය.

පුරාතන ගද්‍ය සාහිත්‍යය ඇසුරෙන් නිර්මිත ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට සිසුන් උනන්දු කරවීමත් නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණ පරිශීලනයට ශිෂ්‍යයන් යොමු කිරීමත් නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණ පිළිබඳ ලියැවී ඇති විචාර කියවීමට පෙලඹවීමත් වැදගත් වේ.

විශ්ලේෂණාත්මකව විචාරාත්මකව හා තර්කානුකූලව කරුණු ඉදිරිපත් කිරීම අපේක්ෂා කර ඇති ප්‍රශ්නයක් බැවින් දැනුම හා අවබෝධයෙන් ඔබ්බට ගිය හැකියාවක් අපේක්ෂා කර ඇත. අදාළ උද්ධෘත පාඨ යොදා නොගැනීමත් තර්කානුකූලව ප්‍රශ්නයෙන් අපේක්ෂිත අරමුණු සාධනය වන ලෙස කරුණු ඉදිරිපත් නොකිරීමත් නිසා ඇතැම් අපේක්ෂකයන්ට නියමිත ලකුණු ලබා ගැනීමට නොහැකි වී ඇත.

ප්‍රශ්නයෙන් අපේක්ෂිත අරමුණු අවබෝධ කර ගැනීමට අදාළ සාකච්ඡා, උද්ධෘත පාඨ මතකයේ තබා ගැනීමට අදාළ ක්‍රියාකාරකම් හා අභ්‍යාසයෙහි යෙදවීම වඩාත් සාර්ථක පිළිතුරු ලිවීමට උදව් වේ.

## 4.4.7 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර

4. • දරිද්‍රතාවට ගොදුරුවීමත්
   • අන්ධ විශ්වාසයන්ට නතුවීමත්

   බැද්දේගම විසූ ගැමියන් විනාශ මුඛයට යාමට හේතු වූ ප්‍රධාන කරුණු ලෙස දැක්විය හැකි ය. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

   • උපයුක්ත භාෂා ශෛලියත්
   • උචිත කාව්‍ය උපක්‍රම භාවිතයත්

   ගංගාවේ සංගීතය කාව්‍ය නිර්මාණය පාඨක සිත් ඇද ගැනීමට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

**දරිද්‍රතාවට ගොදුරු වීම**

❖ බබුන් සිරගත වූ පසු මාස හයක් ගත කරන්නේ කෙසේ ද යන්න පුංචි මැණිකා සිතන ආකාරය

උදා :

• පුංචි මැණිකාට සහ කර්ලිනාහාමිට වේලක් ඇර වේලක් කා මාස හයක් ගත කර ගැනීමට සෑහෙන තරම් ධාන්‍යයක් වත් ගෙයි ඉතිරි වී නොතිබුණේය.

❖ කර්ලිනාහාමි වයසට වඩා වැහැරී ඇති අයුරු දක්වන ආකාරය

උදා :

• අව්ව හා සුළඟත් වෙහෙසත් බඩගින්නත් ලෙඩ දුකත් ශරීර ශක්තිය මෙන් ම මානසික ශක්තිය ද උරා බොයි.

❖ තමාගේත් කර්ලිනාහාමිගේත් ජීවත් වීම සඳහා පුංචි මැණිකාට බොහෝ වැඩ කළ යුතු වීම

උදා :

• බිස්සේ තිබූ කුරක්කන් ඉවර වූ පසු කෑ හැකි කොළ වර්ග අල වර්ග හා පලතුරු සෙවීමට වනයට යාමට සිදු වීම

• හේන් වාරයට අනුන්ගේ හේන්වල වැඩ කිරීම

• ඇයට දුන් කුරක්කන් අහුරු කිහිපයකට ඈ බොහෝ වෙහෙස වී වැඩ කළ යුතු වූවා ය.

අන්ධ විශ්වාසයන්ට නතු වීම

- ශරීරයට පෙර සිත නැති වී යාම සාමාන්‍යයෙන් කැලෑ බද ගම්වල ගැහැනුන් අතර බහුල ව දක්නට ලැබෙන ධර්මතාවකි.
- ආරච්චිගේ ගෙයි වාසය කරන්නට කිසිවෙකුත් ඉදිරිපත් නොවීම

උදා :

අපල ගෙන දෙන අසුබ නිමිති ඇත්තේ යයි ද අවතාර අඩිකෝඩවලින් පිරුණේ යයි ද ප්‍රසිද්ධ ව ගිය මේ ගෙයි වාසයට ඒමට තරම් සැහැසි වූ කිසිවෙක් ගමේ නොවූහ.

- නැන්චොහාමි කළ ප්‍රකාශය

  මේ ගම දැන් හොල්මන් අඩිකෝඩ පිරුණු යකුන් අරක් ගත් කාලකණ්ණි ගමකි.

  වැනි උදාහරණ දක්වමින් පිළිතුරු ලියා තිබීම අවශ්‍ය ය .

නැතහොත්

**04. උපයුක්ත භාෂා ශෛලිය**

- සරල බස් වහරක් යොදා ගැනීම

  උදා : ඕනෑම කවියකින් උදාහරණ දක්වා තිබීම ප්‍රමාණවත් ය

- අනුප්‍රාසය මුසු බස් වහර

  උදා:

  සැඟවෙමි- එබෙමි-නිසසල වෙමි- සසල වෙමි

  මී අඹ - කිරල- මාදම් ගෙඩි ළදරු වියේ

- භාෂාත්මක යෙදුම් භාවිතය

  උදා:

  කලදෝ දියෙන් පොඟවා රන් පුලින තලා

  ඇකයෙහි හෙළා හඬවයි සැඬ සුළඟ රැයේ

- අද්දැකීම රසවත්ව ඉදිරිපත් කිරීමට භාෂාව යොදාගෙන ඇති ආකාරය

  එන්නේ කොහි සිට ද - කොතැනකට ද යන්නේ

  ඔබ කුමකට ද මා දුටු තැන විමසන්නේ

කාව්‍ය උපක්‍රම යොදා ගැනීම

- රූපකාලංකාර භාවිතය

උදා :

- මහ මුහුදු හිමි
- හිරිමල් සිනා රැළි පෙණ පිඬු මිහිරිතම

❖ ශබ්දාලංකාර යොදා ගැනීම

උදා :

- සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල වෙමි
- ගල්පරවලම හැපි හැපි බිහි කරමි මම
- මී අඹ - කිරල - මාදම් ගෙඩි ළදරු වියේ

❖ එළිසමය යොදාගෙන ඇති ආකාරය

උදා :

මිනිසුන් ඉවුරුවල යන එන අඩි සද්දෙන්
ළය යට සසල බව මින් මතු නොනැගෙද්දෙන්
කෙකටිය ඕලු නළියන දිය රැළි මැද්දෙන්
මල් පෙති වියළි කොළ එන අතකට එද්දෙන්

❖ උත්තම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් නිර්මාණය ඉදිරිපත් කිරීම

සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල වෙමි
ගල්පරවලම හැපි හැපි බිහි කරමි මම
හමු වුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි

❖ අජීව වස්තු සජීවත්වයට පත් කිරීම

නොමියන හේලි දහමක පණිවුඩය පිට
කොඳුරමි කෙඳිරියක් මුළු ලොව තිසල කොට

වැනි උදාහරණ දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය.

❖ **3, 4 පිළිතුරු සඳහා උදාහරණ 4ට ලකුණු 04 යි.**

**සමස්ත විස්තරයට ලකුණු 11 යි.**


**මුළු ලකුණු 15 යි.**

- දියමන්ති මාලය කෙටි කතාව රස විඳිමින් විචාරය කරයි.
- අඟුල්මල් දමනය කථාව රස විඳිමින් විචාරය කරයි.
- ජන කවි රස විඳිමින් විචාරය කරයි.

### 4.4.8 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 4.10**

ප්‍රශ්න අංක 04 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය





මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමිවේ. ඉන්,
ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 22 %ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 22 %ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 32 %ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 24 %ක් ද
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මුළු අපේක්ෂකයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස 56%ක් ලකුණු 08 හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.


**ප්‍රස්තාරය 4.11**

ප්‍රශ්න අංක 04 සඳහා පහසුතා දර්ශක





**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

ප්‍රශ්න අංක 04හි කොටස් හා අනුකොටස්වල තෝරගැනීම




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය**

04 ප්‍රශ්නය ද අපේක්ෂකයන් විසින් අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයක් වුව ද එම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 70%කි. අංක 04 ප්‍රශ්න 2කින් සමන්විත වේ. ප්‍රශ්න දෙක ම නූතන සාහිත්‍යයේ නිර්දිෂ්ට කොටස් ඇසුරෙන් සකස් කර ඇත. එක් ප්‍රශ්නයක් බැද්දේගම නවකතාවේ නිර්දිෂ්ට කොටසින් සකස් කරන ලද්දකි. අනෙක් ප්‍රශ්නය ගංගාවේ සංගීතය පද්‍ය නිර්මාණය ඇසුරෙන් සකස් කරන ලද්දකි. ඒවායෙන් එක් ප්‍රශ්නයක් තෝරා ගෙන අපේක්ෂකයන් පිළිතුරු ලිවිය යුතු ය.

බැද්දේගම ඇසුරෙන් අසන ලද ප්‍රශ්නයේ පහසුතාව 39%කි. 'ගංගාවේ සංගීතය' පද්‍ය නිර්මාණය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නයේ පහසුතාව 62%කි. එයින් 45%ක ප්‍රතිශතයක් බැද්දේගම නවකතාව ඇසුරෙන් අසන ලද ප්‍රශ්නය තෝරා ගෙන ඇති අතර 55%ක ප්‍රතිශතයක් ගංගාවේ සංගීතය පද්‍ය නිර්මාණය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නය තෝරා ගෙන ඇත.

04 ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන්ගෙන් වැඩි පිරිසක් තෝරා ගෙන ඇත්තේ ගංගාවේ සංගීතය පද්‍ය නිර්මාණය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී ද ගද්‍ය උද්ධෘතවලින් උදාහරණ දැක්වීමට වඩා පද්‍ය උද්ධෘතවලින් උදාහරණ දැක්වීම පහසු වීම මෙයට හේතු විය හැකි ය. ලකුණු ලබා ගැනීමේදී ද වැඩි ලකුණු ලබා ගෙන ඇත්තේ ගංගාවේ සංගීතය පද්‍ය නිර්මාණය ඇසුරෙන් නිර්මිත ප්‍රශ්නයට ය.

නූතන ගද්‍ය සාහිත්‍යය ඇසුරෙන් නිර්මිත ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට සිසුන් උනන්දු කරවීමත් නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණ පරිශීලනයට ශිෂ්‍යයන් යොමු කිරීමත් නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණ පිළිබඳ ලියැවී ඇති විචාර කියවීමට පෙලඹවීමත් වැදගත් වේ. ගද්‍ය සාහිත්‍ය විමර්ශනාත්මකව හා විචාරාත්මකව අධ්‍යයනය කිරීම මෙම ප්‍රශ්නය මගින් අපේක්ෂා කෙරෙන බැවින් බැද්දේගම නවකතාවේ අවස්ථා හා ඊට අදාළ සිද්ධි මාලා වෙන වෙනම ගෙන සාකච්ඡා කිරීම, භූමිකා රංගන මඟින් අවබෝධය තහවුරු කිරීම ද අදාළ අවස්ථාවේ සිද්ධිමාලාව උපයෝගී කොටගෙන පිටු පෙරලනයක් සැකසීම වැනි ඉගෙනුම් අවස්ථා සම්පාදනය මෙන්ම චිත්‍ර මඟින් අවස්ථා ප්‍රදර්ශනයද පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනීම වැදගත් වනු ඇත. නිර්දිෂ්ට පරිච්ඡේදයට පමණක් සීමා නොවී සම්පූර්ණ බැද්දේගම නවකතාව පරිශීලනයට ශිෂ්‍යයන් යොමු කිරීම තුළින් පසුබිම, චරිත නිරූපණය, කතා වින්‍යාසය පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට හැකිවනු ඇත.

## 4.4.9 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර

**5. 'දියමන්ති මාලය' කෙටි කතාවේ මැටිල්ඩාගේ චරිතයෙන් නිරූපණය කෙරෙනුයේ තම තරම නොදැන ජීවත් වීමට යාමෙන් ව්‍යසනයට පත්වන්නන්ගේ යථා ස්වභාවය යි. උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.**
**(ලකුණු 10 යි)**

තමන් බලාපොරොත්තු වූ සමාජ තත්ත්වය තමන්ට ළඟා කර ගැනීමට නොහැකි වූ නිසා මැටිල්ඩා නිරන්තරයෙන් පසු වූ ආකාරය

උදා :

"නිවසේ දිළිඳු අසරණකමින්, එහි බිත්තිවල කාලකණ්ණි දුක්බර පෙනුමෙන් , දිරා ගිය පුටුවලින් හා අවලස්සන දොර ජනෙල් රෙදිවලින් බලවත් සේ සිත් තැවුලට පත් ඇ මනස්තාපයෙනුත් පශ්චාත්තාපයෙනුත් කාලය ගත කළාය. ඇයගේ සමාජ තත්ත්වයේ සිටි අනෙක් ස්ත්‍රියකට කිසිම අමුතු ශෝකයක් හෝ අමුතු දොම්නසක් ඇති නොවන මේ සියලුම දේවලින් ඇ කනස්සල්ලටත් කනගාටුවටත් පත්වූවා ය.

- ලද දෙයින් සෑනසීමට පත් නොවී මනෝලෝකයක තනිවෙමින් ශෝක වීම

  උදා :

  විශාල අත්පුටුවල වැතිර නිදිබර ව සිටින, සරුවාල ඇඳ ගත් දැවැන්ත සේවකයන් දෙදෙනෙකුත් විසින් ආවතේව කරනු ලබන, නිහඬ නිශ්ශබ්ද අන්තර් ගර්භාගාර පිළිබඳ සිහින ඇ සිතින් මවා ගත්තා.

  ...සුගන්ධවත් සුන්දර ආගාර ද සිතින් මවා ගත් ඇ ඒවා පිළිබඳ කල්පනාවෙන් මනෝලෝකයක ජීවත් වූවා ය.

- තම තරම නොදැන දිවි ගෙවීමට උත්සාහ කිරීම නිසා විවාහ ජීවිතයේ අනේක ගැටුම් ඇතිවන ආකාරය

  උත්සවයක් සඳහා ආරාධනා පත්‍රයක් ලැබූ අවස්ථාවේ සිට ඇය ක්‍රියා කරන ආකාරයෙන් ප්‍රකට වන්නේ ඔවුන්ගේ විවාහ ජීවිතය අනවශ්‍ය ලෙස සංකීර්ණත්වයට පත් කර ගත් ආකාරයයි.

  "ඕකෙන් මට මොකක් කරන්නෙයි කියලා ද කියන්නේ? "

  "ඇයි අනේ, මම හිතුවා ඔයා ඕකට සතුටු වෙයි කියලා; ඔයා කවදා වත් ගමනක් බිමනක් යන්නෙ නෑ නේ.."

  "ඉතින් මොකක්ද මට තියෙන්නෙ ඇඟේ දා ගෙන යන්න ඔයි වගේ තැනකට? ".

  "නෑ මොකුත් නෑ මට අඳින්න ඇඳුමක් නෑ. ඒක හින්දා ඔය පාටියට යන්න බෑ. මට වඩා හොඳට ඇඳුම් පැලඳුම් තියෙන භාර්යාවක් ඉන්න යාළුවෙකුට ඕක දෙන්න.

- තමන්ගේ ආර්ථික තත්ත්වය අනුව ජීවිතය හැඩගස්වා නොගෙන "දියමන්ති මාලයක්" පැලඳීමට ගොස් මැටිල්ඩා අවාසනාවන්ත ජීවන ඉරණමකට මුහුණ පෑ ආකාරය

  උදා :

  " නෑ .. පොහොසත් ගෑනු මැද්දේ දුප්පත් විදියට ඉන්න එක තරම් ලැජ්ජා නැති වැඩක් නෑ...

  " ... ඉක්බිති ව ඒවා ළිහා තැබීමට සිත සාදා ගත නොහැකි වූ ඇ, පැකිළෙමින් වරින් වර, "වෙන ආභරණ හේම මොකුත් නැද්ද අනේ?" මිතුරියගෙන් ප්‍රශ්න කළා ය.

  " මේක මට ණයට දෙන්න පුළුවන් ද? මේක විතරයි මං ඉල්ලන්නේ"...

  " ...අඟනා ලොම් කබාවල දැවටෙමින් සිටි අනෙක් කාන්තාවන්ගේ ඇසට හසු නොවනු සඳහා එතැනින් හැකි ඉක්මනින් පලා යාමට ඇ උත්සාහ කළා ය..........

- තරම නොදැන ජීවත්වීමට යෑමෙන් මැටිල්ඩාට පමණක් නොව ඇගේ සැමියාට ද ව්‍යසනකාරී ජීවන තත්ත්වයක් උරුම කර ගැනීමට සිදු වීම

උදා :

"ෆොරෙස්ටියර් නෝනාගේ මාලෙ- මාලෙ නැතිවෙලා "..

එම සුමානයේ දී අවුරුදු පහකින් වයසට ගොස් සිටි ලොයිසල් මහතා,
"දැන් ඉතින් නැති වුණ මාලෙ වෙනුවට වෙනින් මාලයක් අපි අරන් දෙන්න බලන්න ඕනෙ"

"ඉක්බිතිව ඔවුහු පසුතැවිල්ලෙන් හා වේදනාවෙන් පීඩිත ව තම තමන්ගේ මතකයේ සැටියට අර නැති වූ මාලයට සමාන මාලයක් සොයමින් වෙළෙන්දකු වෙළෙන්දකු පාසා යෑමට පටන් ගත්තෝ ය...

එතැන් සිට අඟහිඟකම්වලින් මිරිකුණු ජීවිතයක බියකරුකම ලොයිසල් මහත්මියට දැනෙන්නට විය...

"අනේ, මගේ අසරණ මැටිල්ඩා ඔයා කොච්චර වෙනස් වෙලා ද ?

"ඔව්, එදා ඔයාව හම්බු වෙලා කථා බස් කරලා ගිය දවසෙ ඉඳන් අද වන තුරු මම වින්ද කරදර හිරිහැර අනන්තයි. අප්‍රමාණයි...

"ඔව්, ඔයාට ඒක තේරුණෙ නෑ නේද ? ආයි ඇරලා නෑ. දෙක ම එක වගේමයි.


"අනේ, මගේ අසරණ මැටිල්ඩා! මගේ ඒ මාලෙ බොරු දියමන්ති මාලයක්! හොඳටම වැඩි වුණොත් ඒක වටිච්චි ප්‍රැන්කු පන් සීයක්

මෙවැනි යෝග්‍ය උදාහරණ තුනක්වත් දක්වමින් පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.

### 4.4.10 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 4.12**

ප්‍රශ්න අංක 05 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.

ඉන්,


ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 21%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 18%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. අපේක්ෂකයින්ගෙන් ප්‍රතිශතයක් ලෙස 28%ක් ලකුණු 02 ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබාගෙන ඇත. මෙහිදී ලකුණු 6 හෝ ඊට වඩා ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 39%කි.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 4.13**

ප්‍රශ්න අංක 05 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය**

05 ප්‍රශ්නය මගින් අපේක්ෂකයන් සතුව පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල දැනුම මැන බැලීම සිදු කර ඇත. ලකුණු ලබාදීමේ දී උදාහරණ තුනට ලකුණු 3ක් ද, සමස්ත විස්තරයට ලකුණු 7ක් ද ලෙස මුළු ලකුණු 10ක් හිමිවෙයි. මෙම ප්‍රශ්නය තෝරා ගැනීම 17%ක් වන අතර පහසුතාව 34%කි.

මෙම ප්‍රශ්නය "දියමන්ති මාලය" කෙටි කතාව ඇසුරින් නිර්මාණය කර ඇත. තම තරම නොදැන ජීවත්වීමට යාමෙන් පුද්ගලයින් ව්‍යසනයට පත්වේය යන මතවාදය “දියමන්ති මාලය” කෙටිකතාවේ දී මැටිල්ඩාගේ චරිතය නිරූපණය කෙරෙන අවස්ථා පාදක කොට විචාරාත්මක විග්‍රහයක් අපේක්ෂාකර ඇත. සාර්ථක පිළිතුරක් සැපයීමේ දී චරිත පිළිබඳ මනා අවබෝධය වැදගත් වේ. මේ සඳහා පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා තවදුරටත් සිසුන්ගේ නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

එහි දී කෙටිකතාව ආරම්භයේ මැටිල්ඩාගේ චරිතය නිරූපණය වන ආකාරයත්, තමන්ගේ තරම නොදැන කටයුතු කරන ආකාරයත්, එම කටයුතු හේතු කොට ගෙන තමා ඇතුළු සමස්ත කුටුම්භය ම මහා ව්‍යසනයකට ගොදුරු වන ආකාරයත් තහවුරු කිරීමට වඩාත් උචිත උද්ධෘත යොදාගෙන තර්කානුකූල ව ඉදිරිපත් කිරීම ප්‍රශස්ත ලකුණු කරා යාමට හේතු වනු ඇත.

මේ සඳහා කෙටිකතාවේ අවස්ථා හා සිද්ධි වෙන වෙන ම ගෙන ඒ ඒ අවස්ථාවෙන් නිරූපණය වන චරිත ස්වභාවයන් පිළිබඳ සමීප අධ්‍යයනයක් පන්ති කාමරය තුළ දී සිදු කිරීම සාර්ථක පිළිතුරු සැපයීම සඳහා ශිෂ්‍යයන්ට විශාල අනු බලයක් සපයනු ඇත.

### 4.4.11 ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර

**6.** **බුදුරජාණන් වහන්සේ 'අඟුල්මල් දමනය' කළ අවස්ථාව කතුවරයා විස්තර කරනුයේ පාඨකයාගේ සිතෙහි වාක් චිත්‍රයක් මැවෙන ආකාරයෙනි. අමාවතුර නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.**
**(ලකුණු 10 යි)**

බුදුරජාණන් වහන්සේ 'අඟුල්මල් දමනය' කළ අවස්ථාව කතුවරයා පාඨකයාගේ සිතෙහි වාක්චිත්‍ර මැවෙන ආකාරයෙන් නිරූපණය කර ඇති ආකාරය

- බුදුරදුන් හා අංගුලිමාල සම්මුඛ වන අවස්ථාව සජීව වාක්චිත්‍ර මවමින් රූපණය කර ඇති ආකාරය විශිෂ්ට ය. එම අවස්ථාවේ දී අංගුලිමාලගේ හැසිරීම තාත්ත්වික ලෙස ඉදිරිපත් කර ඇත්තේය.

  "බුදුන් දැක විස්මිත වැ "මෙ මඟට පුරුෂයො දස දෙන දු විසි තිස් සතලිස් පනස් දෙන දු සැක ඇති වැ සන්නද්ධ වැ වග වග වැ එති. ඔහු මා අතැ නස්ති. එතෙකුදු හොත් මෙ මහණ එකලා වැ මා අභිභවමින් මෙන් එයි. මෙ මහණහු මැරුව මැනවැ'යි කඩු පලඟ ගෙනැ දුනු හියවුර බැඳැ බුදුන් පස් පස් ලුහුබඳවමින් යෙයි..."

- බුදුන් වහන්සේගේ පසුපස හඹා යෑමට ගොස් අංගුලිමාල වෙහෙසට පත්වන ආකාරය

  "බුදුහු පෙරට මහත් අඩිගණයක් දක්වා තුමූහු මධ්‍ය වෙති. හෙ අන්ත්‍ය වෙයි. දැන් මොහු හඹා ගන්මි යි බැල පමණින් දිවෙයි..."

- බුදුරදුන් හා අඟුල්මල් සම්මුඛ වන අවස්ථාව

  "බුදුනට "සිට මහණ" යි කියැ. බුදුහු "මම සිටියෙමි. තොද සිට' යි" වදාළො.
  මෙවෙනි සිංහනාදයෙක් අනෙකක් හට වන්නෙ නො වෙයි. මෙ මහමායා දෙවිය පුත් සිද්ධත් මහණරජහු ගෙ ගර්ජනා යැ. මම් තියුණු නුවණ ඇති සම්මා සම්බුදුන් විසින් දක්නා ලද බන්දෙමි."


  "මෙතැන් පටන් - ගෙනැ පව් නොකෙරෙමි. තොපගෙ මියුරු කථා අසා යැ" යි තමා ගෙ පඤ්චායුධ ප්‍රපාතයෙහි බහා පියා බුදුන් වැඳැ පැවිජ අයදි යැ. බුදුහු ඔහුට එහිභික්ෂුභාවයෙන් පැවිදි දූන්හ...

සංක්ෂිප්ත කතා රීතිය මනාව උපයුක්ත කොට ගනිමින් සජීව අවස්ථා හා සිද්ධි නිරූපණ මඟින් කතුවරයා වාක්චිත්‍ර මවා ඇති ආකාරය යෝග්‍ය උදාහරණ දක්වමින් විස්තර කොට තිබිය යුතු ය.

## 4.4.12 ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය

### ප්‍රස්තාරය 4.14

ප්‍රශ්න අංක 06 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.

ඉන්,

00 - 02 ප්‍රාන්තරය 42%ක් ද
03 - 05 ප්‍රාන්තරය 22%ක් ද
06 - 07 ප්‍රාන්තරය 19%ක් ද
08 - 10 ප්‍රාන්තරය 17%ක් ද


වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වඩා ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 36%කි.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

### ප්‍රස්තාරය 4.15

ප්‍රශ්න අංක 06 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය**

මෙම ප්‍රශ්නය සකස් කර ඇත්තේ පෙළ පොතේ එන "අඟුල්මල්දමනය" කතා පුවතින් ය. 06 ප්‍රශ්නය මගින් අපේක්ෂකයන් සතුව පවත්නා විශ්ලේෂණාත්මක විචාරාත්මක හා තර්කානුකූල දැනුම මැන බැලීම සිදු කර ඇත. නියමිත මුළු ලකුණු ගණන 10කි. උදාහරණ 03ට ලකුණු 03ක් හා සමස්ත විස්තරයට ලකුණු 07ක් ලෙස බෙදා දැක්විය හැකි ය.

මෙම ප්‍රශ්නයේ දී අපේක්ෂා කරනුයේ කතුවරයාගේ විවිධ ලේඛන ප්‍රයෝග අතුරින් පාඨක සිතෙහි වාක්චිත්‍ර මැවීමේ හැකියාවයි. ඒ සඳහා බුදුරජාණන් වහන්සේ අඟුල්මල් අභිමුඛ වූ මොහොතේ සිට කායික ව හා මානසික ව වෙහෙසට පත් ව සිටින අතරතුර බුදුවදනින් මනස විකසිත වන මොහොත තෙක් අපේක්ෂකයන්ගේ අවධානයට ලක් විය යුතු ය. ඉන් බැහැර අවස්ථා උදාහරණ ලෙස යොදා ගැනීම අඩු ලකුණු ලබා ගැනීමට හෝ ලකුණු අහිමි වීමට හේතු වනු ඇත. තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කිරීමේ දී ප්‍රශ්නයෙන් උක්ත වන කරුණ ඉලක්ක කොට ගත් උපකල්පන ගොඩනගා ගැනීමත්, එම උපකල්පනය සනාථ කිරීමට යෝග්‍ය සාධාරණ උද්ධෘත පාඨ සාක්ෂි වශයෙන් උපයුක්ත කොට ගැනීමත්, අපේක්ෂකයා ගොඩනැගූ තර්කය අදාළ උද්ධෘතය මගින් සාධනය කිරීමත් මගින් ඉහළ ලකුණු ලබා ගැනීමට හේතු සාධක වනු ඇත.

කතා වස්තුවේ සමස්තයක් ලෙස ගෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුකිරීම වෙනුවට කතාවේ අවස්ථා හා සිද්ධි මාලාව වෙන් වෙන් වශයෙන් ගෙන සාකච්ඡා කිරීම මගින් අවබෝධය හා විමර්ශනය තීව්‍ර කිරීමට හේතු වනු ඇත. භාෂාව, කතා කලාව හා සාහිත්‍යමය අගය විමර්ශනයට ලක් කිරීම වැදගත් ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා මේ සඳහා නිසි මඟ පෙන්වීම කර රසඥතාව වර්ධනය වන ආකාරයට පාඩම් සැලසුම් කරගැනීම වඩාත් යෝග්‍ය වේ. තවද මෙවැනි ප්‍රශ්න සඳහා සිසුන්ගේ සාධන මට්ටම ඉහළ දැමීම සඳහා සිසුන් වැඩිපුර සාහිත්‍ය නිර්මාණ පරිශීලනයට යොමුකළ යුතුය.

## 4.4.13 ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර

**7. මිනිස් දිවිය අර්ථවත් කර ගැනීම උදෙසා ජන කවියෙන් මග පෙන්වා ඇති අයුරු 'හානා හිය පානා අඬහැරෙන් දැනේ' පාඩම ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)**

මිනිස් දිවිය අර්ථවත් කර ගැනීම උදෙසා ජනකවියෙන් මග පෙන්වා ඇති අයුරු

- මිනිස් දිවියේ විවිධ අවධි අර්ථවත් ව ගත කිරීම විෂයයෙහි ජනකවියෙන් මග පෙන්වා ඇති අයුරු

ඇස නැති දා පොත ගත්තේ කියන්ටද
දත නැති දා උක් දඬු ගිනි තපින්ටද
වෙර නැති දා ගහගත්තේ දින්නටද
යුද ඇති දා නැති කග කොස් කොටන්ටද

එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා
වෙන් උන දාට යක් දෙබරේ වද සේමා
ගොසින් ගොසින් කටු අත්තේ අග සේමා
ඉතින් ළඳේ කරිවිල තිබ්බටු සේමා

නහින දෙහින කාලෙට පිත් කෙරුම යුත
වහින කලට කුරින් විල්වලින් එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
පනින රිලවුංට ඉනිමං කමක් නැත

- දෛනික ජීවිතයේ විවිධ කාර්යයන්හි නියැළීමේ දී ඒවා සාර්ථක ව ඉටු කරගැනීම සඳහා උපදේශ සපයා ඇති ආකාරය

ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු
බොරල්ලේ තරම දැනගෙන උඩ පනිනු
කඩුල්ලේ තරම දැනගෙන කද බඳිනු
තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු

ගසට කෙටුම ගස මුල පෑයුමෙන් දූනේ
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දූනේ
අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දූනේ
හානා හීය පානා අඬහැරෙන් දූනේ

- මිනිසාගේ යහගුණ සේ ම දුර්ගුණ ද සමසිතින් දරා ගනිමින් ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා සදුපදේශ සැපයීම

වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණෙ වැඩ කළා නොවේ
වරද පෙනෙති වැඩ නුගත් අයට ලොවේ
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ

රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
මිණි බරණින් සැදූ මුත් ගත නොදිරද් ද
පැණිවරකා ගසටත් හෙණ නොවදිද් ද

අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙලා
අනුන් ලියත් දැක තම ලියට තල තලා
දුවන මුවත් දැක නොදමන් නෙළුව පලා

මෙවැනි යෝග්‍ය උදාහරණ තුනක්වත් දක්වමින් පිළිතුරු සපයා තිබිය යුතු ය.


- **5, 6, 7 පිළිතුරු සඳහා උදාහරණ 3ට ලකුණු 03 යි.**
  **සමස්ත විස්තරයට ලකුණු ලකුණු 07 යි.**

**මුළු ලකුණු 10 යි.**

### 4.4.14 ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 4.16**

ප්‍රශ්න අංක 07 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.

ඉන්,


00 - 02 ප්‍රාන්තරය 4.79%ක් ද
03 - 05 ප්‍රාන්තරය 12.55%ක් ද
06 - 07 ප්‍රාන්තරය 33.87%ක් ද
08 - 10 ප්‍රාන්තරය 48.8%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා 00-02 ප්‍රාන්තරය තුල ලකුණු ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 4.79%කි. ලකුණු 6 ක් හෝ ඊට වඩා ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 82.67%කි.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 4.17**

ප්‍රශ්න අංක 07 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2022, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය**

07 ප්‍රශ්නය මගින් පරීක්ෂා කර ඇත්තේ අපේක්ෂකයන් සතුව පවත්නා විශ්ලේෂණාත්මක විචාරාත්මක හා තර්කානුකූල දැනුමයි. උදාහරණ 3ට ලකුණු 3ක් ලෙසත් විස්තරයට ලකුණු 7ක් ලෙසත් මුළු ලකුණු 10ක් ලබා දෙන මෙම ප්‍රශ්නය තෝරා ගැනීම 58%කි. පහසුතාව 59%කි.
ජනකවි ඇසුරෙන් නිර්මාණය වී ඇති මෙම ප්‍රශ්නය සඳහා 50% වැඩි පහසුතා අගයක් ඇත.

මිනිස් දිවිය අර්ථවත් කර ගැනීම උදෙසා ජන කවියෙන් මග පෙන්වා ඇති අයුරු මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර ඇත. ජන කවි වලින් කියැවෙන අදහස් ශිෂ්‍ය ජීවිතයට වඩාත් සමීප වීමත්, ජනකවි මතකයේ රඳවා ගැනීම පහසුවීමත්, ආයාසයකින් තොරව අදහස් උකහා ගැනීමට හැකි නිසාත් මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් සාර්ථක ප්‍රතිචාර දක්වා ඇත.

පද්‍ය සාහිත්‍යයේ කවි පන්ති සමූහ ගායනය මගින් මතකයේ තබා ගැනීමටත්, එම මතකය ස්ථාවර කර ගැනීමට යොදා ගත හැකිය. පද්‍යවලින් කියවෙන කාව්‍ය සංකල්පනා චිත්‍රයට නගා ප්‍රදර්ශනය කිරීම හා පාසල් ආරම්භයට පෙර හා විවේක කාලයේදී පටිගත කරන ලද කවි පන්ති ශ්‍රවණයට සැලැස්වීම ආදී ක්‍රමවේද ඉගෙනුම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමට වඩාත් ඵලදායිව යොදාගත හැකිය හැකියි.